ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දැනට අවුරුදු තුනකට පමණ පෙර ඉඩම් බෙදා දෙන ලද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිවුලන්කඩවල බැඳිවැව ව්‍යාපාරයේ ගොවීන් හාරසියයකට පමණ ඔවුන්ගේ ඉඩම් දියුණු කර ගැනීම සඳහා මාසික ජීවනාධාර, කැලෑ කැපීමේ ආධාර, මුල් ගැලවීමේ සහ නියරවල් දැමීමේ ආධාර කිසිවක් මෙතෙක් ගෙවා නොමැති බැවින් වහාම එම සහනයන් සැලැස්වීමට එතුමා ක්‍රියා කරන්නේ ද? (ආ) එසේම එම ගොවීන්ට ගෙයක් තනා ගැනීමට දෙන රුපියල් දහසේ (රු. 1,000) ආධාර මුදල වැඩි කිරීමට එතුමා ක්‍රියා කරන්නේ ද? නො එසේ නම්, ඒ මන් ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) இற்றைக்கு மூன்று வருடங்களுக்கு முன் பொலன்னறுவை மாவட்டத்திலுள்ள திவுலன்கடவலபெந்திவெவ திட்டத்தில் காணி பகிர்ந்தளிக்கப்பட்ட நானூறு விவசாயிகளுக்கு அவர்களுடைய காணியை அபிவிருத்தி செய்வதற்கு மாதாந்த உதவி, காடழிக்க உதவி, கட்டைகள் பெயர்க்கவும் வரம்புகள் கட்டவும் உதவி ஆகியவைகள் இதுவரை கொடுபடாதிருப்பதால் உடனே அவ்வுதவிகளைக் கொடுக்க நடவடிக்கை எடுப்பாரா? (ஆ) மேற்படி விவசாயிகள் வீடமைத்துக் கொள்வதற்குக் கொடுக்கும் (1,000/-) ஆயிரம் ரூபா உதவிப்பணத்தை அதிகரிக்க நடவடிக்கை எடுப்பாரா? இன்றேல், ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) As about four hundred cultivators in the Divulankadawela Bendiwewa Scheme in the Polonnaruwa District, to whom land was allotted about three years ago, have not yet been given monthly subsistence, financial assistance for clearing the jungle or any assistance for uprooting stumps and constructing the ridges so as to enable them to develop their lands, will he take immediate action to grant such assistance to these cultivators immediately? (*b*) Will he also take action to increase the grant of Rs. 1,000 which is the sum paid at present to cultivators for constructing their houses? If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) No. About 90 per cent. of the persons receiving land under this scheme were encroachers who were already resident on the land and had developed it at the time of final alienation. As is normal practice in such cases, assistance was given as follows: (1) Rs. 56 for seed paddy; (2) Rs. 50 for planting materials; (3) Rs. 80 for a hut to those who received only paddy allotments; (4) Rs. 80 as an advance from the Rs. 1,000 payable for a T. P. House (The balance will be paid as the work progresses.) (5) In addition a sum of Rs. 30 has been paid for subsistence. (*b*) The present financial situation does not permit an increase in this grant.

### පොළොන්නරුවේ බී. ඕ. පී. 316 ජනපදයේ කේ. එල්. ඇඩ්වින් මහතා

*திரு. கே. எல். எட்வின், பி. ஓ. பீ. 316 ஆவது குடியேற்றத்திட்டம், பொலன்னறுவை*

MR. K. L. EDWIN, COLONY NO. B. O. P. 316, POLONNARUWA

8. ලීලාරත්න විජේසිංහ මයා.

*(திரு. லீலாரத்ன விஜேசிங்க)*

(Mr. Leelaratne Wijesinghe)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පොළොන්නරුවේ බී. ඕ. පී. 316 ජනපදයේ අංක 87 දරණ ජනපද ඉඩමෙන් කොටසක් කේ. ඇල්. ඇඩ්වින් මහතාට පවරා දී දැනට අවුරුදු හතරක් පමණ වන අතර එම ඉඩමේ ගෙයක් තනා ගැනීමට රජයෙන් ආධාර මුදලක් ලබා දීමට එතුමා අදහස් කරන්නේ ද? (ආ) නොඑසේ නම්, ඒ මන් ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) பொலன்னறுவை பி. ஓ. பீ. 316 ஆவது குடியேற்றத் திட்டத்தில் உள்ள 87 ஆவது இலக்க குடியேற்றக் காணியின் ஒருபகுதியை திரு. கே. எல். எட்வினுக்கு கொடுத்து இப்பொழுது 4 வருடங்கள் ஆகின்றனவாகையால் அக்காணியில் வீடு கட்டிக்கொள்ளுவதற்காக அரசாங்கத்திடமிருந்து நிதி உதவி பெற்றுக்கொடுக்கும் உத்தேசம் அவருக்குண்டா? (ஆ) அன்றேல் ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) As about four years have elapsed since a portion of allotment No. 87 in Colony No. B. O. P. 316 in Polonnaruwa was handed over to Mr. K. L. Edwin, will he take steps to provide him with financial assistance to build a house on the said land? (*b*) If not, why?

ගරු සී. පී. ද සිල්වා

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

(a) A permit for 1½ acres of high land from Lot No. 87 in B. O. P. 316 was issued to Mr. K. L. Edwin on 8.4.64. A boundary dispute in respect of this land was settled only on 14.6.68 after the Survey Department had surveyed the land and demarcated the boundaries. If Mr. K. L. Edwin makes an application for assistance to build a house to the Government Agent, Polonnaruwa, his request will receive due consideration along with other applications. (*b*) Does not arise.

### සමන්තුරේ කෘෂිකාර්මික පාසලේ කේ. කේසවන් මහතා ඇතුළු අය

*சம்மாந்துறை விவசாயப் பண்ணையைச் சேர்ந்த திரு. கே. கேசவன் முதலானோர்*

MR. K. KESAVAN AND OTHERS, SAMMANTHURAI AGRICULTURAL FARM SCHOOL

11. එස්. එම්. රාසමානික්කම් මයා. (පද්දිරිප්පු)

*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*

(Mr. S. M. Rasamanickam—Paddiruppu)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පහත නම් සඳහන් අය සමන්තුරේ කෘෂිකාර්මික ගොවි පාසලේ කම්කරුවන් වශයෙන් සේවය කරන බව එතුමා දන්නවාද? (i) කතිරේසු කේසවන්, අංක 19. (ii) මාසිලමනී තංගරාජා, අංක 17. (iii) ඉස්මාලෙබ්බේ හජීජී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොහමඩ්, අංක 13. (iv) මුන්ඩාපොඩි කනපතිපිල්ලේ. (v) ආදම්බාවා අස්සනාර්. (ආ) මොවුන් සමග සේවය කරන අනෙක් අය බොහෝ දෙනෙක්ම විශ්‍රාම වැටුප් හිමි ස්ථිර සේවකයින් බවට පත් කර ඇති අතර මේ අය විශ්‍රාම වැටුප් හිමි ස්ථිර සේවකයින් බවට පත් නොකරන ලද්දේ මන්ද? (ඉ) මේ අය විශ්‍රාම වැටුප් හිමි ස්ථිර සේවකයින් බවට පත් කරන්නේ කවදාද? නොඑසේනම් ඒ මන්ද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) சம்மாந்துறை விவசாயப் பண்ணைப் பாடசாலையில் பின்வருபவர்கள் தொழிலாளர்களாக வேலை செய்வதை அறிவாரா: (i) கதிராசு கேசவன் இல. 19. (ii) மாசிலாமணி தங்கராசா இல. 17. (iii) இஸ்மாலெப்பை ஹஜ்ஜி முகம்மது இல. 13. (iv) முண்டப் பொடி கணபதிப்பிள்ளை. (v) ஆதம்பாவா அஸனர்? (ஆ) இவர்களுடைய இணைவர் பலர் நிரந்தரமாயும் உபகாரச் சம்பள முடையவர்களாயும் ஆக்கப்பட்டபோதிலும் இவர்களை நிரந்தரமாயும் உபகாரச் சம்பளம் உடையவர்களாயுமாக்கப்படாததேன்? (இ) இவர்கள் நிரந்தரமாயும் உபகாரச் சம்பளமுடையவர்களாயுமாக்கப்படுவதெப்பொழுது? இல்லையெனில், ஏன்?*

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that the following persons are employed as labourers at the Sammanthurai Agricultural Farm School: (i) Kathirasu Kesavan No. 19 (ii) Masilamany Thangarajah No. 17 (iii) Ismalebbai Hadjimohamed No. 13 (iv) Mundapody Kanapathipillai (v) Athambawa Assanar. (*b*) Why have they not been made permanent and pensionable although many of their colleagues have been made permanent and pensionable? (*c*) When will they be made permanent and pensionable; and if not, why?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

(*a*) Yes. (*b*) Messrs. M. Thangarajah and K. Kanapathipillai have been made permanent and pensionable. Others cannot be made pensionable as there are no vacancies in the present approved cadre. (*c*) The department is in correspondence with the Treasury to increase the cadre. They will be made pensionable if the proposed increase is granted.

## යාල අභය භූමිය තුළින් යන ධීවර කාර්මිකයන්ගෙන් ගාස්තු අය කිරීම

*யால அபயபூமிக்குட்போவதற்கு மீன்பிடித் தொழிலாளரிடம் அறவிடப்படும் பணம்*

**FEE CHARGED FROM FISHERMEN FOR ENTERING YALA SANCTUARY**

14. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යාල අභය භූමිය තුළින් පටනන්ගලට ධීවර කර්මාන්තය සඳහා යන ධීවර කාර්මිකයන්ගෙන් අභය භූමියට ඇතුල් වීම සඳහා රුපියලක් අය කැරෙන බව එතුමා දන්නවාද? (ආ) ධීවර කර්මාන්තයට දක්වන සැලකිල්ලක් වශයෙන් එම ගාස්තුවෙන් එම ධීවර කාර්මිකයන් නිදහස් කිරීමට එතුමා පියවර ගන්නවාද?

*இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா: (அ) மீன்பிடி தொழிலுக்காக யால அபய பூமிக் கூடாக பத்தனங்கல என்னுமிடத்திற்குச் செல்லும் மீன் பிடி தொழிலாளர் அபய பூமிக்குள் போவதற்கு ரூபா 1 கொடுக்க வேண்டியிருப்பதை அறிவாரா? (ஆ) மீன்பிடி தொழிலுக்குக் காட்டும் சலுகையாக, இத்தொழிலாளர் இப்பணம் கொடுக்கவேண்டியிருக்கும் நிலையை நீக்க நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of State: (*a*) Is he aware that fishermen who go through the Yala Sanctuary to Patanangala for fishing are charged a fee of Re. 1 for entering the sanctuary? (*b*) Will he take steps to exempt these fishermen from the payment of this fee as a concession to the fishing industry?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

(*a*) According to the Regulations framed under Section 5 (1) of the Fauna and Flora Protection Ordinance a fee of Re. 1 is payable by any

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

person who enters a National Park and remains there for a period of 24 hours. This fee of Re. 1 is being charged from fishermen who enter Patanangala through the National Park. (*b*) As a concession to the industry the National Government now charges these fishermen a fee of Re. 1 in respect of the first day of entry only, irrespective of the fact that they remain within the park for several days and sometimes three to four months. Any further concession is not considered feasible.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අතුරු ප්‍රශ්නයක් අසන්නට කැමතියි. ධීවර කාර්මිකයන් සිටින්නේ මෙම අභය භූමියෙහි නොව මෙම අභය භූමිය අන්තිමේ නැතිනම් මුහුදු වෙරළ අසබඩ නිසා එම අය කිරීම අසාධාරණ බව පිළිගන්නවාද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මේ ධීවර කාර්මිකයන් එන්නේ සාමාන්‍යයෙන් සත්ව උද්‍යානයෙනි ගේට්ටුවෙන් නොවෙයි; මුහුදෙනුයි. මුහුදෙන් පැමිණි විට සල්ලි ගෙවන්න වුවමනා වන්නේ නැහැ. සත්ව උද්‍යාන ගේට්ටුවෙන් එන්නේ වෙළඳ මහත්වරුයි. ඒ උදවිය ගෙව්වාට තමුන්නාන්සේ විරුද්ධ වන එකක් නැතැයි කියා මා සිතනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

වෙළඳ මහත්වරුන්ගෙන් එම මුදල අය කිරීම ගැන විරුද්ධයක් ඇත්තේ නැහැ. ධීවර කාර්මිකයන්ගෙන් අය කර ගන්නවාය යන්නයි කියන්නේ. ධීවර කාර්මිකයන්ගෙන් කරන එම අය කිරීම නැවැත්වීමට කටයුතු යොදනවාද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

බොහොම කනගාටුයි.

වාචික පිළිතුරු

## කොග්ගල මහලු නිවාසය
*கோக்கல வயோதிபர் இல்லம்*
### HOME FOR THE AGED, KOGGALA

15. **තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කොග්ගල මහළු නිවාසයේ නැවතී සිටින ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාව කොපමණද ? (ආ) ඔවුනට උදේට, දවාලට සහ රාත්‍රියට සපයනු ලබන එක් එක් ආහාර වට්ටෝරුව එතුමා ඉදිරිපත් කරනවාද ? (ඉ) මහළු නිවාසයේ රැඳී සිටින්නවුන්ගේ ආගමික කටයුතු සඳහා යොදා ඇති පහසුකම් මොනවාද ? (ඊ) මෙම මහළු නිවාසයේ නඩත්තුව සඳහා 1965 වර්ෂයට වැය වූ මුදල කොපමණද ?

*சமூக சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) கோக்கல வயோதிபர் இல்லத்திலுள்ள ஆண்களினதும் பெண்களினதும் தொகை என்ன? (ஆ) காலை, மத்தியானம், இரவு போசனங்களுக்கு முறையே கொடுக்கப்படும் உணவு வகையைக் கூறும் நிரலைச் சமர்ப்பிப்பாரா? (இ) சமய அனுட்டானத்திற்கு அவர்களுக்குள்ள வசதிகள் யாவை? (ஈ) 1965 ஆம் ஆண்டில் இத்தாபன பராமரிப்பிற்காக எவ்வளவு பணம் செலவாகிற்று?*

asked the Minister of Social Services: (*a*) What is the number of male and female inmates in the Home for the Aged at Koggala ? (*b*) Will he table a list of the items of food supplied for breakfast, lunch and dinner respectively ? (*c*) What facilities are afforded to the inmates for religious observances ? (*d*) What was the amount spent on maintaining this institution in 1965 ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம். கருணரத்ன—சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

(අ) නේවාසිකාවෝ 78 දෙනෙක් හා නේවාසිකයෝ 74 දෙනෙක් සිටිති.

(ආ) **උදය කෑම—**

එක් එක් නේවාසිකයාට හෝ නේවාසිකාවට ව්‍යංජන සහිතව ඉදිආප්ප 4 ක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(එකක් අවුන්ස 1 1/2 වන ප්‍රමාණයේ) හෝ ජෑම් හෝ කෙසෙල් ගෙඩි සහිතව පාන් (අවුන්ස 4ක්).

**දවල් කෑම—**
සතියේ දෙදිනෙක මාළු සහ එළවලු ව්‍යාංජන දෙකක් සහිතව බත්. සතියේ දෙදිනෙක කරවල සහ එළවලු ව්‍යාංජන දෙකක් සහිතව බත්. සතියේ තුන් දිනෙක එළවලු තුනක් සහිතව බත්.

**රෑ කෑම—**
පරිප්පු හෝ එළවලු ව්‍යාංජන දෙකක් සහිතව පාන් (අවුන්ස 5 1/3).

(ඉ) බෞද්ධ නේවාසිකාවන්ට ආගමික කටයුතු කිරීම සඳහා ආයතන භූමිය තුළ බෝධි වෘක්ෂයක් සහ කුඩා විහාර ගෙයක් ඇත. ඔවුන්ට ධර්ම දේශනා කිරීම සඳහා භික්ෂුන්වහන්සේලාට ආරාධනා කරනු ලැබේ. තනිව ගමන් බිමන් කරගත හැකි නේවාසික නේවාසිකාවන්ට අසළ පිහිටි විහාරස්ථානවලට යෑමට අවසරය තිබෙන අතර කැමති අයට පොහෝ දින වලදී සිල් සමාදන් වීමට ධෛර්ය දෙනු ලැබේ. ධර්මදේශනාවලට හා වෙනත් ආගමික කථාවලට සවන් දීමට හැකිවන අයුරු නිවාසයේම ගුවන් විදුලි යන්ත්‍රයක් සපයා තිබේ. නේවාසිකයෙක් හෝ නේවාසිකාවක් මියගිය විට නියමිත ආගමික චාරිත්‍රානුකූලව භූමදානය සිදුකරනු ලැබේ. ක්‍රිස්තු භක්තික හෝ වෙනත් ආගම්වලට අයත් නේවාසික නේවාසිකාවන් සිටින්නේ ඉතා ටිකකි. ඔවුන්ට සිය ආගමික කටයුතු කර ගැනීමට අවශ්‍ය සියළුම ආධාර දෙනු ලැබේ

(ඊ) රු. 82,468.72.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මෙම මහළු නිවාසයේ තිබෙන ගුවන් විදුලි යන්ත්‍රය අවුරුදු ගණනාවක සිට ක්‍රියා විරහිතව තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවාද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මා දන්නෙ නැහැ. මට ඒ ගැන දැනුම් දුන්නා නම් එය සාදවා දීමට ඉක්මනින් පියවර ගන්න තිබුණා. කෙසේ හෝ වේවා, ඒ ගැන පරීක්ෂා කර බලන බව දන්වන්න කැමතියි.

වාචික පිළිතුරු

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මෙම මහළු නිවාසයට ඇතුළුවීම සඳහා මාස්පතා ඉල්ලුම් කරන්නන්ගේ සංඛ්‍යාව සිය ගණනක් වන අතර, එම ඉල්ලුම් පත්‍ර වලින් ප්‍රමුඛත්වය දිය යුතුය කියා සටහන් කර ඇති ඉල්ලුම් කරුවන්ට පවා ඉඩ කඩ සැපයිය නොහැකිව, එම ඉල්ලුම් පත්‍ර දැනට ගාළු කච්චේරියේ තැන්පත් කර තිබෙන නිසා, නේවාසික පහසුකම් සැපයිය යුතු මහළු අයට පහසුකම් සලසා ලීම සඳහා අඩු වශයෙන් තවත් ගොඩනැගිලි දෙකක් වත් සාදවා දීමට අවශ්‍ය පියවර ගන්න වාද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඉඩකඩ සපයා දීමට කටයුතු කරනවා.

## විදේශයන්හි රැකියාව කරන ලාංකිකයින්

வெளிநாடுகளில் தொழிற்புரியும் இலங்கையர்

CEYLONESE EMPLOYED ABROAD

16. **තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) විදේශයන්හි රැකියාව ලැබ 1965 සිට මේ දක්වා දිවයිනෙන් පිටව ගිය ලාංකික ස්ත්‍රී පුරුෂයන්ගේ සංඛ්‍යාව කොපමණද ? (ආ) ඒ එක් එක් ලාංකිකයාගේ නම හා වෘත්තිය හා අධ්‍යාපන සුදුසුකම් එතුමා ඉදිරිපත් කරනවාද ?

*பிரதம அமைச்சரும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும், திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) வெளிநாடுகளில் தொழில்கள் பெற்று, 1965 ஆம் ஆண்டின் பின் இலங்கையிலிருந்து சென்ற இலங்கையரின் மொத்தத் தொகை என்ன? (ஆ) இவர்கள் ஒவ்வொருவருடைய பெயர், தொழில், கல்வித் தகைமை ஆகியவற்றைக் கூறுவாரா?*

asked the Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs: (a) What is the total number of Ceylonese who have left the Island since 1965 having obtained

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

employment abroad? (b) Will he state the name, occupation and educational qualification of each of these persons?

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

(a) There is no separate record maintained of Ceylonese who go abroad for employment. (b) Does not arise in view of Answer to (a).

## පොළොන්නරුවේ පලුගස්දමන ජනපදයේ ටී. වී. සිරිපාල මහතා

*திரு. டி. வி. சிரிபால, பலுகஸ்தமன குடியேற்ற பகுதி, பொலன்னறுவை*

## MR. T. V. SIRIPALA, PALUGASDAMANA COLONY, POLONNARUWA

20. **ලීලාරත්න විජේසිංහ මයා.**

*(திரு. லீலாரத்ன விஜேசிங்க)*

(Mr. Leelaratne Wijesinghe)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පොළොන්නරුව පලුගස් දමන ජනපදයේ බටහිර කොටසේ අංක 9 දරණ ජනපද ඉඩම අක්කර 5 රූඩ් 2 පර්චස් 32 ක් වන නමුත් එහි කට්ටි කරුවන ටී. වී. සිරිපාල මහතාට වැඩකිරීමට ඇත්තේ අක්කර තුනහමාරක බිම පමණක් බව එතුමා දන්නේද? (ආ) මුල් ප්ලෑනේ ඇති ප්‍රමාණයට ඔහු අවුරුදු පතා ඉඩම් බදු ගෙවන අතර බිමෙන් අඩු කොටස ලබා දෙන ලෙස ඔහු රජයෙන් කරන ලද ඉල්ලීම් ගැන අප්‍රමාදව සලකා බලා එතුමා සහනයක් සලසා දෙන්නේද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) பொலன்னறுவையிலுள்ள பலுகஸ்தமன குடியேற்றப் பகுதியின் மேற்குப் பிரிவிலுள்ள 9 ஆம் இலக்கக் காணித் துண்டு திரு. டி. வீ. சிரிபாலவிற்கு 5 ஏக்கர், 2 றூட், 32 பேர்ச்சுகள் எனக் கூறப்பட்ட போதிலும் 3½ ஏக்கர் காணிதான் கொடுபட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) அன்னார் மூலப் படத்தில் காட்டப்பட்டபடி காணித் துண்டின் எஞ்சியுள்ள பகுதியையும் தமக்கு வழங்கும்படி கேட்டிருப்பதாலும் அவருக்குத் தாமதமின்றி நிவாரணம் வழங்குவதற்குரிய நடவடிக்கை எடுப்பாரா? (இ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (a) Is he aware that although Allotment No. 9 in the Western section of Palugasdamana Colony in Polonnaruwa is 5 acres, 2 roods and 32 perches in extent, only $3\frac{1}{2}$ acres of this is available to the allottee Mr. T. V. Siripala for cultivation? (b) Will he take steps without delay to give relief to this allottee who has requested the Government that he be provided with the remaining portion of his allotment, for the whole of which allotment, as defined in the original plan, he has been paying the land tax annually? (c) If not why?

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම් වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(අ) ඔව්. දැනගන්නට තිබෙන තොරතුරු අනුව ප්‍රමාණයෙන් අක්කර 5ක් යැයි සඳහන්වූ මෙම ඉඩමෙහි භුක්තිය 1949 දී ටී. වී. සිරිපාල මහතාට භාරදෙන ලදී. 1954 දී අක්කර 5ක් සඳහා ඔහු වෙත බලපත්‍රයක්ද නිකුත් කරන ලදී. කෙසේ වුවද, සිරිපාල මහතාට ඔහුගේ ඉඩම පෙන්වා දෙන ලද අවස්ථාවේදී වුවද වෙනත් කට්ටිකරුවකු විසින් මෙම ඉඩම් කට්ටියෙන් කොටසක් අනවසරයෙන් අල්ලාගනු ලබමින් පැවැති බැව් දැන් නිශ්චය කරගෙන තිබේ. සිරිපාල මහතා විසින් දිසාපති වෙත කර ඇති ප්‍රකාශයකින් මෙම කාරණය ඔහු විසින්ම පිළිගෙන ඇත. සිරිපාල මහතා අක්කර 5ක් සඳහා වාර්ෂික බදු කුලී ගෙවූ මුත් ඔහු භුක්ති වින්දේ අක්කර 3 රූඩ් 3 පර්චස් 6 ක බිම් ප්‍රමාණයක් පමණක් බව ඉඩම් කට්ටිවල මායිම්ගල් ඇමීම උදෙසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1963 දී මිණුම් කටයුතු කිරීමේදී අනාවරණය විය. (ආ) දැන් සිරිපාල මහතා හිමිකම් කියන ඉඩම් කොටස 1949 සිට අනෙක් කට්ටිකරුවා විසින් සංවර්ධනය කොට වගා කර ඇති බැව් තහවුරු වී ඇත. සිරිපාල මහතාට හිමි ඉතිරි ඉඩම් කොටස වෙනුවෙන් ඔහුට දීම සඳහා හිස් ඉඩමක් ප්‍රදේශයේ නොමැති හෙයින් සිරිපාල මහතා විසින් වැඩිපුර ගෙවා ඇති වාර්ෂික බදු මුදල් ආපසු ගෙවා සාධාරණ අන්දමින් මෙම කාරණය බේරුම් කරන ලෙස මා විසින් දිසාපතිට නියම කර ඇත. (ඉ) කරුණාකර ඉහත (ආ) ඡේදය බලන්න.

## නාවලපිටිය කොට්ඨාශයේ ගුරු පුරප්පාඩු

நாவலப்பிட்டித் தொகுதியில் ஆசிரியர் வெற்றிடங்கள்

## VACANCIES FOR TEACHERS, NAWALAPITIYA ELECTORATE

23. **චන්ද්‍ර කරුණාරත්න මයා.** (නාවලපිටිය)

*(திரு. சந்திரா கருணரத்ன—நாவலப்பிட்டி)*

(Mr. Chandra Karunaratne—Nawalapitiya)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නාවලපිටිය ඡන්දදායක කොට්ඨාශයේ පාසල් සංඛ්‍යාව කොපමණ ද? (ආ) ඒවායේ දැනට ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කීයද? (ඉ) එතුමා එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේ ද? (ඊ) එසේ නම්, ඒ කවදාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) நாவலப்பிட்டித் தேர்தல் தொகுதியிலுள்ள பாடசாலைகளின் மொத்தத் தொகை என்ன? (ஆ) இப்பொழுது இப்பாடசாலைகளிலுள்ள ஆசிரியர்களிற்கான வெற்றிடங்களின் மொத்தத் தொகை என்ன? (இ) இவ் வெற்றிடங்களை நிரப்புவதற்கான நடவடிக்கைகளை எடுப்பாரா? (ஈ) அப்படியாயின், எப்பொழுது?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) What is the total number of schools in the Nawalapitiya Electorate? (*b*) What is the total number of vacancies for teachers in these schools, at present? (*c*) Will he take steps to fill these vacancies? (*d*) If so, when?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(අ) 41 යි. (ආ) 30 යි. (ඉ) ඔව්. (ඊ) හැකි ඉක්මනින්.

**චන්ද්‍ර කරුණාරත්න මයා.**

*(திரு. சந்திரா கருணரத்ன)*

(Mr. Chandra Karunaratne)

අවුරුදු එක හමාරක පමණ කාලයක් තිස්සේ කියනවා ඉක්මනින් පියවර ගන්නවාය කියා. අපේ ප්‍රදේශයට ගුරුවරුන් තිහක් පමණ අඩුනම් මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් පාසැල්වල ගුරුවරුන් වැඩියෙන් සිටින නිසා එම ගුරුවරුන්වත් එවීමට ඉක්මනින් පියවර ගන්නවාද?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

හැකි ඉක්මනින් එවනවා.

## පනාමුරේ බණ්ඩොක්කයායේ පදිංචි අය

பனமுறை பண்டோக்கயாயா காணியிற் குடியிருப்போர்

## OCCUPIERS OF BANDOKKAYAYA, PANAMURE

9. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර—ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—சார்பாக)*

(Mr. Leslie Goonewardene—Panadura—on behalf of Dr. N. M. Perera—Yatiyantota)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පවුල් ගණනක් විසින් පනාමුරේ ප්‍රදේශයේ බණ්ඩොක්කයාය නමැති ඉඩම් කට්ටිය බුක්ති විඳින බව එතුමා දන්නවාද? (ආ) පරම්පරා එකකට වැඩි කාලයක් මෙකී අය මෙම ඉඩම් බුක්ති විඳින බව එතුමා දන්නවාද? (ඉ) මෙම බුක්ති නීත්‍යනුකූල කර එකී ඉඩම්වල අයිතිය ඔවුන්ට පවරන්නට එතුමා පියවර ගන්නවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) பனமுறைப் பகுதியில் "பண்டோக்காயாயா" எனப்பட்ட காணிகளிற் பல குடும்பங்கள் குடியிருப்பதை அறிவாரா? (ஆ) ஒரு சந்ததிக்குக் கூடிய காலமாக இவர்கள் இக்காணிகளிற் குடியிருப்பதை அறிவாரா? (இ) இக் குடியேற்றங்களை ஒழுங்காக்கி காணி உடைமையை அவர்களுக்கு கொடுக்க நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that a number of families have been in occupation of the lands called Bandokkayaya in the Panamure area? (*b*) Is he aware that these people have been in occupation of these lands for over a generation? (*c*) Will he take steps to have these occupations regularized and the ownership of the lands vested in them?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
**(Mr. Seneviratne)**

(අ) ඔව්. (ආ) නැත. (ඉ) අනවසරයෙන් අල්ලාගත් ඉඩම් වලට නැසිගිය ජේ. ඩබ්ලිව්. මඩුවන්වෙල මහතාගේ උරුමක්කරුවන් අයිතිවාසිකම් කියන හෙයිනුත්, මේ උරුමය තවම නිරවුල් කර නැති හෙයිනුත්, අනවසරයෙන් අල්ලාගත් ඉඩම් නියමානුකූල කිරීම, නිරවුල් කිරීම් අවසාන කර ඒ ඉඩම් රජය සතු ලෙස ප්‍රකාශ කරන තෙක්, කළ නොහැක.

## තෙල්ලඹුරේ විද්‍යාකාන්ති පාසලට ඉඩම්

*கா/தெல்லம்புறை வித்தியாகாந்திப் பாடசாலைக்கு காணி*

**LAND FOR G/TELLAMBURE VIDYAKANTHIE SCHOOL**

10. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (නීල් ද අල්විස් මයා.—බද්දේගම—වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—திரு. நீல் டி அல்விஸ்—பத்தேகம—சார்பாக)*
(Mr. Leslie Goonewardene—on behalf of Mr. Neal de Alwis—Baddegama)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ජී/තෙල්ලඹුරේ විද්‍යාකාන්ති පාසලට (අමාත්‍යාංශය යොමුව E4/63/63) ඉඩමක් අත්පත් කර ගැනීමේ වැඩකටයුතු ආරම්භ කරන ලද්දේ කවදාද? (ආ) මෙම කරුණ අවසානයකට පත් කරගැනීම ප්‍රමාදවීමට ඇති හේතු කවරේද? (ඉ) අත්පත් කරගත් ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාරදීමට එතුමා අදහස් කරන්නේ කවදාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) கா/தெல்லம்புறை வித்தியாகாந்திக்கு (அமைச்சுத் தொடர் பெண் E 4/63/63) நிலம் பெற்றுக் கொள்வதற்கான கொள்வனவு நடவடிக்கைகள் எப்பொழுது ஆரம்பிக்கப்பட்டன? (ஆ) இவ்விடயத்தில் முடிவு காணத் தாமதமேன்? (இ) பெற்றுக் கொண்ட நிலத்தை கல்வித் திணைக்களத்திடம் எப்பொழுது ஒப்படைக்க உத்தேசித்துள்ளார்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) When were acquisition proceedings initiated to acquire the land for G/Tellembure Vidyakanthie—(Ministry reference E 4/63/63)? (*b*) What is the delay in finalizing this matter? (*c*) When does he propose handing over the acquired land to the Department of Education?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
**(Mr. Seneviratne)**

(අ) අත්කර ගැනීමේ කටයුතු 1966 අප්‍රේල් මස ආරම්භ කරන ලදී. ඊට පෙර 1964 කරන ලද යෝජනාව අත්හරින ලදී. (ආ) මේ කාරණය අවසන් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් වී නැත. (ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය මෙම ඉඩම ඉතා ඉක්මණින් ඉල්ලා සිටි හෙයින් ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතේ 38 (අ) අතුරු විධානය යටතේ ආඥාව 1969. 4. 11 වෙනි දින ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීතුමාට ඉඩමේ භුක්තිය ඉක්මනින් භාරගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දෙන ලෙස උපදෙස් දෙන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පැල්පොල තොටුපලට පාලම් පාරුවක්

பெல்பொலவுக்கு பாதைத் தோணி

## FERRY BOAT FOR PELPOLA

12. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (චම්ලි ගුණවර්ධන මයා· —කළුතර—වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—திரு. சம்ளி குணவர்தன—களுத்துறை—சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Mr. Cholmondeley Goonewardene—Kalutara)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පරගස්තොට තොටුපල හරහා පාලමක් තැනූ වාසින් පසුව එහි තුබූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව සතු පාලම් පාරුව ප්‍රයෝජනයට නොගෙන පැත්තකට දමා තිබෙන බැව් එතුමා දන්නවාද? (ආ) දැනට පැල්පොල තිබෙන පාලම් පාරුව ඉතා අබලන් තත්වයක ඇති හෙයින් පැල්පොල තොටුපලේ පාවිච්චිය සඳහා මෙම පාරුව ලබාදීමට එතුමා වහාම පියවර ගන්නවාද? (ඉ) නොඑසේ නම් ඒ මන්ද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) பறகஸ்தோட்டையில் அரசாங்கக் கட்டு வேலைப் பகுதிக்குச் சொந்தமான பாதைத் தோணி, அப்பாதையிற் பாலம் கட்டப்பட்ட பின், வேலையின்றி இருப்பதை அறிவாரா? (ஆ) தற்போதுள்ள பாதைத் தோணி பழுது பார்ப்பதற்கு அப்பாற்பட்ட நிலையிலிருக்கும் பெல்பொல எனுமிடத்திற் பாவிப்பதற்காக இப்பாதைத் தோணியை அனுப்புதற்கு வேண்டிய நடவடிக்கையை உடனே எடுப்பாரா? (இ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that the ferry boat belonging to the P. W. D. at Paragastota is idling since a bridge has been constructed at this ferry? (*b*) Will he take immediate steps to release this ferry boat for use at Pelpola where the existing ferry boat is beyond repair? (*c*) If not, why?



**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**

*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம— அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*

(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

(*a*) Yes. The Paragastota bridge was completed on 15.10.1968 and the ferry boat is now not in use at Paragastota. (*b*) No. The Pelpola ferry is not in the charge of the P. W. D., and the ferry service is maintained by the village committee. (*c*) The ferry boat lying at Paragastota is required elsewhere to replace another departmental ferry boat.

## කළුතර නගරය හරහා ඇති මැද පාර

களுத்துறை நகரத்தின் ஊடாகச் செல்லும் மத்திய பாதை

## CENTRE ROAD THROUGH KALUTARA TOWN

13. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (චම්ලි ගුණවර්ධන මයා· —කළුතර—වෙනුවට)

*(திரு· லெஸ்லி குணவர்தன—திரு. சம்ளி குணவர்தன சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Mr. Cholmondeley Goonewardene)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කළුතර නගරය උස් කොට තනා ඇති මැද පාර දැන් යාන වාහන සඳහා විවෘත ව තිබෙන බව එතුමා දන්නවාද? (ආ) කොළඹ හා බෙන්තොට අතර පාරේ, ප්‍රිමික්ස් ඇස්පැල්ට් කොන්ක්‍රීට් මතුපිට යොදා තනා නැති එක ම කොටස මෙය බව එතුමා දන්නවාද? (ඉ) මෙම මැද පාර මතුපිටට ප්‍රිමික්ස් ඇස්පැල්ට් කොන්ක්‍රීට් යොදා නැවත තැනවීම පිණිස එතුමා වහා ම ක්‍රියා කරනවාද? (ඊ) එසේ නම්, කවදා ද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) களுத்துறை நகரத்தின் ஊடாகச் செல்லும் உயர்ந்த மத்திய பாதை தற்பொழுது வாகனப் போக்குவரத்திற்கு திறக்கப்பட்டுள்ளதை அவர் அறிவாரா? (ஆ) கொழும்பிற்கும் பெந்தொட்டைக்குமிடையில் உள்ள பாதையில் இது ஒரு பகுதியே நிலக்கீல்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]
கொங்கிறீட்டு முன்கலவை மேற்பரப்பில்லாதது என்பதை அவர் அறிவாரா? (இ) இம் மத்திய பாதையை நிலக்கீல் கொங்கிறீட்டு முன்கலவை மேற்பரப்புள்ளதாக்குவதற்கு உடன் நடவடிக்கை எடுப்பாரா? (ஈ) எனின், எப்பொழுது? (உ) இன்றேல், ஏன்?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that the elevated centre road through Kalutara town is now open to vehicular traffic? (*b*) Is he aware that this is the only stretch of roadway between Colombo and Bentota which does not have a premix asphalt concrete surface? (*c*) Will he take immediate steps to have this centre road re-surfaced with premix asphalt concrete? (d) If so, when? (*e*) If not, why?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

(*a*) Yes. (*b*) Yes. (*c*) It is the intention to premix this section of road as well in due course after allowing adequate time for any possible settlement of the filling. (*d*) Laying of premix carpet on this section will be taken up in the next financial year if a premix plant could be conveniently moved to this area. (*e*) Does not arise.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

Is the Hon. Minister going to have this stretch of road re-surfaced with red asphalt as he tried to do in regard to the road leading to Independence Square, or is he going to have it re-surfaced like the road leading to Buckingham Palace in England?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I might consider putting on a green carpet.

**කැනේඩියානු ආධාර පුවත්පත් කඩදාසි මෙහෙයුම් ගාස්තුවෙන් නිදහස් කිරීම**

கனடா உதவி பத்திரிகைத்தாள் மீதான தூக்குச் செலவு

**HANDLING CHARGES ON CANADIAN AID NEWSPRINT**

17. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எ. பெரேரா சார்பாக)*
(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) "ඇස්.ඇස්. සිටි ඔෆ් වෙලිංටන්" නෞකාවෙන් ගෙනෙන ලද, පුවත් පත් මුද්‍රණය පිණිස ගනු ලබන, කැනේඩියානු ආධාර කඩදාසි රෝල් 457 ක්, ද්විත්ව මෙහෙයුම් ගාස්තුවෙන් නිදහස් කරන ලෙස 13.2.1969 දින දී ජනසතු සේවා අමාත්‍යාංශය විසින් නියෝගයක් නිකුත් කරන ලද්දේද? (ආ) මෙම කැනේඩියානු ආධාර පුවත්පත් කඩදාසි එවා තිබුණේ කා නමටද? (ඉ) මෙසේ එම ගාස්තුවෙන් නිදහස් කිරීමට හේතුව කවරේද? (ඊ) මෙම නිදහස් කිරීම දෙන ලද්දේ වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී හා අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්පූර්ණ වශයෙන් සාකච්ඡා පැවැත්වූවාට පසුවද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) "S. S. சிடி ஒவ் வெலிங்டன்" என்னும் கப்பலிலே கனடா நாட்டு உதவி வகையில் வந்த 457 சுருள்கள் பத்திரிகைத் தாள் பேரில் இரட்டித்த தூக்குச் செலவுகளை விட்டுவிடும்படிக்கு தேசியமயச் சேவை அமைச்சு 13.2.69 தேதியில் பணித்ததா? (ஆ) எவர் பேருக்கு இக்கனடா நாட்டு உதவி வகை பத்திரிகைத்தாள்கள் அனுப்பப்பட்டு இருந்தன? (இ) செலவுகளை விட்டுவிடும்படி பணித்ததன் காரணம் என்ன? (ஈ) துறைமுக சரக்குக் கூட்டுத்தாபனத்தின் சபையுடன் அல்லது பொது முகாமையாளருடன் பூரண ஆலோசனைகளை பெற்றபின்போ செலவுகளை விட்டுவிடும்படி பணிக்கப்பட்டது?

asked the Minister of Nationalized Services: (*a*) Was a directive issued on 13.2.1969 by the Ministry of Nationalized Services that double

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

handling charges on 457 rolls of Canadian aid newsprint per "s.s. City of Wellington" be waived? (b) For whom was this Canadian aid newsprint consigned? (c) What was the reason for this waiver? (d) Was this waiver imposed after full consultations with the General Manager and the Board of the Port Cargo Corporation?

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. வெலகெதர—தேசியமய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. D. B. Welagedara—Parliamentary Secretary to the Minister of Nationalized Services)

(*a*) Yes. (*b*) Director of Foreign Aid. (*c*) The party to whom the newsprint was allocated was not responsible for the delay in taking delivery and would not agree to accept liability for the payments. The consignment had to be removed early to avoid congestion in the warehouse. (*d*) The general manager was consulted. The chairman was not available for consultation.

### වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය : ආරක්ෂක මුරකරුවන්

துறைமுக (சரக்குக்) கூட்டுத்தாபனம் : பாதுகாப்புக் காவலர்

### PORT (CARGO) CORPORATION : SECURITY GUARDS

18. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලයට මෑතකදී බඳවා ගන්නා ලද ආරක්ෂක මුරකරුවන් 43 දෙනාගේ නම් හා ලිපිනය කවරේද? (ආ) ඔවුන්ගේ අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් කවරේද? (ඉ) ඉල්ලුම්පත් කැඳවන ලද්දේද? (ඊ) නො එසේ නම්, මන්ද? (උ) ඉල්ලුම්පත් කැඳවනු ලැබුවේ නම්, අයදුම් කරුවන්ට තිබිය යුතු සුදුසුකම් වශයෙන් පළකර තිබුණු සුදුසුකම් කවරේද?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா : (அ) அண்மையில் துறைமுக சரக்குக் கூட்டுத்தாபனத்திற்குச் சேர்க்கப்பட்ட 43 பாதுகாப்பு காவலர்களின் பெயர்கள், முகவரிகள் ஆகியன என்ன? (ஆ) இவர்களின் கல்வித் தராதரமும் ஏனைய தராதரங்களும் என்ன? (இ) மனுக்கள் கோரப்பட்டனவா? (ஈ) இன்றேல், ஏன்? (உ) மனுக்கள் கோரப்பட்டதானால் மனுதார் திருப்தி செய்யவேண்டியதாக பிரசுரிக்கப்பட்ட தகைமைகள் யாவை?*

asked the Minister of Nationalized Services: (*a*) What are the names and addresses of the 43 security guards recruited recently to the Port (Cargo) Corporation? (b) What are their educational and other qualifications? (*c*) Were applications called for? (*d*) If not, why not? (*e*) If applications were called for, what are the published qualifications which an applicant had to satisfy?

**වෙලගෙදර මයා.**

*(திரு. வெலகெதர)*

(Mr. Welagedera)

(*a*) There was no recruitment of security guards to the Port (Cargo) Corporation. (*b*) Does not arise. (*c*) (*d*) Does not arise. (*e*) Does not arise.

### ගොවි හමුදාව : පස් කැපීම

விவசாயப்படை : மண்வெட்டுதல்

### LAND ARMY EARTH-CUTTING

19. **ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)

*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*

(Mr. T. B. Tennekoon—Dambulla)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගොවි හමුදා කඳවුරුවල වාසය කරන භටයින් එක් එක්කෙනා දිනකට කොපමණ පස් කැපිය යුතුද? (ආ) (i) දැනට කැපීමට නියම කොට ඇති පස් ප්‍රමාණය දිනකට කැපීමට කිසිවෙකුටත් නොහැකි බවත්; (ii) ගණන් බලා තිබෙන ලෙසට පස් කැපීමෙන් දිනපතා විශාල පාඩුවක් සිදුවී ඇති බවත්; (iii) එසේ පාඩුවක් ඇතත් වැරදි සහිත ගණන් ඉදිරිපත් කොට එම පාඩුව වසා පෙන්වන බවත්; එතුමා දන්නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]
காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) பல்வேறு முகாம்களிலுமுள்ள விவசாயப்படையினர் ஒவ்வொருவரும் நாளொன்றிற்கு வெட்டவேண்டிய மண்ணின் அளவு என்ன? (ஆ) (i) நாளொன்றிற்கு வெட்டப்பட வேண்டும் என இப்பொழுது குறிப்பிடப்பட்டுள்ள அளவு மண்ணை வெட்டுவது எவருக்குமே இயலாது என்பதையும்; (ii) இப்பொழுதைய மதிப்பீடுகளின் படி, மண்வெட்டுதலானது மிகப்பெரிய நாளாந்த நட்டத்தை ஏற்படுத்தியுள்ளதென்பதையும்; (iii) இப்படியாக நட்டமேற்பட்ட போதிலும் நட்டத்தை மறைப்பதற்காகப் பிழையான கணக்கு சமர்ப்பிக்கப்படுவதையும், அறிவாரா?

asked the Minister of Land, Irrigation and Power: (a) How much of earth should each member of the Land Army, resident in the various camps, cut per day? (b) Is he aware (i) that it is not possible for any person to cut the quantity of earth now required to be cut per day; (ii) that according to estimates now made, earth cutting has led to a big daily loss; (iii) that although there is such a loss, wrong figures are submitted to cover up such losses?

**සෙනෙවිරත්න මයා.**
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

(අ) බුරුල් පොළොවේ පස් කපන විට එක් භටයකුගෙන් දිනකට බලාපොරොත්තුවන පස් ප්‍රමාණය ඝන අඩි 100 කි. පසේ තත්ත්වය හා අඩංගු තෙත් ගතිය අනුව මෙම ප්‍රමාණය සාමාන්‍ය වශයෙන් වෙනස් වෙයි. තද පොලොවේ පස් කපන විට බලාපොරොත්තුවන පස් ප්‍රමාණය ඝන අඩි ½කි. (ආ) (i) පැන නොනඟී. පොදු වශයෙන් නියම ප්‍රමාණයක් නියම කර නැත. එක් භටයකු කපන පස් ප්‍රමාණය පසේ තත්ත්වයත් අනුව වෙනස් විය යුතුය. (ii) පරිපාලන කාර්ය මණ්ඩලයේ වියදමත්, කඳවුරු පිරිවැය හා කෝකින් සහ සේවකයන්ගේ වැටුප්, නිවාඩු, වැඩට නොපැමිණෙන සංඛ්‍යාව හා වෙනත් කරුණු අනුව තරමක පාඩුවක් සිදුවෙයි. (iii) කපන පස් ප්‍රමාණයන් හා මුදල් හදල් පිළිබඳ නිවැරදි වාර්තා නොකඩවා ඉදිරිපත් කෙරෙයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ඝණ අඩි එකක් කියලයි ප්‍රශ්නයේ පළමුවැනි කොටසට පිළිතුරු වශයෙන් කිව්වේ. ඒක හරිද?

**සෙනෙවිරත්න මයා.**
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

ඝණ අඩි සීයයි. කියුබ් එකයි.

## පී. පූවනසිංහම් මහතා, ගොවිජන සේවා නිලධාරි, වව්නියාව දකුණ

திரு. பீ. புவனசிங்கம், கமத்தொழிற் சேவை உத்தியோகத்தர், வவுனியா தெற்கு

MR. P. POOWANASINGHAM, AGRARIAN SERVICES OFFICER, VAVUNIYA SOUTH

21\. **ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වව්නියාවේ දකුණු දෙමළ කොට්ඨාශයේ ගොවිජන සේවා නිළධාරී තනතුර දරන්නේ පී. පූවනසිංහම් නමැති අයෙක්ද? (ආ) ඔහු සිංහල මුරකරුවෙකු තම නිවසට ගෙන්වා ඔහුට හොඳටම අඬන්තේට්ටම් කර සිංහලයින් විනාශ කිරීමට අවශ්‍ය අවි ආයුධ ඔහු ළඟ ඇති බව කියා තර්ජනය කළ බව එතුමා දන්නවාද? (ඉ) මෙවැනි දුක්ගැනවිලි එහි සිටින සේවකයින්ට ඉදිරිපත් කිරීමට කෙනෙකු නොමැති නිසා මේ නිළධාරියා ගැන පරීක්ෂා කර එතුමා සුදුසු පරිදි ක්‍රියා කරනවාද? (ඊ) වව්නියාවේ දකුණු දෙමළ කොට්ඨාශයේ ගොවිජන සේවා නිළධාරි පී. පූවනසිංහම් සිංහල අට වැන්න සමත් වී තිබේද? (උ) එසේනම්, ඔහුට සිංහලෙන් ලිපිනයක්වත් ලියන්නට නොහැකි වී ඇත්තේ මන්ද? (ඌ) ඔහුගේ සිංහල දැනීම පෙන්නුම් කරන තත්ත්වය පිළිබඳව ඔහුගේ දැනීම තිබේදැයි එතුමා පරීක්ෂා කරනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) வவுனியா தெற்குத் தமிழ் தொகுதியில் கமத்தொழில் சேவை உத்தியோகத்தராக பதவி வகிப்பது பீ. புவனசிங்கம் என்பவரா? (ஆ) அன்னார் சிங்கள காவலாளர் ஒருவரை தம் இல்லத்திற்கு வரவழைத்து அவரைத் தொந்தரவு செய்து சிங்களவர்களை அழிக்கத் தேவையான ஆயுதங்கள் தம்மிடமிருப்பதாக கூறிப் பயமுறுத்தியதை அவர் அறிவாரா? (இ) இம்மாதிரியான முறைப்பாடுகளை அங்குள்ள ஊழியர்கள் முறையிட ஒருவர் இல்லாததினால் இவ்வுத்தியோகத்தரைப் பற்றி விசாரணை செய்து தகுந்த நடவடிக்கையை அவர் எடுப்பாரா? (ஈ) வவுனியா தெற்கு தமிழ் தொகுதியின் கமத்தொழில் சேவை உத்தியோகத்தர் பீ. புவனசிங்கம் சிங்களம் எட்டாம்தர பரீட்சையில் சித்தியடைந்திருக்கிறாரா? (உ) ஆம் எனில் அவருக்கு சிங்களத்தில் ஒரு விலாசம்கூட எழுத முடியாமலிருப்பதேன்? (ஊ) அவருக்கிருப்பதாகக் கூறப்படும் சிங்கள அறிவு உண்மையில் இருக்கிறதாவென்று ஆராய்ந்து பார்க்கப்படுமா?

asked the Minister of Agriculture and Food: (*a*) Is Mr. P. Poowanasingham the Agrarian Services Officer of Vavuniya South (Tamil) Division? (*b*) Is he aware that he called a Sinhala watcher to his house, harassed him severely and threatened him, saying that he has with him the necessary weapons to destroy the Sinhala people? (*c*) As there is no officer before whom these employees could place this type of grievance, will he inquire into the complaints made against this officer? (*d*) Has this officer passed the 8th Standard in Sinhala? (*e*) If so, why is it that he cannot even write an address in Sinhala? (*f*) Will he find out whether this officer possesses the knowledge of Sinhala as claimed by him?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

(අ) ඔව්. (ආ) නැත. (ඉ) පැන නොනගී. (ඊ) නැත. ඔහු සමත් වී ඇත්තේ III වන ශ්‍රේණිය සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙනි. (උ) පැන නොනගී. (ඌ) ඔහු සිංහල ප්‍රවීණතා III වන ශ්‍රේණිය පරීක්ෂණයෙන් සමත් වී ඇති හෙයින්, තවදුරටත් පරීක්ෂා කිරීම අනවශ්‍යය.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 22.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට සති දෙකක් කල් ඕනෑ කරනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

# කෙටුම්පත් පණත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

## Bills Presented

### පැනගිය තැනැත්තන් පනත් කෙටුම්පත

தப்பியோடியவாட்கள் மசோதா

**FUGITIVE PERSONS BILL**

"to make fresh provision for the return of fugitive persons from Ceylon to other countries with which arrangements for such return have been made by the Government of Ceylon, to regulate the treatment of persons accused or convicted of offences in Ceylon who are returned from such countries and to provide for matters connected therewith or incidental thereto".

**පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති ගරු ඩඩ්ලි සේනානායක විසිනි.**

**1969 අප්‍රේල් 27 වැනි ඉරිදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.**

பிரதம அமைச்சரும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும், திட்டவமைப்பு பொருளாதார விவகார அமைச்சருமான கௌரவ டட்லி சேனநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

1969 ஏப்றில் 27, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Presented by the Hon. Dudley Senanayake, Prime Minister, Minister of Defence & External Affairs, and Minister of Planning & Economic Affairs ; to be read a Second time upon Sunday, 27th April 1969, and to be printed.*

## ආහාර පාලන (සංශෝධන) පනත් කෙටුම්පත

*உணவுக் கட்டுப்பாடு (திருத்த) மசோதா*

**FOOD CONTROL (AMENDMENT) BILL**

" to amend the Food Control Act. "

**පිළිගන්වන ලද්දේ කෘෂිකර්ම හා ආහාර ඇමති ගරු එම්. ඩී. බණ්ඩා විසිනි. 1969 අප්‍රේල් 27 වැනි ඉරිදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.**

*விவசாய, உணவு அமைச்சர் கௌரவ எம். டீ. பண்டா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

1969 ஏப்றில் 27, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. M. D. Banda, Minister of Agriculture and Food ; to be read a Second time upon Sunday, 27th April 1969, and to be printed.*

## කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත

*கைத்தொழில் அபிவிருத்தி மசோதா*

**INDUSTRIAL DEVELOPMENT BILL**

" to provide for the encouragement, promotion and development of industries in Ceylon ; to establish a public authority known as the Industrial Development Board of Ceylon ; to set up an Industrial Advisory Council and Industrial Panels ; to provide for the establishment of an Industrial Development Fund, and to make provision for matters connected therewith or incidental thereto ".

**පිළිගන්වන ලද්දේ කර්මාන්ත හා ධීවර ඇමති ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන විසිනි. 1969 අප්‍රේල් 27 වැනි ඉරිදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.**

*கைத்தொழில், கடற்றொழில் அமைச்சர் கௌரவ டீ. பீ. ஆர். குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.*

1969 ஏப்றில் 27, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. D. P. R. Gunawardena, Minister of Industries ond Fisheries ; to be read a Second time upon Sunday, 27th April 1969, and to be printed.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வு*

SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

" අද දින විසිර යෑමේදී මන්ත්‍රී මණ්ඩලය 1969 අප්‍රේල් මස 27 වැනි ඉරිදා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය. "

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## ප්‍රසිද්ධ රැඟුම් දැක්වීම් (සංශෝධන) පනත් කෙටුම්පත

*பொது வரங்காட்டுகள் (திருத்த) மசோதா*

PUBLIC PERFORMANCES (AMENDMENT) BILL

**පනත් කෙටුම්පත සලකා බැලීමේ නියෝගය කියවන ලදී.**

*பரிசீலிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration read.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Minister can now move the Third Reading.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

" පනත් කෙටුම්පත දැන් තුන් වැනි වර කියවිය යුතුය " යි මා යෝජනා කරනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.27

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, එක ප්‍රශ්නයක් ගැන මතක් කරන්නට ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ මන්ත්‍රීතුමාත් ස්ථාවර කාරක සභාවේ සභික මහත්මයෙක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We still do not know what the hon. Member wants to say. We must first hear what he has to say.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ පනත් කෙටුම්පත ස්ථාවර කාරක සභාවකට පවරන්නට පෙර දෙවැනි වර කියවීමේදී ගරු ඇමතිතුමා පොරොන්දුවක් දුන්නා, ස්ථාවර කාරක සභාවේදී විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන සංශෝධන ගැන සලකා බලනවාය කියා. ඒ පොරොන්දුව උඩ දෙවැනි වර කියවීමේ විවාදය සඳහා වැඩි වේලාවක් ගත නොකර ඉක්මණින් දෙවැනිවර කියවීම නිම කළා. ඊට පසුව මේ පනත් කෙටුම්පත ස්ථාවර කාරක සභාවකට පැවැරුවා. මාත් එම ස්ථාවර කාරක සභාවේ සාමාජිකයෙක්.

ගරු කථානායකතුමනි, මේ පනතේ එක ඡේදයක් ගැන සලකා බැලීමේදී විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අපි ඉදිරිපත් කළ කරුණු ගරු ඇමතිතුමා පිළිගෙන ඒ සම්බන්ධව අපට ප්‍රතිඥාවකුත් දුන්නා. එම ප්‍රතිඥාව නම් ඇතැම් වර්ගවල චිත්‍රපටවලට මේ රෙගුලාසි බල නොපාන අන්දමට රෙගුලාසි පනවනවාය කියන එකයි. එහෙත් අද ඉදිරිපත් කර ඇති මේ වාර්තාවෙන් එවැනි ප්‍රතිඥාවක් ක්‍රියාවට නැඟුණු බවක් පෙනෙන්නට නැහැ. මේ වාර්තාවෙන් පෙනෙන්නේ ස්ථාවර කාරක සභාවට ඉදිරිපත් කළ මුල් පනත එම කාරක සභාව ඒ අයුරින්ම පිළිගෙන ඇති බවයි. විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් කාරක සභාවේදී ඉදිරිපත් කළ අදහස් පිළිගන්නවාය ඒ අනුව සංශෝධන ඉදිරිපත් කරනවාය කියා ගරු ඇමතිතුමා කී නමුත් එය ක්‍රියාවට පරිවර්තනය වූ බවක් මෙයින් පෙනෙන්නේ නැහැ.

දෙවැනි කරුණ පිළිබඳව මතභේද ඇති වුණා. එහිදී විරුද්ධ පාර්ශ්වයේ අදහස් ප්‍රතික්ෂේප වුණා. ඒ ගැන විරුද්ධ පාර්ශ්වයේ අදහස් යථා කාලයේදී දක්වනවා. දැන් කියන්නේ පළමුවැනි කරුණ පිළිබඳව ගරු ඇමතිතුමා දුන් ප්‍රතිඥාව ක්‍රියාත්මක නොවී ඇති බවයි. රෙගුලාසි මාර්ගයෙන් නැත්නම් ගැසට් නිවේදන මාර්ගයෙන් ඇතැම් වර්ගවල චිත්‍රපටවලට මේ නීතිය බල නොපාන අන්දමට කටයුතු කරනවාය කියායි ගරු ඇමතිතුමා ප්‍රතිඥා දුන්නේ. කරුණා කර ඒ පොරොන්දුව නීතිගත කර තිබෙන්නේ කොහේද කියා අපට තෝරා දෙන්න.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එවැනි පොරොන්දුවක් ගැන මට මතක නැහැ. මෙතැන රෙගුලාසි ඉදිරිපත් කර නැහැ. මේ ඉදිරිපත් කර තිබෙන්නේ සංශෝධිත ආඥාපනතයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

There are no amendments made in Committee. In case the regulations come up for discussion the Hon. Minister will consider what the hon. Member has brought to his notice. The regulations are not before the House now.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රෙගුලාසි පැනවීමට මුල් පනත යටතේ බලයක් නැත කියන අදහසයි ඒ අවස්ථාවේදී පිළිගත්තෙ. එමනිසා ඒ බලය පවරන නීතියක් මේ පනතට ඇතුළත් කරනවාය කියා පොරොන්දුවක් දුන්නා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not know. The point is that this Bill has been sent to the House without amendment. The hon. Member could have taken that matter up in Committee. Unfortunately it has not been taken up in Committee, and the Bill has come to the House without amendment. There is nothing we can do at this stage.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පනත් කෙටුම්පත තුන් වන වර කිය වන අවස්ථාවේදී අපට——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

විරුද්ධ වන්නට පුළුවනි.

The Hon. Minister has moved the Third Reading.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම ඊට අතුරු යෝජනාවක් ඉදිරිපත් කරන්නට කැමතියි.

"දැන්" අත්හැර "අද දින සිට සිය වසක් ගත වූ පසු" ඇතුළත් කළ යුතුය කියා මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මූලික වශයෙන් මේ පනත් කෙටුම්පතේ 7 වන ඡේදයට විරුද්ධ පක්ෂයේ බලවත් විරුද්ධත්වය දක්වන්නේ ලේඛකයින්ගේ හා කලාකරුවන්ගේ මූලික නිදහසට හරස්වන අන්දමේ කරුණු මේකට ඇතුළත් වී තිබෙන නිසයි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

There is nothing to prevent the hon. Member from objecting to the Third Reading. He is now objecting to the Third Reading, and he can explain his objection.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ කෙටුම්පත් පනතේ 5 වන ඡේදයේ ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් 7 වන වගන්තිය ලෙස ඇතුළත් කරන්නට අදහස් කරන ඡේදය තිබෙන්නේ මේ විධියටයි :

"යම් ප්‍රසිද්ධ රඟුම් දැක්වීමක් සම්බන්ධයෙන් යම් සහතික කරන බලධරයකුගේ යම් ආඥාවක් හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් යම් සඳහන් කිරීමක් අඩංගු, ප්‍රවෘත්ති පත්‍රයක යම් ප්‍රසිද්ධ දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, සහතික කරන බලධරයාගේ පූර්ව අනුමතිය නොමැතිව මුද්‍රණය කරන, පළ කරන, බෙදා හරින, හෝ අලවන, හෝ මුද්‍රණය කරණු ලැබීමට, පළ කරනු ලැබීමට, බෙදා හරිනු ලැබීමට හෝ අලවනු ලැබීමට සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබීමේදී රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ, හය මාසයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතුය."

මේ කෙටුම්පත් පනත මුල් වරට ඉදිරිපත් කළ අවස්ථාවේ ගරු ඇමතිතුමාට විරුද්ධ පක්ෂය වෙනුවෙන් අප අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ දී 7 වන ඡේදයට මා විරුද්ධත්වය දැක්වූයේ යෝජනා කර තිබෙන මේ වගන්තිය ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵලය නොලැබෙනවාය කියන තර්කය ඉදිරිපත් කරමිනුයි. නමුත් මා ඊටත් එහාට ගිහින් අද කියන්නේ මේ යෝජනා කර තිබෙන නීතිය මේ ආකාරයට නීතිගත කිරීමෙන් ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන පරමාර්ථය ඉෂ්ට නොවන බව පමණක් නොවෙයි මෙවැනි නීතියක් නීතිගත කිරීමටත් අප තරයේම විරුද්ධ වන බවයි.

ගරු කථානායකතුමනි, මේ නීති සංශෝධනය වුවමනා කළේ—ඔබතුමාට මතක ඇති—පසුගිය දවස්වල මේ රටේ තහනම් කළ නාට්‍ය, සිනමා සහ වෙනත් දර්ශන කිහිපයක් ගැන රටේ ලොකු ජන මතයක් පැන නැගී ආ නිසයි. විශේෂයෙන්ම ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ පාලනය යටතේ පවත්නා විශ්ව විද්‍යාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

භතරේ බරපතළ කලබලකාරී ස්වභාව යක් තිබුණා. ඒ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය යන් අතර පැන නැගුණු ඒ අසහනය මුල් කරගෙන, ඒ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන්ට මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙන ඇතැම් දුෂ්කරතාවයන් පදනම් කරගෙන නිෂ්පාදනය කළ එක්තරා නාට්‍යයක්, "අපට පුතේ මගක් නැතේ" නම් එක්තරා නාට්‍යයක් රඟ දක්වන්නට මේ ප්‍රසිද්ධ රඟ දැක්වීම් මණ්ඩලයෙන් අවසරය ඉල්ලා තිබුණා. ඒ නාට්‍යය වරක් මේ මණ්ඩලයෙන් තහ නම් කර තිබුණා. ඒ තහනමට විරුද්ධව බලවත් උද්ඝෝෂණයක් ගෙන ගිය බව තමුන්නාන්සේට මතක ඇති. අනතුරුව ඇමතිතුමා ඒ නාට්‍යය බලා, එහි යම් යම් සංශෝධන ඇතිව මහජන ප්‍රදර්ශ නය සඳහා අවසර දුන්නා. මේ පනතේ පසුබිමක් වශයෙන් මේ සිද්ධිය සඳහන් කළේ, මෙවැනි සිද්ධීන් කිහිපයකින් පසුව මේ පනත ඉදිරිපත් වූ නිසායි.

මේ පනත දෙවැනි වර කියවීම පිළිබඳ විවාදයේදී—"අපට පුතේ මගක් නැතේ" නාට්‍යය ගැන සඳහන් කළ වේලාවේදී— ගරු අධ්‍යාපන ඇමතිතුමා කීවා, "කලා කරුවන්ගේ නිදහසට හරස් වන කිසි වක් මේ පනතට ඇතුළත් කරන්නේ නැත, තමන් දේශපාලන හා සංස්කෘ තික වශයෙන් නොපිළිගන්නා අදහස් වුණත් නාට්‍ය වශයෙන් වේදිකාවේ රඟ දැක්වීමට හරස් කපන්නේ නැත, ඉංග්‍රී සියෙන් 'බ්ලූ fපිල්ම්ස්' යනුවෙන් හඳුන්වන—සිංහලෙන් 'නීල පට දර්ශන' යයි කියමු—සමාජයේ සදාචාර වර්ධනයට හානිකර සිනමා චිත්‍රපටි තහනම් කිරීමට පමණක් මේ පනතට සංශෝධන ගෙනෙ නවාය, එය කොහෙත්ම 'අපට පුතේ මගක් නැතේ' වැනි නාට්‍යයන් කෙරෙහි බලපවත්වන්නේ නැත" කියා. එහෙත් මෙහි 7 වැනි ඡේදයෙන් යෝජනා කර ඇති නීතිය සමාජයට අහිතකර සිනමා චිත්‍රපටි කෙරෙහි පමණක් නොව, වෙනත් දේශපාලන හේතුන් නිසා තහනම් කරනු ලබන චිත්‍රපටි කෙරෙහිත් බලපවත්වන් නට පුළුවනි. ඇමතිතුමා තහනම් කරන් නට අදහස් කරන විධියේ "බ්ලූ fපිල්ම්ස්" හෙවත් "නීල පට දර්ශන" මා කවදාවත්ම දැක නැහැ. චරිත සංවර් ධනයට හානිකර එවැනි චිත්‍රපටි තහනම් කිරීම සම්බන්ධයෙන් නම් ඇමතිතුමා හා උරෙනුර ගැටී සහයෝගයෙන් ක්‍රියා කරන් නට සූදානම්. ඒ සඳහා කරන්නට තිබෙන්නේ, 7 වැනි ඡේදයේ සඳහන් නීති පැනවීම නොවෙයි.

බටහිර සිනමා චිත්‍රපටි පෙන්වන සිනමා ශාලාවකට ගියොත් දකින්නට පුළුවනි, අපේ සදාචාරයට හානිකර චිත්‍රපටි ඒවා යේ කොයි තරම් පෙන්වනවාද කියා. ඇමතිතුමනි, චිත්‍රපටි පරීක්ෂක මණ්ඩල යෙන් අනුමැතිය ලැබ පෙන්වනු ලබන ඒ බටහිර චිත්‍රපටි නිසා මේ රටේ සංස් කෘතියට කොයි තරම් බරපතල පහරක් වදිනවාදැයි ඕංගක් හොයා බලන්න. පසු ගිය දවසක මොකක්දෝ චිත්‍රපටියක් බලන්නට ගිය අවස්ථාවේදී, ඉදිරියේ දී පෙන්වන්නට තිබුණු වෙනත් චිත්‍රපටි යක සුළු කොටසකුත් පෙන්නුවා. මට මතක හැටියට ඒ චිත්‍රපටියේ නම "The Fastest Gun" හෙවත් "වේග වත්ව වෙඩි තබන තුවක්කු". ඒ තුවක් කු වලින් මිනිත්තුවකට තිහ හතළිහක් මරන්නට පුළුවනි. කඩපිල්වල කථා කර මින් හිටි අය මැස්සන් මදුරුවන් තළන්නා වාගේ වෙඩි තබා මරා දමන හැටි එහි පෙන්නුවා. ඇමතිතුමා විසින් පත් කරන ලද චිත්‍රපට පරීක්ෂක මණ් ඩලය මෙවැනි චිත්‍ර පට පෙන්වීමට අව සර දී තිබුණත්, දේශපාලන වශයෙන් තමුන්නාන්සේලාට ඕංගක් අහිතකර කිසියම් අදහසක් පළ වන නාට්‍යයක් පෙන්වීමට අවසර නොදීම යුක්තිසහගත ඇයි මා අහනවා. චරිත සංවර්ධනයට හානිකර, සදාචාර සංවර්ධනයට හානිකර චිත්‍රපට රාශියක් ඉංග්‍රීසි චිත්‍රපට ප්‍රදර් ශනාගාරවල පෙන්වද්දී ඒවා ගැන පිකක් වත් විරුද්ධත්වයක් නොදක්වන ඇමති තුමා, මේ රටේ සිටින දුප්පත් කලාකාර යකු හෝ නාට්‍ය ශිල්පියකු හෝ අවුරුද් දක් හමාරක් මහන්සි වී බොහෝම අමාරුවෙන් නාට්‍යයක් ලියා පුහුණු කොට එය වේදිකාගත කරන අවස්ථාවේදී ඊට හරස් කැපීම හරිද? අද ඒකාධිකාරයක් බවට පත් වී තිබෙන විදේශීය චිත්‍රපට ප්‍රදර්ශනාගාර නිසා මේ රටේ සංස්කෘති යට බරපතල පහරක් වදිද්දී ගරු ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තුමා අහක බලාගෙන සිටිනවා. සමහර විට එතුමා ඉංග්‍රීසි චිත්‍ර පට බැලීමට නොයනවා වන්නට පුළුවනි. එතුමා නොබැලුවත්, ඒවා බලන අයට, විශේෂයෙන්ම පාසල් යන වයසේ තරුණ ළමයින්ට මේ විධියේ මිනීමරු චිත්‍රපට දකින්නට සැලැස්වීම හරිද, එය අපගේ සංස්කෘතියට ගැළපෙනවාද යන ප්‍රශ්න මා අපේ සංස්කෘතිය බාර ගරු ඇමතිතුමාගෙන් අහනවා.

මෙම පනතේ 7 වන ඡේදය පිළිබඳ කරුණු ගෙනහැර දක්වන අවස්ථාවේදී ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එක් තර්කයක් මට මතකයි. චිත්‍රපට පරීක්ෂක මණ්ඩලය කිසියම් චිත්‍ර පටයක් තහනම් කළ විට, ප්‍රදර්ශකයා එම තහනමට විරුද්ධව ඇමතිතුමා මාර්ගයෙන් හෝ එතුමාගේ නියෝජිතයකු මාර්ගයෙන් හෝ අභියාචනයක් හෙවත් ඇපෑලක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, තහනම් කරන ලද චිත්‍රපටය නැවත පෙන්වීමට අවසර ලැබුණා යයි අපි සිතමු. පනතේ 7 වන ඡේදයෙන් කියැවෙන්නේ, මුල් චිත්‍රපටය තහනම් කළ බව දැන්වීම්වල සඳහන් නොකළ යුතු බවයි. මේ කරුණු දෙකේ ඇති සම්බන්ධය මොකක්ද? චිත්‍ර පටය තහනම් කළේ එය සදාචාර සංවර්ධනයට, සුචරිත සංවර්ධනයට හානිකරය යන හේතුව උඩයි. එහි යම් යම් කොටස් කපා දමා හෝ අලුතෙන් කොටස් කීපයක් ඊට එකතු කොට හෝ ඇමතිතුමා පසුව එම චිත්‍ර පටය නැත්නම් නාට්‍යය ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දෙනවා. සුචරිත සංවර්ධනයට හානිකරයයි සැලැකුණු දේවල් එම චිත්‍ර පටයෙන් අයින්කර දමා, මහජනයාට බැලීමට සුදුසුයයි පරීක්ෂක මණ්ඩලය හිතන කොටසට ඉඩ දෙනවා. එහෙත්, එවැනි චිත්‍ර පටයක් හෝ නාට්‍යයක් හෝ සම්බන්ධව පත්තරයක දැන්වීමක් පළ කරන විට, එවැනි තහනමක් පැනවූ බව එම දැන්වීමෙහි පළ කරන්නට එපායයි කියනවා. දැන්වීමෙහි එබඳු සඳහනක් පළ වුණු පළියට එය කියවන අයගේ හෝ එම දැන්වීමෙන් විස්තර වන චිත්‍ර පටය නැත්නම් නාට්‍යය නරඹන අයගේ හෝ සදාචාර සංවර්ධනයට කිසිම හානියක් සිදු වනවාද? මේ කරුණු දෙක අතරේ කිසිම සම්බන්ධයක් නැහැ. තහනම් කරන ලද චිත්‍ර පටයක් හෝ නාට්‍යයක් හෝ නැවත පෙන්වන බව ප්‍රචාරය කිරීම සමහර විට, වෙළෙඳ බඩුවක් ප්‍රචාරය කිරීමෙන් වැඩිපුර පාරිභෝගිකයන් පිරිසක් ඇද ගැනීම වැනි දෙයක් වන්නට පූළුවනි. නරඹන්නන් විශාල පිරිසක් ඇදී එන්නට පුළුවනි. එහෙත්, මේ කරුණු දෙක අතරේ කිසිම සම්බන්ධයක් නම් නැහැ. චිත්‍ර පටයේ හෝ නාට්‍යයේ හෝ නුසුදුසු කොටස කපා දැමුවායින් පසු එය මහජනයා විසින් නැරඹීම ඔවුන්ගේ සදාචාර සංවර්ධනයට හානියක් වන්නේ නැහැ. චිත්‍ර පටය අයිතිකරු එයින් කරන්නේ, ඔහුට වැඩිපුර ආදායමක් ලබා ගැනීමට එම කරුණු උපයෝගී කර ගැනීම පමණයි. මේ දෙකේ කිසිම සම්බන්ධයක් නැහැ. වැඩිපූර මුදලක් ඉපැයීම සදාචාර සංවර්ධනයට අහිතකර ලෙස හේතු වනවායයි ගරු ඇමතිතුමා කියනවාද කියා මා දන්නෙ නැහැ. ශීලාචාර විධියට නම් හුඟක් සල්ලි හම්බ කරන්න අමාරු බව මා දන්නවා. ඒ වාගේම නීත්‍යානුකූල ලෙස හුඟක් සල්ලි හම්බ කර පොහොසත් වෙන්නත් අමාරුයි. එහෙත් තහනම් කරන ලද චිත්‍රපටියක් එසේ තහනම් කළ බව දැන්වීමක ප්‍රදර්ශනය කළ පළියට තමන්නාන්සේ බලාපොරොත්තු වන සදාචාරය ආරක්ෂා කිරීමේ කාර්යයට රුකුලක් ලැබෙන්නෙ කොහොමද? චිත්‍රපටියක් හෝ නාට්‍යයක් ප්‍රදර්ශනය කරන්නට ඉඩ දෙන්නේ එයින් සදාචාරයට හානියක් නොවන නිසයි. වරක් තහනම් කර තිබූ බවක් දැන්වීමක සටහන් කළ පළියට ඒ චිත්‍රපටිය හෝ නාට්‍යය සදාචාර විරෝධි වෙනවාද? ඒ චිත්‍රපටිය හෝ නාට්‍යය නරඹන අයගේ සදාචාරය පිරිහෙනවාද? ඒ දෙකම වෙන්නෙ නැහැ. ඒ දෙකම වෙනවා නම් එය ප්‍රදර්ශනය කිරීම වැරදියි. එය සම්පූර්ණයෙන්ම තහනම් කරන්න ඕනෑ.

චිත්‍රපටියක් හෝ නාට්‍යයක් පිළිබඳ දැන්වීම් පළ කරන තැනැත්තාට තමන්ගේ නිදහස පාවිච්චි කර ඒ චිත්‍රපටියේ අතීතය දෙස බලා, එහි පසු තලය දෙස බලා වැඩි සංඛ්‍යාවක් ඒ චිත්‍රපටිය හෝ නාට්‍ය නැරඹීම සඳහා ඇදගැනීමට හැකි වන පරිදි ඒ දැන්වීම පළ කරන්නට අවස්ථාව තිබෙන්න ඕනෑ. මේ තරම් මුදලක් වියදම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ සැදු චිත්‍රපටියක්ය, මේ තරම් කාලයක් ගත කර සැදු චිත්‍රපටියක්ය, එසේ නැත් නම් දෙවරක් තහනම් කර අවසානයේදී ගරු ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව පෙන්වනු ලබන චිත්‍රපටියක්ය ආදී වශයෙන් විස්තර කිරීමෙන් සදාචාර සංවර්ධනයට ඇති වන අයහපත කුමක්ද? චිත්‍රපටියක් හෝ නාට්‍යයක් පමණක් නොවෙයි, කථානායකතුමනි, තමුන්නාන්සේ දැක ඇති මෝටර් රථවලට වුවමනා කරන ටයර් විකිණීම සඳහා පත්‍රවල දැන්වීම් පළ කරන විට පවා ඒ ටයර්වල හොඳ පැවැත්ම, පාවිච්චියට සුදුසු බව ආදී විස්තර සහිත දැන්වීම් පළ කරන්නේ අඩ නිරුවතින් සිටින කාන්තාවකගේ ඡායාරූපයක්ද සහිතව බව. ඒක තහනම් කරන්නෙ නැහැ. එහෙත් තහනම් කර තිබුණ චිත්‍රපටියක හෝ නාට්‍යයක හෝ තහනම ඉවත් කර පෙන්වීම සඳහා අවසර දුන් පසු ඒ තහනම් කර තිබූ බව දැන්වීමක පළ කිරීමට මෙහි අවස්ථාවක් නැහැ. එසේ කිරීමට කිසිම යුතුකමක් නැහැ. පිටරටින් ගෙන්වන ටයර් එකක් විකිණීම සඳහා දැන්වීම් පළ කරන විට ඒ ටයර් එක ගැනීම සඳහා වැඩිපුර පාරිභෝගිකයන් සංඛ්‍යාවක් සපයා ගැනීමට අඩ නිරුවතින් සිටින කාන්තාවකගේ ඡායාරූපයක් පළ කිරීමට ඉඩ දෙනවා නම්, එබඳු දැන්වීමක් පළ කිරීමට නීතියෙන් කිසිම විරුද්ධත්වයක් නැත් නම්, මොන කාරණාවක් නිසා හෝ තහනම් කර තිබූ නාට්‍යයක් හෝ චිත්‍රපටියක් පෙන්වන්නට අවසර දුන්නාට පසුව ඒ තහනම පිළිබඳව දැන්වීමක සඳහන් කරන්නට තහනම්ය යනුවෙන් නීතියක් පනවන්නේ මොන හේතුවක් නිසාද? එක භාණ්ඩයක් විකිණීම සඳහා යම් පිළිවෙළකින් විස්තර කරන්නට නීතියෙන් අවසර දී තිබෙනවා නම් තවත් භාණ්ඩයක් සම්බන්ධයෙන් ඒ නීතියම බලපැවැත්වීමට නොදෙන්නෙ ඇයි? නාට්‍යයක් හෝ චිත්‍රපටියක් වුණත් භාණ්ඩයක් හැටියට හඳුන්වන්න පුලුවනි. ඒ මොකද? යම් කිසි මුදලක් වියදම් කර මුදල් උපයා ගන්නා මාර්ගයක් නිසයි. ඒකත් එක්තරා විධියක භාණ්ඩ විකිණීමක්. එම නිසා එක හා සමාන දෙකක් සම්බන්ධයෙන්, එකම විධියේ කාර්යයක් සම්බන්ධයෙන් නීති දෙකක් බලපැවැත්වීම යුක්ති යුක්ත නොවෙයි; සාධාරණ නොවෙයි.

වෙනෙකක් තබා පොළොව යට වළලන වතුර පයිප්ප විකිණීම සඳහා දැන්වීම් පළ කරන විටත් අඩ නිරුවත් කාන්තාවකගේ ඡායාරූපයක් සමගයි ඒ දැන්වීම පළ කරන්නෙ. එවැනි දෙයකට පවා, එවැනි භාණ්ඩ පිළිබඳව පවා, මිනිසුන්ගේ පහත් හැඟීම් ඇවිස්සෙන විධියේ දැන්වීම් පුවත්පත්වල පළ කිරීමට අවසර දෙනවා නම් චිත්‍රපටියක් හෝ නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම පිළිබඳව දැන්වීමක් පළ කිරීමේදී මේ විධියේ නීතියක් පැනවීම නීති විරෝධී නොවේද කියන එකයි මා නඟන ප්‍රශ්නය. ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන්නේ තහනම් කළ නාට්‍යයක් යළිත් වරක් පෙන්වන බව හඟවා දැන්වීමක් පළ කර වැඩිපුර පිරිසක් ඒ නාට්‍ය දර්ශනයට කැඳවීම වැළැක්වීමට නම්, මේ යෝජනාවෙන් එය ඉටු කරන්නට බැහැ. මෙහි ඕනෑ තරම් කඩොලු තිබෙනවා. මේ නීතිය නොකඩා තමන් බලාපොරොත්තු වන පරමාර්ථය ඉටු කර ගන්නට ඒවායින් පුළුවන් වෙනවා.

7 වැනි ඡේදයෙන් තහනම් කෙරෙන්නේ මෙන්න මේ කාරණා ටික පමණයි. මොනවාද ඒ කාරණා? "චිත්‍රපටියකට අදාළ ප්‍රසිද්ධ දැන්වීම්වල, සහතික කරන බලධරයාගේ ආඥාව පිළිබඳව සඳහන් කිරීම" යන්න යටතේ ඒවා සඳහන් කර තිබෙනවා:

"යම් ප්‍රසිද්ධ රැඟුම් දැක්වීමක් සම්බන්ධයෙන් යම් සහතික කරන බලධරයකුගේ යම් ආඥාවක් හෝ යම් කොටසක් සම්බන්ධයෙන් යම් සඳහන් කිරීමක් අඩංගු ප්‍රවෘත්ති පත්‍රයක යම් ප්‍රසිද්ධ දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, සහතික කරන බලධරයාගේ පූර්ව අනුමතිය නොමැතිව මුද්‍රණය කරන, පළ කරන................."

ඔය ආදී වශයෙන් සඳහන් කර තිබෙනවා. දැන්වීමක් පළ කරන්නට බැහැ. හැන්ඩ්බිලක් බෙදා හරින්නට බැහැ. ප්‍රදර්ශන පත්‍රයක් දෙන්නවත් බැහැ. දැන්වීම් කොළයක් නිකුත් කරන්නට බැහැ. ඔය හතර ආකාරයට හැරෙන්නට මේ කියන තහනම කඩාගෙන මහජනයාට හඟවන්නට පුළුවනි, තමන් පෙන්වන්නේ තහනම් කරන ලද චිත්‍රපටයක්ය යනුවෙන්. නාට්‍ය ගැන පළ වන්නේ දැන්වීම් පමණක් නොවන බව තමුන්නාන්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

දන්නවා. නාට්‍ය ගැන නොයෙක් විවේචන පළ වෙනවා. නාට්‍ය ශිල්පීන් හැටියටත් චිත්‍රපටි විවේචකයන් හැටියටත් යම් යම් පුද්ගලයන් චිත්‍රපටි සහ නාට්‍ය විවේචනය කරන, ගවේශනය කරන බව තමුන්නාන්සේ දන්නවා. එවැනි කලාකාරයන් ඕනෑ තරම් ඉන්නවා අද. ඒ අයට පුළුවනි චිත්‍රපටි නැත්නම් නාට්‍ය නරඹා ඒ ගැන විවේචන ලියන්නට. ඒ අය විවේචන ලියනවා. කලින් තහනම් කර තිබුණු චිත්‍රපටියේ අසුවල් අසුවල් කොටස් කපා හැරීමට සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියා වෙනත් ආකාරයකින් ඒ අයට කියන්නට පුළුවනි. අද පෙන්වන්නේ කලක් තහනම් කොට තබා නැවත තහනම ඉවත් කරනු ලැබූ චිත්‍රපටියක්ය නැත්නම් නාට්‍යයක්ය යනුවෙන් සඳහන් කරන්නට විවේචකයාට පුළුවනි. ඒ අය නීතියෙන් පැන ඇඟ බේරාගෙන එසේ කරනවා. ඒ නිදහස තිබෙන්නට ඕනෑ. ඒ නිදහස වහන්නැයි මා කියන්නේ නැහැ. මාත් ලේඛකයකු හැටියට, කලාකරුවකු හැටියට කියන්නේ, විවේචනය කිරීමේ නිදහස තිබිය යුතු බවයි. එහෙත් ඒ නිදහස චිත්‍රපටි දැක්වීම් ලියන කලාකරුවකුට නැති කර තිබෙනවා මෙහි. විවේචනය කිරීමේ මූලික නිදහස පැහැර ගැනීම ගැනයි මා මගේ බලවත් විරෝධය දක්වන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

May I interrupt the hon. Member? He cannot make a Second Reading speech at this stage. He must only give the reasons for asking that it be postponed for a hundred years.

The hon. Member is making another Second Reading speech. I have allowed him so much time to give him an opportunity of stating his reasons. So I would request him to finish off by giving his reasons as to why he wants it postponed for a hundred years. He cannot repeat what has been said at the Second Reading.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැහැ, මේවා කියන්නට වුණේ නැහැ. මේවා කිව්වාය කියනවා නම් ඒ කියමනත් වැරදියි. මක්නිසාද, ගරු ඇමතිතුමා දුන් ප්‍රතිඥාවක් අනුව කියා තිබුණේ කොමිටියක් තිබෙන බවත්, එතැනදී තව දුරටත් කියන්නට ඉඩ තිබෙන බවත්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That is right. The hon. Member was also in that Committee, and I find that Dr. Colvin R. de Silva has moved an amendment in that Committee, which has been rejected. Now it has come up without amendment. The hon. Member is now on the ground that it be put off.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කල් තැබීම පිළිබඳ ප්‍රශ්නයට හේතුව 7 වැනි ඡේදයෙන් පනවන අලුත් නීතිය නිසා කලාකාරයන් හැටියටත් නාට්‍ය ශිල්පීන් හැටියටත් යම් යම් අයට තිබෙන නිදහසට බරපතළ ලෙස පහර වදින්නට, සීමාවන් ඇති වන්නට, පුළුවන්කම තිබීමයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member had an opportunity, even if he did not want to make use of it, during the Second Reading, to bring out all these facts. Now it is past that stage. The Bill has gone to Committee and has come up without amendment. So now the only point that he can make is that it be put off a hundred years. He cannot make a Second Reading speech.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, හේතුව මෙයයි: සමහරවිට ප්‍රතිපත්ති පිළිබඳව කථා කිරීමේදී දෙවන වර විවාදයෙහිදී කිවයුතු සමහර කරුණු ගැන සඳහන් කරන්නට සිදු විය හැකියි. එය නොකර බැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am only asking the hon. Member not to force me to make an Order. I am giving him an opportunity to speak, but let him be as short as possible.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මුල්ම හේතුව මෙයයි: මේ කාලය මෙරට චිත්‍රපට හා නාට්‍ය පිළිබඳව බරපතල උනන්දුවක් ඇති වේගෙන එන කාලයක්. මෙවැනි නීති රීති පැනවීම නිසා මේ ඇති වී තිබෙන අළුත් ප්‍රබෝධයට බලවත් පහරක් වදින්නට සමහරවිට පුළුවනි. අළුත් කර්මාන්තයක් හැටියට හිස ඔසවාගෙන එන මේ චිත්‍රපට හා නාට්‍ය ශිල්පයට පහර නොවදින හැටියට නව අවුරුදු සියයක් කල් දමන්නැයි අප කියා සිටින්නේ එම නිසායි. තමුන්නාන්සේලා පනවන නීති රීති සමග සටන් කරන්නට තරම් ශක්තියක් ඇති ස්ථිර කර්මාන්තයක් හැටියට චිත්‍රපට හා නාට්‍ය කලාව දියුණුවට පත් වී එය මේ රටේ පැලපදියන් වනතුරු මෙවැනි නීති රීති පනවන්නට එපාය, මෙවැනි කටයුතු නව අවුරුදු සියයකට කල් දමන්නය කියන්නේ එම නිසායි. මේ රටේ සිනමා කර්මාන්තය එතරම් පැරණි එකක් නොවෙයි. සමහරවිට එම සිනමා නිෂ්පාදකයන් සහ නළු නිළියන් තමුන්නාන්සේලාගේ දේශපාලන අදහස්වලට හාත්පසින්ම විරුද්ධ අදහස් උදහස් ගැබ් කොට චිත්‍රපටි නිපදවන්නට පුළුවනි. ඒ හේතුකොටගෙන අර විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ අනාගතය විදහා දක්වන නාට්‍යයක් තහනම් කළා වාගේම අළුත් නළු නිළියන් විසින් නිපදවනු ලබන චිත්‍රපටත් තහනම් කරන්නට පුළුවනි. එසේ වුවහොත් 7 වන ඡේදය නිසා බරපතල හානියක් සිදු වෙනවා. මේ රටේ සිංහල චිත්‍රපට කර්මාන්තය පැලපදියන් වෙච්ච පැරණි කර්මාන්තයක් නම් සමහරවිට ආණ්ඩුවක් සමග වුවත් තරඟ කොට සටන් කොට දිනන්නට තරම් ශක්තියක් ඇති විය හැකියි. එහෙත් මේ රටේ සිංහල චිත්‍රපට කර්මාන්තය නවම අවුරුදු 10ක් වත් පැරණි නැති බව කියන්නට පුළුවනි. විදේශීය චිත්‍රපට ගෙන්වන්නන්ගේ ඒකාධිකාරය නිසා අපේ චිත්‍රපට කර්මාන්තය දැනටමත් ගෙල මිරිකී මැරෙන තැනට ගොස් තිබෙනවා. අළුතින් පැනවූ ආනයන අපනයන නීති වගයක් නිසා අද ඒ උදවියට ඉතා අමාරු තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. ඒ අතර විශේෂයෙන් ඔවුන්ගේ නිදහස සීමා කිරීමේ නීතිරීතිත් පැනෙව්වොත් සිනමා නිෂ්පාදනයට සහ නාට්‍ය නිෂ්පාදනයට බරපතල අමාරු තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වෙනවා ඇති. මේ කරුණු ගැන කල්පනා කර බලා මෙම කර්මාන්තය මේ රටේ ස්ථිර කර්මාන්තයක් හැටියට පැලපදියන් වනතුරු—

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔය කියන්නෙ හතරවන වතාවටයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசக்கர)*
(Mr. Prins Gunasekera)

අවුරුදු 100 ක් බැරි නම් අඩු වශයෙන් අවුරුදු 50ක් වත් කල් දෙන්න. එවිට තමුන්නාන්සේත් මේ ලෝකයේ නැහැ; මාත් නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සෙ නම් ඉන්න පුළුවනි. මට පේන්නෙ තමුන්නාන්සේ හැමදාම ඉන්න මිනිහෙක් හැටියටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එතකොට ඒ කාල සීමාව තුළදීවත් ඔවුන්ගේ කර්මාන්තය හරියාකාර මේ රටේ මුල් බැස ගන්විය හැකි වෙනවා ඇති. අළුතින් හිස ඔසවාගෙන එන මෙම කර්මාන්තය පිළිබඳව අළුතින් පැතිර යන උද්‍යොගයට හානි නොකරන ලෙස මා ඉල්ලනවා. ඔවුන්ගේ එම නව උද්‍යොගයේ කරපිය කඩා නොදමා විවේචනය කිරීමේ නිදහසට පහර නොවදින පිළිවෙළට එම කර්මාන්තයේ මූලික අයිතිවාසිකම් පාගා නොදැමෙන ආකාරයට මෙම පනත ඉදිරිපත් කරන ලෙස ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. අඩු වශයෙන් 7 වන ඡේදය නැතිව වත් ඉදිරිපත් කරන්න. එම නිසා හත් වන ඡේදය ඉවත් කර අනික් කොටස් ඉදිරිපත් කරන්න කැමති නම්, අඩුපාඩු කම් තිබුණත් අපට මෙය අනුමත කරන්න පුළුවනි. ගරු කථානායකතුමනි, අපේ ඇමතිතුමා, ලේඛකයකු හැටියට, බොහෝ විට ලේඛකයන් ආරක්ෂා කර දෙන කෙනෙකු හැටියට, ඉදිරිපත් වී තිබෙනවා. එසේ වුණත් මෙම හත්වන ඡේදයෙන් ඒ අයගේ මූලික නිදහසට පහර වදින නිසා එම ඡේදය ඉවත් කර පනත ඉදිරිපත් කරන හැටියට යළිත් වරක් ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)
(Mr. M. Tennakoon—Nikaweratiya)
නැඟී සිටියේ ය.
எழுந்தார்.
*rose.*

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

I move that the Question be now put.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Only one Member has spoken. Your Motion is a bit too early.

අ. භා. 3.2

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, හබරාදූව මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්පූර්ණයෙන්ම අනුමත කරන අතර, අවුරුදු සියයක් ගත වූවාට පසුවත් තත්ත්වය හොඳ වුණොත් මෙම පනත ඉදිරිපත් කිරීමේ අවස්ථාව මෙම ඇමතිතුමාටම ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා. ගරු ඇමතිතුමා මුල් පනත ඉදිරිපත් කළේ පිරිසිදු අදහසින් යයි මා කල්පනා කරනවා. වේදිකාවෙන් ජාතික දියුණුවට, අපේ සදාචාරික දියුණුවට, නියම ප්‍රයෝජනයක් ලබා ගැනීමේ අදහසින් එසේ ඉදිරිපත් කළා විය හැකියි. නමුත් එතුමා ඉදිරිපත් කර ඇති සංශෝධනයන් පිළිගෙන මෙම පනත ක්‍රියාත්මක කරන්න යෙදුණොත් ඇමතිතුමා බලාපොරොත්තු වන දේ ඉටු වෙයිද, ඊට වඩා වෙනත් දෙයක් සිදු වෙයිද කියා කල්පනා කර බැලීම ඉතාමත්ම වැදගත් බව මතක් කරන්න කැමතියි. එම නිසයි තුන්වන වර කියවීමේදී අපේ විරුද්ධත්වය මේ ආකාරයෙන් ප්‍රකාශ කරන්නේ.

ගරු කථානායකතුමනි, අද රටේ තත්ත්වය දිහා බැලුවොත් ගරු ඇමතිතුමා මේ පනත ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන පරමාර්ථවලට වඩා ප්‍රතිවිරුද්ධ ක්‍රියා මාර්ගයක් ඇති වී තිබෙන බව පෙනී යනවා. මේ රටේ වේදිකාවෙන්, මේ රටේ පෙන්වන චිත්‍රපටිවලින්, අපේ ජාතික හැඟීම්, ජාතිමමත්වය, ආදිය විනාශ කර දැමීමේ ක්‍රියා මාර්ගයක් ගෙන යනවා. ජාතිය පිළිබඳ හැඟීමෙන් තොරව කටයුතු කරන පුද්ගලයන්ට විශේෂ තැනක් දීමේ ව්‍යාපාරයක් සාර්ථක ලෙස ගෙන යනවා. මෙබඳු අවදියක යම් යම් තහනම් නීති පැනවීමෙන් පහර වදින්නේ බොහෝ විට සවදේශීය කලාකරුවන්ට, සවදේශීය නිෂ්පාදයන්ට බව, මතක් කර දෙන්න කැමතියි. එම නිසා මේ අවස්ථාවේදී අප යම් යම් නීතිරීති පනවන විට, යම් යම් පියවර ගන්න විට, ප්‍රවේශම් විය යුතුයි. ගරු කථානායකතුමනි, අපේ රටේ ඉතාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්ෂතාවන් ඇති කලාකරුවන් ඉන්නවා. සිංහල සිරිතට විරිතට ගැළපෙන විධියට, ජාතික සංවර්ධනයට, ප්‍රබෝධයට, තුඩු දෙන විධියට නොයෙක් නිෂ්පාදනයන් වේදිකාවට ගෙන ඒමට තරම් විශාල ශක්තියක්, දක්ෂතාවක් ඇති කලාකරුවන්, නිෂ්පාදකයන් අපේ රටේ අද බිහි වේගන එනවා. නමුත් මේ අන්දමට බිහි වේගන එන පිරිසට, බටහිර සිරිත් විරිත්, සදාචාරය, ආදී සියල්ලක්ම අපේ සමාජයේ පැලපදියම් කිරීමට උත්සාහ කරන, ඉදිරියටත් ගෙන යාමට සූදානම්ව සිටින කොටස්වලින් විශාල තර්ජනයක් එල්ල වී තිබෙනවා. ඒ අයගේ තාඩන පීඩනවලට ස්වදේශීය කලාකරුවන්, නිෂ්පාදකයින් අද භාජන වී තිබෙනවා. එම නිසා මෙබඳු සංශෝධන පනතක් ඉදිරිපත් කිරීමෙන් ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන පරමාර්ථයන්ට වඩා හාත්පසින් විරුද්ධ දෙයක් සිද්ධ වන්නට පුළුවන් බව මෙහිදී මතක් කර දෙන්න කැමතියි. ඒ වාගේම ස්වදේශීය කලාකරුවන්, නිෂ්පාදකයින්, අපේ ජාතික හැඟීම්, සදාචාරාත්මක හැඟීම් ගොඩ නැංවීම පිණිස නිෂ්පාදනය කරන්නට බලාපොරොත්තු වන දේ, ඒ ආකාරයෙන් කර ගෙන යාමට අවසථාව නොලැබී යන්නටත් පුළුවනි. එම නිසා, ඇමතිතුමාගේ පරමාර්ථයන් ඉටු කර ගැනීමට නම්, ස්වදේශයට ගැළපෙන නිෂ්පාදනයන් කිරීමට ස්වදේශීය කලාකරුවන්ට අවසථාව ලබා දෙන ලෙසටත්, දැනට ස්වදේශීය කලාකරුවන්ට, නිෂ්පාදකයන්ට බාධක ඉදිරිපත් කිරීමට සූදානම් වන, පරදෙසට ගැතිකම් කරන පුද්ගලයන්ට අනුබල ලැබෙන අන්දමේ පියවර නොගන්නා ලෙසටත්, චිත්‍රපටවලින් හා නොයෙකුත් අන්දමින් ස්වජාතිකයන් අතර නොයෙකුත් විධියේ ප්‍රචාරක කටයුතු ගෙන යමින් ජාතියේ පරිහාණියට හේතු වන පරිදි අනුගමනය කරන නොයෙකුත් ක්‍රියා මාර්ගයන් වැළැක්වීම පිණිස පියවර ගන්නා ලෙසට— ඉල්ලන අතර, මෙම සංශෝධන පනත අවුරුදු සියයකට පසුව වත් ඉදිරිපත් කිරීමට මෙම ඇමතිතුමාටම අවසථාව සැලසේවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අ. භා. 3.5

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, මා වැඩිවේලාවක් කතා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. අවුරුදු 100 කට කල් දමන්නය කියා මා කියන්නේ මේ ඉංග්‍රීසියේත් සිංහලේත් පරස්පර විරෝධයක් මට පෙනෙන්න තිබෙන නිසයි. මේ පනතෙහි සිංහල භාෂාවෙන් තිබෙන්නේ මෙන්න මේ ආකාරයටයි.

"නීතිය බලපෑමේ ප්‍රකාශය" යටතේ එන 4 වැනි වගන්තියේ දෙවැනි කොටස දෙස බලන්න.

"මේ වගන්තියෙන්ම ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි ඇතුළත් කරනු ලබන (10) වන අලුත් උප වගන්තිය අනුව ප්‍රසිද්ධ රඟුම් දැක්වීම මණ්ඩලය විසින් කලින් නිරීක්ෂණය කරනු ලැබූ චිත්‍රපට වෙනුවෙන් ගාස්තුවක් අය කිරීමට ඇමතිවරයාට හැකි වන්නේය.

අපට මෙයින් පෙනෙන්නේ යම්කිසි චිත්‍රපටියක් රඟුම් මණ්ඩලය මගින් නිරීක්ෂණය කළොත් ඒ චිත්‍රපටිය නැවතත් පෙන්වීමට ගාස්තුවක් අය කළ යුතු බවයි. රඟුම් මණ්ඩලය විසින් යම්කිසි චිත්‍රපටියක් නිරීක්ෂණය කළොත් එය නැවතත් පෙන්වන විට යම්කිසි ගාස්තුවක් අය කිරීමට ඇමතිතුමාට බලය තිබිය යුතුයි. නමුත් ඔබතුමාගේ අදහස එය නොවෙයි. මෙය ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය කළාද, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කළාද කියා මා දන්නේ නැහැ. ඉංග්‍රීසියෙන් තිබෙන්නේ වෙනත් ආකාරයකටයි.

"The new sub-section (10), which will be inserted in section 6 of the principal enactment by this clause, will enable the Minister to charge a fee in respect of films previewed by the Public Performances Board."

එයින් අදහස් කරන්නේ යම්කිසි චිත්‍රපටියක් රඟුම් මණ්ඩලයට ඉදිරිපත් කර රඟුම් මණ්ඩලය බලන විට ඒ බැලීමට පමණක් එක්තරා මුදලක් අය කරන බවයි. නමුත් සිංහල පරිවර්තනයේ තිබෙන්නේ නිරීක්ෂණය කළාට පසු යම්කිසි රඟුමක් පෙන්වනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

නම් ඒ රඟුම් හැම එකකටම මුදලක් අය කර ගත හැකි බවයි. මෙහි පරස්පර විරෝධි තත්ත්වයක් තිබෙනවා. මේ ඉංග්‍රිසි පනතේ දෙවැනි පිටේ 30 වැනි ඡේදය දෙස බලන්න.

"(10) The Minister may by Order published in the *Gazette*—

(*a*) prescribe a fee or charge to be paid in respect of any public performance submitted to and viewed by the certifying authority ;"

ඔය විධියටයි ඉංග්‍රිසියේ තිබෙන්නෙ. නමුත් සිංහල පරිවර්තනයේ තිබෙන්නේ මෙන්න මේ විධියටයි. දෙවැනි පිටේ 30 වැනි ඡේදය බලන්න.

(ආ) ඒ වගන්තියේ (10) වන උප වගන්තිය අවලංගු කිරීමෙන් හා පහත සඳහන් අලුත් උප වගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන්—

(10) ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥවකින් :

(අ) සහතික කරන බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඔහු විසින් නිරීක්ෂණය කරනු ලැබූ යම් ප්‍රසිද්ධ රඟුම් දැක්වීමක් වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුවක් හෝ අය කිරීමක් නියම කළ හැකිය.

මා හිතන විධියට එක්තරා විධියක ව්‍යාජ තත්ත්වයක් මෙහි තිබෙනවා. මේ සිංහල පරිවර්තනයේ හැටියට නිරීක්ෂණයට ඉදිරිපත් කළාට පසුව එම චිත්‍රපටියට නැත්නම් ප්‍රදර්ශනයට පමණක් මුදල් අය කිරීමට පුළුවන්කමක් තිබෙනවා. ඒ නිසා මේ සිංහල පරිවර්තනයේ හා ඉංග්‍රිසි පරිවර්තනයේ පරස්පර විරෝධි තත්ත්වයක් තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Minister can correct that in the Sinhala version by Motion, because drafting amendments are allowed.

As a matter of fact, we follow the English version generally, but if there is a mistake in the Sinhala version the Hon. Minister can correct that.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මා හිතන විධියට ඇමතිතුමා අදහස් කරන්නේ—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

In a court of law it is the English version that is accepted.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

"Performance" කියන වචනය යොදා තිබෙන්නේ රඟුම් දැක්වීමක් කියන අදහසටයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

How would you suggest that the Sinhala version be amended ? If the Hon. Minister agrees to that we can proceed.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මෙම පනත දෙවැනි වර කියැවීමේ විවාදයේදී මට මෙහි පැමිණෙන්නට බැරි වුණා. නිරීක්ෂණය කළායින් පසුව හැම ගාස්තුවක්ම අය කරන බව කියැවෙන මේ වගන්තිය සඳහන්ව ඇති සිංහලයෙන් පළ වී තිබෙන පනත පාවිච්චි කළ හොත් රඟුම් දක්වන උදවිය ඒ මාර්ගයෙන් වැඩිපුර මුදල් අය කරන්නට ඉඩ තිබෙනවා. එහෙම වුණොත් ප්‍රේක්ෂකයන්ට සිදු වන්නේ පාඩුවක්. ඒ නිසා ඒ වගන්තිය පිරිසිදු කරන්නැයි මා ඉල්ලා සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු කථානායකතුමනි, මෙම පනතේ තිබෙන්නේ "සහතික කරන බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඔහු විසින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිරීක්ෂණය කරනු ලැබූ......" යනාදී විධි යටයි. මෙහි ඒ තරම් ප්‍රශ්නයක් නැහැ. "රඟුම් දැක්වීමක්" යන වචනවලින් වෙනත් අදහසක් කියැවෙන බව ගරු මන්ත්‍රීතුමාගේ කල්පනාවයි. [බාධා කිරීමක්] හොඳයි, එසේ නම් "නිරීක්ෂණය කරනු ලැබූ" යන වචන වෙනුවට "නිරීක්ෂණය කෙරෙන" යන වචන ඇතුළත් කරන්නට පුළුවනි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, එහෙම නම් ඒ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ගරු කථානායකතුමනි, සිංහල පනත් පිටපතේ 4 වන වගන්තියේ (ආ) උප වගන්තියේ සඳහන් "නිරීක්ෂණය කරනු ලැබූ" යන වචන වෙනුවට "නිරීක්ෂණය කෙරෙන" යන වචන ඇතුළත් කළ යුතු යයි මම යෝජනා කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
Aye!

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
හත් වැනි වගන්තියෙන් නම් කාටවත් ඒ තරම් ප්‍රයෝජනයක් නැහැ. ඒ වගන්තිය නිසා ප්‍රයෝජන වෙනුවට අප්‍රයෝජන නම් සැලසෙන්නට පුළුවනි. මේ නිරීක්ෂක මණ්ඩලයේ විවේචන ප්‍රසිද්ධියට පත් කළොත් මේ ව්‍යාපාරයේ යෙදෙන උදවිය සමහර විට එයින් පාඩමක් ඉගෙන ගන්නට පුළුවනි. මේ මේ විධියේ විවේචන නිරීක්ෂක මණ්ඩලයෙන් ඉදිරිපත් වන නිසා ඒවායින් බේරෙන්නට ඕනෑ යයි මේ ව්‍යාපාරයේ යෙදෙන්නන් කල්පනා කරන්නට ඉඩ තිබෙනවා.

සමහර චිත්‍රපට ප්‍රදර්ශකයන් නහර දුර්වලකමින් රෝගාතුරව සිටින බව මා දන්නවා. මම ඊට හේතු කියන්නම්. චිත්‍රපට කථාවක් නිරීක්ෂක මණ්ඩලයෙන් නිරීක්ෂණය කෙරෙන්නේ නැහැ. රඟුම් නිරීක්ෂක මණ්ඩලයට දෘශ්‍ය කාව්‍යයක් ඉදිරිපත් කළ විට එය බලා හරි හෝ වැරදි හෝ බව දැනුම් දෙනවා. ඒ මණ්ඩලය තම බලය පාවිච්චි කරමින් ක්‍රියා කරනවා. සමහර විටෙක අයුතු විධියට ඒ බලය පාවිච්චි කරනවා. තවත් විටෙක සාධාරණ විධියටත් ඒ බලය පාවිච්චි කරනවා. ඒක වෙනම ප්‍රශ්නයක්. කෙසේ වුණත් චිත්‍රපට කථාවක් තිර ගත කරන්නට පෙර එය නිරීක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ නිසා යම් කිසි කථාවක් තිර ගත කරන්නට පටන් ගත් වේලාවේ සිටම ඒ කටයුත්ත මෙහෙය වන්නන් තුළ විශාල සැකයක් පවතිනවා. නිරීක්ෂක මණ්ඩලයෙන් තම නිෂ්පාදනය අනුමත වේද නැද්දයි යන සැකය නිසා ඔවුන් ලොකු පීඩාවක් ලබනවා.

ලංකාවේ චිත්‍රපට සංඛ්‍යාව අඩුයි. ඒ සඳහා ලැබෙන අනුබලයත් අඩුයි. රසික පිරිසත් අඩුයි. විශේෂයෙන්ම ප්‍රේක්ෂක සංඛ්‍යාව අඩුයි. ඒ වාගේම අපේ චිත්‍රපට වෙනත් රටවල ප්‍රදර්ශනය කරන්නට ලැබෙන අවස්ථාත් අඩුයි. අපේ චිත්‍රපටවල තත්ත්වය උසස් මදි බවත් ප්‍රකාශ වෙනවා. තත්ත්වය උසස් වන්නේ ප්‍රේක්ෂක සංඛ්‍යාව වැඩි වීමෙනුයි. ඉන්දියාවේ එක නළුවකු එක් චිත්‍රපටයක රඟපෑම සඳහා ලක්ෂ පහක් අය කරනවා. හොලිවුඩ් වැනි නගරවල නම් ඊට වැඩිය අය කරනවා ඇති. එහෙත් ලංකාවේ නම් මුළු චිත්‍රපටයක් සඳහාම යොදවන්නේ රුපියල් ලක්ෂ තුනක් පමණයි. ඒ නිසා තත්ත්වය උසස් කරන්නට නම් ප්‍රේක්ෂක සංඛ්‍යාව වැඩි කරන්නට ඕනෑ. ප්‍රේක්ෂක සංඛ්‍යාව වැඩි කරන්නට නම් පිටරට වෙළෙඳ පොළවල් පවා ඇති කර ගන්නට ඕනෑ. ඒක අමාරු වැඩක්. ඒ නිසා රුපියල් ලක්ෂ තුනක්, හතරක් වියදම් කර යම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රසිද්ධ රඟුම් දක්වීම් (සංශෝධන) පනත් කෙටුම්පත —සලකා බැලීම

[ඉලංගරත්න මයා.]

කිසි නිෂ්පාදකයකු ඉදිරිපත් කරන චිත්‍රපටයක් නිරීක්ෂක මණ්ඩලයෙන් අනුමත වේද නැද්දැයි සැකය තිබෙන විට ඒ නිෂ්පාදකයා අධෛර්යයට පත් වෙනවා.

යම්කිසි විධියකින් පස් වන වගන්තිය නැත්නම්, ඇමතිතුමාගේ එසේ නැත්නම් නිරීක්ෂක මණ්ඩලයේ අදහස් අනෙක් උදවියට දැනගන්නට පුළුවන් වෙනවා. චිත්‍රපට ඉදිරිපත් කරන විට මෙන්න මේ විධියේ දෙබස්, ආණ්ඩුව විවේචනය වන මෙන්න මේ විධියේ දේවල්, ඇමතිතුමාට පහර වදින මෙන්න මේ වගේ දේවල් තිබෙනවා නම්, එය අනුමත කරන්නේ නැතැයි කියනවා නම් කල්තියාම එවැනි දේවල් අස් කර ගන්නට සූදානම් වන්නට පුළුවන්. ඒ නිසා මේ පනතේ 7 වැනි වගන්තියෙන් වැඩක් නැහැ. එයින් සිදු වන්නේ අවැඩක්. ඒ නිසා හබරාදුව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මතය මාත් අනුමත කරනවා. ඒ අනුව මෙය විකක් කල් දමා 7 වැනි වගන්තිය මේ පනතින් අස් කොට නැවතත් ඉදිරිපත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Are you replying?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
I am not replying.

**"අත් හැරීමට යෝජනා කළ 'දැන්' කියන වචනය ප්‍රශ්නයේ කොටසක් හැටියට තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදි.**

"இப்பொழுது" என்ற சொல் வினாவின் பகுதியாக இருக்குமாக" எனும் வினா விடுக்கப்பட்டது.

*Question, "That the word 'now' stand part of the Question", put.*

**කඩහඬවල් අනුව "විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදි.**

குரல்களின்படி "இல்லை" என்றவர்களுக்கு வெற்றி யென சபாநாயகர் அவர்களால் பிரகடனப்படுத்தப் பட்டது.

MR. SPEAKER, *having collected the Voices, declared that the 'Noes' had it.*

සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත—දෙවන වර කියවීම

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
Divide!

**මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 50; විරුද්ධව 24; යනුවෙන්—බෙදුණේය.**

சபை 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது சார்பாக 50; எதிராக 24.

*The House divided (under Standing Order No. 48): Ayes 50; Noes 24.*

**"පනත් කෙටුම්පත දැන් තුන් වන වර කියවිය යුතුය" යන මුල් ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

"மசோதா இப்பொழுது மூன்றாம் முறையாக மதிப்பிடப்படுமாக" எனும் மூல வினாவிடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

*Main Question, "That the Bill be now read the Third time", put, and agreed to.*

**කෙටුම්පත් පණත ඊට අනුකූලව තුන්වනවර කියවා සම්මත කරන ලදි.**

அதன்படி, மசோதா மூன்றாம் முறையாக மதிப்பிடப் பெற்று நிறை வேற்றப் பெற்றது.

*Bill accordingly read the Third time, and passed.*

# සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත

கூட்டுறவு மொத்த விற்பனைத்தாபன திருத்தம்) மசோதா

## CO-OPERATIVE WHOLESALE ESTABLISHMENT (AMENDMENT) BILL

**කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදි. ඊට අදාළ ප්‍රශ්නය [මාර්තු 7].**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු ජේ. ආර්. ජයවර්ධන.]**

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදි.**

மாச் 7 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக" [கௌரவ ஜே. ஆர். ஜயவர்தன].

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[7th March.]*

"That the Bill be now read a Second time".—[*The Hon. J. R. Jayewardene.*]

*Question again proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hcn. J. R. Jayewardene)

On the last day when the Debate was adjourned I was replying.—[*Interruption*]. Look up the HANSARD.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Who was speaking ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I do not know, Refer to Column 3137.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, ඔයකියන අවසථා වේ මාත් මෙහි සිටියා. ඇති වූ ප්‍රශ්නය මෙයයි : ගරු රාජ්‍ය ඇමතිතුමාටත් මතක ඇති, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ ගැන කථා කරගෙන ගියා. ඒ අවස්ථාවේදී කියා තිබියා කරුණකර කථාව නතර කරන්න එපා අපි අප්‍රියෙල් මාසයේ නැව තත් රැස්වුණාම—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

If you want, I will read from Column 3137 of the HANSARD of 8th March 1969. It says :

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(MR. SPEAKER)

Then will the Hon. Minister move the adjournment of the Debate ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(THE HON. J. R. JAYEWARDENE)

Sir, I do not want the hon. Member to finish his speech now. I want him to continue his speech. The next time we can continue the Second Reading, and that will be in April.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(MR. SPEAKER)

If that is so, the Hon. Minister can move the adjournment of the Debate at this stage.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(THE HON. J. R. JAYEWARDENE)

Yes.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(DR. N. M. PERERA)

Before I close, I want to urge one more point which I want him to consider when he gives his reply. I am also not satisfied in my own mind whether, even when we are running these corporations, we should not have some sort of competition among the corporations themselves. In Yugoslavia they have set up not one corporation but a number of corporations to make refrigerators, so that they can compete among themselves.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(THE HON. J. R. JAYEWARDENE)

I quite agree with the hon. Member. He mentioned about the Salu Sala prices of cloth. We cannot reduce the prices of imported cloth, because the local cloth will go out of the market. It is the same with chillies and with certain things we import. The local price is high and they cannot produce it for less. We must keep a certain price level as far as the imported things are concerned. Now, Sir, all this the hon. Members of the Opposition do not know and without knowing they are saying this is what we are doing. We want competition. The private sector must compete with the public sector and there must be competition within the private sector, and so on. The main interest must be the consumer.

I move,

'That the Debate be now adjourned'."

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

When the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) was speaking you agreed to the adjournment of the Debate. The other hon. Members may have been misled by that. If any hon. Member wants to speak I will allow him to do so.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Why did I reply ?

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
I do not know. It is clear that you indicated to the Opposition that the Debate be adjourned when the hon. Member for Yatiyantota was speaking.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
But Opposition Members were not there.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
I think we will give them an opportunity to speak.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
I have no objection to that.

අ. භා. 3.22

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ගරු කථානායකතුමනි, මට මතක හැටියට එදාම අවසානයක් නොකර මේක කල් දමන්නටය කියා ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වේ කරුණු කිහිපයක් ගැන කල්පනා කර බලන්නට එතුමාට කල් වුවමනා කර තිබුණු නිසයි. වලපනේ ගරු මන්ත්‍රීතුමා (වී. බී. එම්. හේරත් මයා.) කථාකරමින් එක්තරා වගන්තියක් ඉතාම භයානක වගන්තියක් බව කරුණු සහිතව පෙන්නුම් කළා. ඒ වගන්තිය, එනම් 4 වන වගන්තිය තිබෙන්නේ මෙහෙමයි :

"මණ්ඩලයේ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේයයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, නඩු පැවරීමක් හෝ වෙනත් නීතිකෘත්‍යයක් නොවිය යුතුය."

මේ සම්බන්ධව දීර්ඝ විවේචනයක් කරමින් වලපනේ ගරු මන්ත්‍රීතුමා සාධක සහිතව මේක භයානක වගන්තියක් බව ඔප්පු කළා. ඒවාගේම——

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
That was brought by you.

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අප සිටි කාලයේ සමහර විට අපේ සේවකයන් ඒ තරම් වැරදි නොකළාය කියා සිතා ගෙන කළ එකක් ඒක. නමුත් නමුන්නාන්සේලා යටතේ සිටින සේවකයන් කොයි විධියට කටයුතු කරනවාද කියා නමුන්නාන්සේලා සොයා බැලිය යුතුයි. එමනිසා නමුන්නාන්සේලාගේ ආරක්ෂාව සඳහායි අප විශේෂයෙන්ම මෙසේ කියන්නේ.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒක අනුමත කළා. එපමණක් නොවෙයි. බලතල නැතිවම ගරු රාජ්‍ය ඇමතිතුමා සතොසේ ඒකාධිපතිත්වයක් ඇති කරගෙන යනවාය කියාත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා සහ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කරුණු පෙන්වා දෙන්නට යෙදුණා. එහෙම කියන්නට හේතුව කුමක්ද? සළු සැල සම්බන්ධව මේ සභා ගර්භය තුළදී ඇසූ ප්‍රශ්නයකට ගරු රාජ්‍ය ඇමතිතුමා දුන් පිළිතුර "මට බලයක් නැහැ පිළිතුරු දෙන්නට" යන්නයි. පිළිතුරු දෙන්නට එතුමාට බලයක් නැත කිව්වා. සතොසේ එක් අංශයක් අරගෙන සළු සැල නමින් සමාගමක් පිහිටුවා ගෙන දැන් කටයුතු කරගෙන යනවා. සතොසෙන් එක්තරා මුදලකුත් ආණ්ඩුවෙන් එක්තරා මුදලකුත් අරගෙන නැන්පත් කර ඒ ව්‍යාපාරය කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යනවා. රජයේ අරමුදලක් නැත්පත් කර රජයේ ආශීර්වාදය ඇතිව කරගෙන යන ඒ සමාගම සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් ඇසුවාම ගරු රාජ්‍ය ඇමතිතුමා දෙන පිළිතුර කුමක්ද? "පිළිතුරු දෙන්නට මා බැඳී නැහැ, පිළිතුරු දෙන්නට මට බලයක් නැහැ" කියන එකයි එතුමා කියන්නෙ. මෙන්න මේ තත්ත්වය නිසා විශේෂයෙන්ම ඒ ගැන නැවතත් කල්පනා කළොත් හොඳය කියා ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා. ඇත්ත වශයෙන්ම එතුමා අපට ප්‍රතිඥාවක් දුන්නා. එවැනි ප්‍රතිඥාවක් දීලයි මේක අප්‍රේල් දක්වා කල් දැමුවෙ. එමනිසා විවාදය නැවත ආරම්භ කිරීමට ප්‍රථමයෙන් මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්නට කැමතියි, ඒ ප්‍රශ්න දෙක ගැන එතුමා කල්පනා කළාද, ඒ සම්බන්ධව දැන් ප්‍රකාශයක් කරන්නට තිබෙනවාද කියා. එවිට සමහර විට මේ විවාදය කෙළවර කරන්නට හෝ නැත්නම් ඒ ප්‍රකාශය උඩ විවාදය කරගෙන යන්නට පුළුවන්කම ලැබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කොයි දෙකද?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
සළු සල සම්බන්ධයෙන් ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙන්නට තමාට බලයක් නැතැයි රාජ්‍ය ඇමතිතුමා කළ ප්‍රකාශය ගැන විරුද්ධ පාර්ශ්වය ඇඩි විවේචනයක් කළා. ඒ සම්බන්ධයෙන් ස්ථිර ප්‍රකාශයක් කිරීමට රාජ්‍ය ඇමතිතුමා කල් ගත් බවකුයි, මට නම් හැඟුණේ.

අනෙක, සත් භාවයෙන් කරන වංචා සම්බන්ධයෙන් සේවකයන්ට ආරක්ෂාවක් දීම ගැනයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
4 වැනි වගන්තිය?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රකාශයක් කරන්නට කල් ගත්තා. ඒ කාරණා දෙක ගැන කියන්නට යමක් ඇත්නම්, එය මේ විවාදය එක්තරා මට්ටමකින් පවත්වාගෙන යාමට උදව්වක් වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
4 වැනි වගන්තිය ඉල්ලා අස් කර ගන්නම්. මා සළු සල අධ්‍යක්ෂ මණ්ඩලය හමු වුණා. සමුපකාර තොග වෙළඳ ආයතනය භාර ඇමතිතුමා අහන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දෙන්නට ඔවුන් සූදානම් බව අධ්‍යක්ෂ මණ්ඩලය කීවා. ඒ සියලුම විස්තර ඇමතිතුමාට දෙන බවත්, පාර්ලිමේන්තුවට වගකීම ඇමතිතුමාට භාර බවත් ඔවුන් කීවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒ කරුණු දෙක නිරාකරණය කර දීම ගැන අප ස්තුතිවන්ත වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
දැන් විවාදය ඉවර කරමු.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
තවත් කාරණයක් තිබෙනවා. ස.තො.ස. නැත්පත් මුදල් වෙනත් ව්‍යාපාරවල ආයෝජනය කිරීම සඳහා ඇමතිතුමා බලතල ලබා ගන්නට යනවා. මගේ කල්පනාවේ හැටියට මේ පියවර ගෙන තිබෙන්නේ රජයේ ප්‍රතිපත්ති පදනමක් උඩයි. රජයේ සංස්ථාවක් නැවතත් පෞද්ගලික ආයතනයක් බවට පත් කිරීම ගැන අප සම්පූර්ණයෙන්ම විරුද්ධත්වය පළ කරනවා. රාජ්‍ය ඇමතිතුමාත්, අගමැතිතුමාත් කියන විධියට නම් එසේ කරන්නේ පොතක පතක තිබෙන දර්ශනයක් අනුව නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

අපේ අත්දැකීමේ හා අදහසේ හැටියට නම් රජය පාරිභෝගිකයාට වගකිව යුතුයි, හොඳ බඩු සාධාරණ මිලට සැපයීම සම්බන්ධයෙන්. කිසිම රජයකට ඒ වගකීම පැහැර හරින්න බැහැ. යම්කිසි කටයුත්තක් රජයේ සංස්ථාවකට භාර වී තිබුණා නම්, ඒ කටයුත්ත පෞද්ගලික කොම්පැණියකට පැවරීමෙන් අර වගකීම ඉෂ්ට කිරීම අපහසු වෙනවා. ස.තො.ස. රෙදි වෙළඳාම කරගෙන ගිය හැටිත්, දැන් සළු සල රෙදි වෙළඳාම කරගෙන යන හැටිත් බැලුවාම කාටත් අවබෝධ වෙනවා,—රාජ්‍ය ඇමතිතුමා පවා පිළිගත්තා—සළු සල බෙදා හරින රෙදිවල මිළ වැඩි බව. රෙදි වෙළඳාම ස.තො.ස. ටම තිබුණා නම් එසේ රෙදි මිලේ වැඩි වීමක් ඇති වන්නේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නැහැ. මිළ නියම කරන්නේ රජයයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔව්. ස.තො.ස. රෙදි මිළ නියම කරන්නේ රජයයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සළු සල රෙදි මිළ නියම කරන්නේත් රජයයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

රජය මිළ නියම කළත් එය ක්‍රියාත්මක කිරීමට සංවිධානයක් ඇත්තේ නැහැ. දැන් මිළ පාලක නිළධාරීන් සම්පූර්ණයෙන්ම ක්‍රියා විරහිත තත්ත්වයක පසු වෙනවා. ඔවුන් ඉන්නේ වාණිජ හා වෙළඳ ඇමතිතුමා භාරයේයි. ඒ ඇමතිතුමාත් එක්තරා විධියකින් ක්‍රියා විරහිත වෙලා. මිළ පාලනය පිළිබඳ කටයුතු වෙළඳ ඇමතිතුමායි, රාජ්‍ය ඇමතිතුමායි බෙදාගෙන. කවුරු කාගෙන් පැහැරගෙන තිබෙනවාදැයි මා දන්නේ නැහැ. සමහර ප්‍රශ්නවලදී වගකීම භාර ගන්න ඒ ඇමතිතුමන්ලා දෙදෙනාටම බැරි වී තිබෙනවා. අද මිළ පාලනය සීමා වී තිබෙන්නේ කඩදාසියට හා රේඩියෝවට පමණයි. මිළ පාලනය අද බඩුවලට බලපාන්නේ නැහැ. එම නිසා වුව මනා මිළකට බඩු විකුණන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. මිළ පාලනය කළත්, සතොස වැනි ආයතනයකට තිබෙන බල තල සළුසල වැනි ආයතනයකට පැවරූ විට සිදු වන්නේ මොකක්ද? බඩුවල මිළ නියම කිරීමේදී, ආයතනය වෙනුවෙන් වැය වන මිළත් බඩු මිළට එකතු වීමයි. සතොස වැනි ආයතනයක් කෙරෙහි ආණ්ඩුවේ එක්තරා විධියක බල පෑමක් තිබෙන බව අප කවුරුනුත් දන්නවා. රාජකාරි අතිනුත් ගෙන්වනු ලබන භාණ්ඩ අතිනුත් ඒ බලපෑම රජයට තිබෙනවා. එහෙත් සළුසල වැනි ආයතනයක් කෙරෙහි ආණ්ඩුවේ එවැනි බලපෑමක් ඇති වන්නේ නැහැ. අද සළුසලේ අධිකාරී වශයෙන් කටයුතු කරන්නේ, 1962 දී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පෙරළා දමන්නට කුමන්ත්‍රණය කිරීමේ වරදට මේ රටේ අධිකරණයෙන් වරදකරුවකු වුණු පුද්ගලයකු බව අප කවුරුනුත් දන්නවා. සළුසලේ අධිකාරි වශයෙන් ඔහු අද රු. 3,000 ක මාසික වේතනයක් ලබනවා. ඒ රු. 3,000 හේ මුදලත් සළුසල ආයතනයේ වැයට වැටෙනවා. එම නිසා පාරිභෝගිකයා ඒ මුදලත් ගෙවිය යුතුයි. ඉස්සර එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ.

සළුසල ඇති කළ නමුත් එතරම් විශාල සේවක සංඛ්‍යාවක් ඊට බඳවාගෙන නැහැ. බඳවා ගන්නා ලද සේවකයන්ට ඉස්සර තිබුණු වරප්‍රසාද ලැබී නැහැ. එම නිසා එක් අතකින් සේවකයන්ට අකරතැබ්බයක් සිදු වුණා; අනෙක් අතින්, මිළ වැඩි වීම නිසා පාරිභෝගිකයාට හිරිහැරයක් වුණා. වාසිය සැලසුණේ, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පෙරළා දමන්නට කුමන්ත්‍රණය කොට මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වරදකරුවකු වූ පුද්ගලයකුට පමණයි. ප්‍රජාතන්ත්‍ර වාදයටත් රටේ ආර්ථික තත්ත්වයටත් හානි වන මෙවැනි සිද්ධිවලට මුහුණ පාන්නට මහජනයාටත් පාරිභෝගිකයාටත් සිදු වන්නේ, සතොසේ වැනි ආයතනවල මුදල් එක් එක් ව්‍යාපාරවල යෙදවීම නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍ය ඇමතිතුමාගේ මේ යෝජනාව නිසා අප තුළ විශාල සැකයක් පහළ වී තිබෙනවා. මේ ආණ්ඩුවෙන් තවමත් උදව් නොලැබුණු සමහර පුද්ගලයන් සිටිනවා. 1965 මැතිවරණයේදීත් 1959, 1962, 1964, ආදී වර්ෂවල ඇති වුණු කුමන්ත්‍රණවලදීත් ධනපති ක්‍රමය ආරක්‍ෂා කරන්නට වැඩ කළ පුද්ගලයන් හැම දෙනාටම තවම මේ ආණ්ඩුව උදව් කර නැහැ. මේ උදවිය අතර අරමුදල් නැති ව්‍යාපාරිකයන් සිටිනවා. රාජ්‍ය ඇමතිතුමාගේ මේ යෝජනාව අනුව, සතොසේ තැන්පත් මුදල් එකී උදවියගේ ව්‍යාපාරවලට රුකුලක් වේදෝ යන සැකයක් අප තුළ පහළ වෙනවා. සතොසට එක්තරා වාසියක් සැලසෙන බවක් රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් බැලූ බැල්මට පෙනෙන්නට තිබුණත්, සතොසේ තැන්පත් මුදල්, අර මුදල් නැති උදවියට දීමෙන් මේ රටේ ආර්ථික තත්ත්වයටවත් සතොසටවත් පාරිභෝගිකයාටවත් වැඩක් වන්නේ නෑ. එයින් සිදු වන්නේ, සළුසල, හෝටල් සංස්ථාව වැනි තැන්වල කෙරෙන්නාක් මෙන්, ආණ්ඩු පෙරළීමට කුමන්ත්‍රණය කොට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වරදකරුවන් වූ පුද්ගලයන්ගේ සාක්කුවලට මහජන මුදල් වැටීම පමණයි.

පෞද්ගලික ආයතන සමග තරඟකාරී ලෙස වැඩ කිරීමෙන් පාරිභෝගිකයාට සේවයක් සැලසීම තමාගේ අදහස බව රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා. ආණ්ඩුවේ සංස්ථා මඟින් පෞද්ගලික ව්‍යාපාරිකයන් ලවා තරඟ ඇති කර වීම මේ රටේ අද ඊයේ ඇති වුණු ආර්ථික සූත්‍රයක් නොවෙයි; එය බොහෝම පරණ සූත්‍රයක්. එහෙත්, ආණ්ඩුවක යුතුකම ව්‍යාපාරිකයන් අතර තරඟ ඇති කිරීම නොවෙයි. ආණ්ඩුවේ යුතුකම හොඳ බඩු පහසු මිළට පාරිභෝගිකයාට සපයා දීමයි. සළුසලේ රෙදිවල මිළ පහළ දමන්නට පුළුවන්කමක් නැත්තේ, එසේ කළ හොත් මේ රටේ නිපදවන ඇඳුම්වල මිළ පහත දමන්නට සිදු වන නිසායයි රාජ්‍ය ඇමතිතුමා කිව්වා. ඕකද තරඟකාරී තත්ත්වය? එතකොට ආණ්ඩුවේ සංස්ථාවකත්, සළුසලත්, පෞද්ගලික ව්‍යාපාරිකයන් අතර තිබෙන මේ තරඟකාරී තත්ත්වය තිබෙන්නේ මිල පහත දැමීමට නොවෙයි, පාරිභෝගිකයාට සාධාරණ මිලට හොඳ බඩු සැපයීමට නොවෙයි, පුළුවන් තරම් දුරට පාරිභෝගිකයා ගසා කෑමටයි. මෙය වැඩි පුර ලාබ ගැනීමට මිස පාරිභෝගිකයාට ලාබයක් ඇති වීමට ඉඩ සැලැස්වීමක් නොවන බව ඇමතිතුමාගේ කථාවෙන්ම හොඳ හැටි ඔප්පු වුණා.

අප කවුරුත් දන්නවා, කථානායකතුමනි, සතොස ආරම්භ කෙළේ 1943 දී බව. යුද්ධ ආදී හේතූන් නිසා ඒ කාලයේ මේ රටට බඩු ආනයනය කිරීම පිළිබඳව එක්තරා විධියක සීමාවක් කර තිබුණ නිසා ඒ භාණ්ඩ සාධාරණ ලෙස බෙදා හැරීම පිණිස සතොස ආරම්භ කළා. සමුපකාර සංගම්වලට බඩු සපයා ඒ මඟින් මහජනයා අතරේ සාධාරණ ලෙස බඩු බෙදා හැරීමේ පරමාර්ථය ඇතුවයි එය ආරම්භ කෙළේ. මෙම සතොස ව්‍යාපාරය 1956 දක්වා පවත්වාගෙන ගියේ පාඩු ඇතුවයි. අප ඒ ගැන දොස් කියන්නේ නැහැ. ඒ මොකද එසේ පාඩු වුණේ පාරිභෝගිකයාට පහසුකම් සැලැස්වීම නිසයි. එදා එසේ පාඩු සිදු වීමට හේතුව මොකක්ද? ඒ පාඩුව සිදු වුණේ පෞද්ගලික ව්‍යාපාරිකයා සමග තරග කරන්නට යෑමෙනුයි. දැන් නම් සළු සල කියන සමාගම පිහිටුවා තිබෙනවා. රජයේ මුදල් යෙදූ එවැනි සමාගම් ඒ කාලෙ තිබුණේ නැහැ.

1950 සිට සිදු වී ඇති පාඩු පිළිබඳ සංඛ්‍යා මා ළඟ තිබෙනවා. 1951දී රු. 6,28,845ක් පාඩුයි. 1952දී රු. 49,39,532ක් පාඩුයි. 1953දී රු. 47,18,006ක් පාඩුයි. 1954 දී රු. 18,68,678ක් පාඩුයි. 1955දී රු. 18,77,761ක් පාඩුයි. 1956දී පළමුවෙනි වරට රු. 1,31,341ක් ලාබයි. 1956දී පොදු ජන යුගයක් උදා වුණ කාල සීමාවක් බව තමුන්නාන්සේ දන්නවා ඇති. 1957 දීත් ලාබයි. ඒ අවුරුද්දෙ රු. 9,51,695ක් ලාබ ලබා තිබෙනවා. 1958දී රු. 45,705ක ලාබයක් ලැබී තිබෙනවා. 1959 දී නැවතත් පාඩුයි. තමුන්නාන්සේට මතක ඇති 1959දී බණ්ඩාරනායක අගමැතිතුමා ඝාතනය කිරීමෙන් පසුව තාවකාලික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ආණ්ඩුවක් ඇති වුණාට පස්සෙ නැවතත් වතාවක් හබන් කුකුළන් කැකුණ තළන්නට පටන්ගත් බව. 1959 දී අපේ දහනායක අගමැතිතුමා සිටින කාලයේදී ඒ ආණ්ඩුවේ වෙළඳ ඇමතිතුමාගේ හපන්කම් නිසා රුපියල් 3,86,194ක් පාඩු වුණා. 1958 දී රුපියල් 45,705 ක් ලාබ තිබුණත් 1959දී රුපියල් 3,86,194ක පාඩුවක් ඇති වුණා. 1960දී නැවත පොදු ජන යුගයක් උදා වුණා. ඒ අනුව සතොස ව්‍යාපාරයෙන් නැවතත් ලාබ ලැබෙන්නට පටන්ගත්තා. 1960දී රු. 20,57,468ක් ලාබ ලැබුණා. 1961දී රුපියල් 28,92,168ක් ලාබ ලැබුණා.

සතොස ව්‍යාපාරය අප ප්‍රයෝජනයට ගත්තේ කරුණු කීපයක් පරමාර්ථ කර ගෙනයි. සතොස එක්තරා විධියකින් සමුපකාර සංගම්වලට බඩු සැපයෙව්වා. ඒ වාගේම කල් යන්න යන්න විදේශ විනිමයට එක්තරා හානියක් ඇතිවීගෙන ආ අවස්ථාවේදී යම් යම් භාණ්ඩ ගෙන්වීම සීමා කරන්නට අපට සිද්ධ වුණා. විශෙෂයෙන් ආනයන භාණ්ඩ සීමා කළාට පසුව ආණ්ඩුවේ වගකීමක් ඇතිව ආණ්ඩුවේ සංස්ථාවක් මගින් බඩු ආනයන කරන්න සිදුවුණා. බඩු ආනයන කිරීම පමණක් ප්‍රමාණවත් නැහැ. මේ රජයේ ප්‍රතිපත්තිය වාගේ අපේ වෑයම වූයේ කොමිස් ඒජන්තවරුන්ගේ සාක්කු පිරවීම නොවෙයි. අපේ වෑයම වූයේ පාරිභෝගිකයා සනසන්නයි. ඒ නිසා අප සෑම ප්‍රයත්නයක්ම දැරුවේ ආනයන කරන ලද භාණ්ඩත් මෙහි නිපදවන ලද භාණ්ඩත් හොඳ තත්ත්වයකින් සෑම පාරිභෝගිකයාටම සාධාරණ මිලකට බෙදා දෙන්නයි. අප ඒ අදහස ඒ ලෙසම ක්‍රියාත්මක කළා. විශෙෂයෙන් 1960න් පසුව එක්තරා භාණ්ඩ කීපයක් ආනයනය කරන්නටත් තොග වෙළඳාම එක්තරා ක්‍රමයකින් කරගෙන යන්නටත් අප සතොස පාවිච්චි කළා. ඒ වාගේම සිල්ලර වෙළඳාමටත් බැස සාධාරණ මිලට හොඳ බඩු පාරිභෝගිකයාට ලබා දෙන්නට අප කටයුතු යෙදුවා. ඒ නිසා තමයි ස. තො.ස. සිල්ලර ශාඛා තැනින් තැන ඇති කරගෙන ගියේ. සිල්ලර ශාඛා ඇති කිරීමෙන් අප අදහස් කෙළේ පෞද්ගලික ව්‍යාපාරිකයා මරා දමන්නට නොවෙයි. ස. තො. ස. මගින් පෞද්ගලික සිල්ලර වෙළෙන්දාටත්, වැඩිය ලොකු තොග වෙළෙන්දාට නොව සාමාන්‍ය තොග වෙළෙන්දාටත් බඩු සපයා දුන්නා. ඒ වාගේම රජයේ ආයතනවලටත්, සමුපකාර සංගම්වලටත් බඩු සපයා දුන්නා. ස.තො.ස. ශාඛා ආයතන ඇති කිරීමෙන් අප අදහස් කෙළේ ඒ මගින් යම් යම් භාණ්ඩ වෙළඳ පොළේ තබා ඒවායේ සාමාන්‍ය මිල මෙපමණකැයි මහජනයාට දැනගන්නට සැලැස්වීමයි. ඒ අනුව කළු කඩයට තැනක් නැතිව ගියා. ස.තො.ස. ශාඛා හුඟක් තැන්වල විවෘත කිරීමෙන් ඇති වූ තත්ත්වයයි ඒ. ඒ නිසා, දේශපාලන වශයෙන් අපට විරුද්ධ උදවිය අපට විරුද්ධව විශාල විරෝධතාවක් නැංවුවා.

අප මෙම ශාඛා ආයතන ඇති කෙළේ පක්ෂ භේද වාදයෙන් තොරව බව තමුන්නාන්සේට මතක ඇති. යම්කිසි මන්ත්‍රීවරයෙක් තමන් නියෝජනය කරන පළාතට ස.තො.ස. ශාඛාවක් ඉල්ලුවා නම් අපි දුන්නා. මණ්ඩලයක්, ආයතනයක් ඉදිරිපත් වෙලා ඉල්ලා සිටියා නම් අපි ඒත් දුන්නා. එහෙත් එක්සත් ජාතික පක්ෂයෙන් එකක්වත් ඉල්ලුවේ නැති බව කනගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා. ඒ නිසා ඒ පළාත්වලට ලැබුණේ නැහැ. එහෙත් දැන් එකක් කියන්නට ඕනෑ. ඒක මගේ සන්තෝෂයට කාරණයක්. දැන් එක්සත් ජාතික පක්ෂයට ගිහිල්ලා ඉන්න අය ඒ කාලයේදී විවෘත කරන ලද ශාඛා තවමත් විවෘත වී තිබෙනවා. ඒවා වහන්නැයි කිසිකෙනෙක් ඉල්ලා සිටියේ නැහැ. වුවමනා කළා නම් ඒවාත් වහන්නට ඉඩ තිබුණා. ස. තො. ස ශාඛා ඇති කරන ලද්දේ පාරිභෝගිකයාට සාධාරණ මිලකට හොඳ තත්ත්වයේ භාණ්ඩ ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නටයි. ඒ අවසථාව දැන් නැති කර දමා තිබෙනවා. ඇයි එසේ කෙළේ ? මා මේ ආණ්ඩුව ගැන කණගාටුවෙන් කරුණක් කියන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂය පාරිභෝගිකයා සනසන්නට නොවෙයි මහන්සි ගන්නේ. මේ ආණ්ඩුව ධනපති ආණ්ඩුවක් නිසා නොයෙක් විධියේ පදබැඳ උත්සාහ කරන්නේ තමන්ට උදවු කළ ධනපති කණ්ඩායම්වලට යම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම් සහනවල් දෙන්නට පමණයි. ගරු රාජ්‍ය ඇමතිතුමා ගැන නම් අපට එක විධියකට සන්තෝෂ වන්නට පුළුවනි. එතුමා සමහර මන්ත්‍රීවරුන් ඇමතිවරුන් වාගේ එකක් කියා වෙනත් එකක් කරන්නේ නැහැ. එතුමා විශේෂයෙන්ම ගරු අගමැතිතුමා වාගේ එකක් කියා වෙන එකක් නම් කරන්නේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගරු අගමැතිතුමත් එහෙම තමයි. එතුමත් කියන එකම තමයි කරන්නෙ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ කාරණය කොයි තරම් දුරට සත්‍යද යන්න අපි දන්නවා. ගරු ආහාර ඇමතිතුමා වාගේ අයට ඒ තරම් ධෛර්යයක් නැහැ ඒක කියන්නට. ගරු රාජ්‍ය ඇමතිතුමා ක්‍රියා කරන්නේ ව්‍යාපාරිකයන් සන සන්නටයි. වෙළෙඳ ව්‍යාපාරිකයන්, කර්මාන්ත ව්‍යාපාරිකයන්, කොමිස් ඒජන්තවරුන් වැන්නන් වෙත වාසි ලැබෙන විධියට පත් කිරීම් කරනවා මිස පාරිභෝගිකයන්ට සැනසීමක් දෙන්නට නම් ඒ තරම් වෑයමක් කරන්නේ නැහැ. ඒ නිසයි සළු සල විවෘත කර රු. 1.55 ට තිබුණු රෙදි යාරය අද රු. 2.12 ක් වෙලා තියෙන්නේ. ස.තො.ස. ඔවා වික්කා නම් සමහර විට යාරය ශත දහයකින් පහළොවකින් වැඩි වන්නට මිසක් ඔය තරම් විශාල ප්‍රමාණයකින් වැඩි නොවන්නට ඉඩ තිබුණා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

"ෆීක්ස්"—FEECs—ගෙවනවා. "ඩිවැල්‍යුඒෂන්"—Devaluation—අනුව බලපෑම් ඇතිවෙලා තියෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒකත් මේ ආණ්ඩුවේම වැඩක් නොවැ. ඒක තමුන්නාන්සේත් අපිත් කවුරුත් දන්නවා. හෝටල් සංස්ථාව ගැන බැලුවත්, සංචාරක දෙපාර්තමේන්තුවට තිබුණු අයිතිවාසිකම් සංස්ථාවකට පවරා තිබෙන බව පෙනෙනවා. ඇතැම්විට ගරු රාජ්‍ය ඇමතිතුමා කල්පනා කරනවා ඇති සතොසේ තිබෙන මුදල් සංස්ථාවල සහ වෙනවෙනත් තැන්වල තැන්පත් කරන්නට. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කිව්වා වාගේ සතොසෙහි ලාබ නොයෙක් නොයෙක් ඒවායෙහි යෙදවීමට අපේ එතරම් විරුද්ධයක් නැහැ. එහත් එහි ලාබ ආයෝජනය කරන විට මහජනයාට නැතිනම් පාරිභෝගිකයාට වැඩි සේවයක් සිදු වන පිළිවෙළට කටයුතු කළයුතුයි. දැන් යෝජනා කර තිබෙන්නේ ලාබ මුදල් නොව තැන්පත් මුදල් ආයෝජනය කරන්නටයි. හෝටල් සංස්ථාව වැනි ඒවා ආයෝජනය කළ විට රටටවත් ජාතියටවත් සංස්කෘතියටවත් ආර්ථික තත්ත්වයටවත් එතරම් සේවයක් සිදු වේවිය කියා අපට බලාපොරොත්තු වන්නට බැහැ. ඒවායින් දළ ලාබ ප්‍රයෝජනයක් ලබාගෙන ජාතියක් වශයෙන් අපට සෑහීමකට පත් වන්නට නොහැකියි. සමහරවිට මා කී අන්දමේ අරමුදල් නැතුව සිටින ව්‍යාපාරවලට සතොසෙහි තැන්පත් මුදල් යෙදෙව්වොත් එම නිසා එක අතකින් සංස්ථාවත් සමග තරග කරන කණ්ඩායමක් බිහි වෙනවා. අනික් අතින් පාරිභෝගිකයාට යන්නට තිබෙන ලාබය නැති වෙනවා. ඔය අන්දමට බලන විට දෙපැත්තකින්ම පාඩු විඳින්නටයි සිදු වන්නේ.

සමහරවිට මේක හොඳ අතට පාවිච්චි කරන්නට පුළුවන්කම තිබෙනවා. සමහර විට අපට බලය ආවොත්—සමහරවිට නොවෙයි අපට බලය එනවාමයි—එසේ බලය ආවාම අපි මෙය වෙන විධියකට පාවිච්චි කරනවා. පුද්ගලික ව්‍යාපාරවල සියයට 51ක් ආයෝජනය කරන්නට අපට පුළුවනි. එසේ ආයෝජනය කර එම පුද්ගලික ව්‍යාපාරවලත් එක්තරා විධියක බල තල අපට ලබා ගන්නට පුළුවනි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒක හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

එහෙම කළොත් හොඳයි. රාජ්‍ය ඇමති තුමා සිය බලතල පාවිච්චිකොට ක්‍රියා කරන්නේ එසේ නොවෙයි. එතුමා තියෙන එකත් පාවා දෙනවා. සළුසළෙන් වුණේ ඒකයි. සංස්ථාවේ තිබුණු රෙදි වෙළ ඳාම කොම්පැනියකට භාර දීලා ඒ අයට මුදලුත් දීලා ගණනුත් නංවලා තමන්ට ඇති අයිතිවාසිකමුත් නැති කර ගන්නවා. දැන් ඒ සමාගමේ පිටිපස්සෙන් යන්නට සිදු වී තිබෙනවා, යම් ප්‍රශ්නයක් පාර්ලි මේන්තුවේදී ඇසූ විට එම ප්‍රශ්නයට උත් තර දෙන්න මට අවසර තිබෙනවාදැයි අසමින්. ඉස්සර ඔහොම තත්ත්වයක් තිබුණේ නැහැ. ඕනෑම ප්‍රශ්නයකට උත් තර දෙන්නට ඇමතිතුමාට සම්පූර්ණ බලතල තිබුණා. දැන් එම බලතල නැහැ. දැන් එහි අධිකාරිතුමාගෙන් අවසර ලබා ගන්නට සිදු වී තිබෙනවා. ඒ අනුව එතුමා පාර්ලිමේන්තුවේ තත්ත්වයත් පහළ බස්සා තිබෙනවා. මහජන මුදල් පවා ආයෝජනය කළ මණ්ඩලයකින් අවසර ගත යුතු වුණා, පාර්ලිමේන්තුවේදී කථා කිරීමේ නිදහස ලබා ගන්නට. එසේ වන් නේ ධනපති ක්‍රමයේ තිබෙන වරද නිසයි. පාරිභෝගිකයාට සේවය කිරීම සඳහා තමන්ගේ බලතල පාවිච්චි කරන්නට රාජ්‍ය ඇමතිතුමාට පුළුවන් කම තිබිය යුතුයි. එහෙත් දැන් කර තිබෙන කටයුතු වලට අනුව පෙනී යන්නේ පාරිභෝගිකයා ගේ තත්ත්වය තවදුරටත් නරක අතට හැරී තිබෙන බවයි. එහෙත් කුමන්ත්‍රණ ආදියට අසුවුණු තමන්ට හිතවත් පුද්ගල යන් සමග බැඳීම් තිබෙන නිසා ඔවුන්ට පාරිතෝෂික මුදල් වශයෙන් අනියම් විධි යට මුදල් දීමටත් මෙය මාර්ගයක් කර ගෙන තිබෙන බවයි පෙනෙන්නේ.

කරවල වෙළඳාමත් සංසථාවට භාර දෙන වාලු. එයින් වන්නේ නැවතත් අර නොයෙ කුත් අනියම් ක්‍රමවලට කටයුතු කිරීම වැඩි වීමයි, මේ රටේ තිබුණු නොයෙකුත් භාණ්ඩ පිටරට යවා උංඩියාල් ක්‍රමය තවදුරටත් වලංගු කරගෙන පිටරටින් රත්‍රන් ආදිය නැවතත් ගෙනෙන්නට ඉඩ හැරීමයි, මහ ජන සංස්ථාවක් වශයෙන් තිබුණු බලතල වෙන එකකට භාර දී ආර්ථික තත්ත්වයේ නුත් හානියට පත් වීමයි. එම නිසායි විශේෂයෙන් මෙම රජය මගින් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවලට එකඟ වන්නට අපට නොහැකි වන්නේ. ඒවා ගේම රාජ්‍ය ඇමතිතුමාට එක කාරණයක් මතක් කර දෙන්නට සිදු වී තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි, දැන් සතොසේ සේවකයන් විශාල අසහනයකින් කල් ගත කරන බව. මෙයට පෙර මා පෙන්නා දුන්නා වාගේ, 1965 මැතිවරණ කාලයේදී තමුන්නාන් සේලා කීවේ රජයේ සේවකයන්ට දේශ පාලන අයිතිවාසිකම් දෙනවාය කියා නොවෙද? එය තමුන්නාන්සේලා දුන් පොරොන්දුවලින් එකක්. බලපිටියේ අතුරු මැතිවරණයේදීත් එබඳු පොරොන්දු වක් දුන්නාද මා දන්නෙ නැහැ. නමුත් හැටපහේ මැතිවරණයේදී නම් තමුන් නාන්සේලා රජයේ සේවකයන්ට එබඳු පොරොන්දුවක් දුන් බව මතක් කර දෙන්න කැමතියි. ඒ ආකාරයට රජයේ සේවකයන්ට ප්‍රතිඥ දුන්නත් දැන් තමුන්නාන්සේලා සතොසේ සේවක යන් මෙතෙක් කල් භුක්ති විඳි අයිතිවාසි කම් පවා පැහැර ගෙන තිබෙනවා. සමහර විට රාජ්‍ය ඇමතිතුමා කියාවි එය අපේ කාලයේ කළ දෙයක්ය කියා. 1959 දහනා යක අගමැති කාලයේදී කළ යෝජනාවක් දැන් ක්‍රියාත්මක කර තිබෙනවා. ගරු කථා නායකතුමනි, සියලුම රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දෙනවාය කියා මහජන ඡන්දය ලබාගෙන දැන් තිබෙන අයිතිවාසිකම් පවා නැති කර දැමීමට කටයුතු කරනවා.

විදුලි බල මණ්ඩලයක් පිහිටුවීම පිළිබඳ විවාදයේදී ගරු ඇමතිතුමා සඳහන් කළා, දැනට විදුලි දෙපාර්තමේන්තුවේ සේවක යන් භුක්ති විඳගෙන ආ අයිතිවාසිකම් ඉදිරි යටත් භුක්ති විඳීමට හැකි වන පරිදි සංශෝධන ඉදිරිපත් කරනවාය කියා. නමුත් එබඳු පොරොන්දු කොයි තරම් දුරට ක්‍රියාත්මක වනවාද කියන කාරණය නැත අප ඒයේ විග්‍රහ කළා.

ගරු කථානායකතුමනි, සතොස සම් බන්ධයෙන් ගෙන ඇති පියවර කුමක්ද? 1965 අවුරුද්ද වන විට සතොසේ සේවක යන්ට තිබුණු දේශපාලන සහ වෘත්තීය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයිතිවාසිකම් සියල්ලක්ම මේ ආණ්ඩුව බල යට පැමිණියාට පසුව පැහැර ගෙන තිබෙනවා. එම නිසා ඒ කොටස් තුළ විශාල අසහනයක් දැන් පවතිනවා. ඒ හැර තමාගේ සේවය කොයිතරම් දුරට ස්ථිරද යන්න ගැන විශාල සැකයක් එම සේවකයන් තුළ අද පවතිනවා. සළුසල වාගේ තවත් කොටස්වලට මෙම සංස්ථාව කඩන්න ගියොත් ඒ අයගේ අනාගතය අවිනිශ්චිත තත්ත්වයකට වැටෙන්න පුළුවනි. දැනට කරවල වෙළඳාම තවත් සමාගමකට භාර දෙන්න යනවා. ඒ වාගේම ජපන් රටින් වාහන ආනයන කිරීමට දී තිබුණු අවසරය පෘෘඩන්බර්ග් සමාගමට පවරා තිබෙනවා. සතොසේ මාර්ගයෙන් අප රටට ආනයන කළ ඇතැම් දේවල් ආනයන කිරීමට උත්තර මන්ත්‍රීවරයකුට ඉඩ දී තිබෙනවා. මේ අන්දමට පාරිභෝගිකයන්ගේ ප්‍රයෝජනය පිණිස යෙදිය යුතු සතොසේ තැන්පත් මුදල්, ලාභ මුදල් තමන්ගේ හිතවතුන්ගේ සාක්කුවලට යැවීමේ ක්‍රමයකට දැන් මග පාදා දී තිබෙනවා.

මේ අන්දමේ ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම නිසා සතොසේ සේවකයන් තුළ විශාල අසහනයක් ඇති වී තිබෙනවා. ඒ අයට කුමක් සිදු වෙත්දැයි යන භයක් තිබෙනවා. සමහර විට කරවල මුදලාලි කෙනෙකුගේ අතවැසියකු වන්නට පුළුවනි; ඒ සේවකයන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ යටතට පත් වන්න පුළුවනි. විදේශීය කොම්පැනිවලට පැවරෙන අන්දමට පනත් සකස් කර, ඒ අයට භාර දුන්නාම මෙම සේවකයන්ට සිදු වන්නේ මොකක්ද? මෙබඳු භයකින් ඔවුන් පෙළෙනවා. සතොසේ යම් යම් අංශ පෞද්ගලික ව්‍යාපාරිකයන්ට භාර දෙන විට එම අංශවල සිටින සේවකයන්ගේ සේවයෙහි සුරක්ෂිතතාවක් තිබෙන බවට මේ වන තෙක් ප්‍රතිඥාවක් දී නැහැ.

ඒ වාගේම අප දන්නවා සතොසේ තිබෙන දූෂණ කටයුතු ගැන. සමහර විට තමුන්නාන්සේත් දන්නවා ඇති, මා දන්නා හැටියට විශ්‍රාම ලත් උප පොලිස් අධිකාරිවරයකු ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ලෙස පත් කළ බව. ඇතැම් පත්‍රවල මේ ගැන නොයෙක් විධියෙන් විවේචනය කළා. එවැනි පුද්ගලයෙක් ඉදිරිපත් වුණත් වැඩි කල් කර ගෙන යන්න බැරි වුණා. ඔබතුමා ඒ පුද්ගලයා ගෙන්වා යම්කිසි පරීක්ෂණයක් කළොත්, ඔබතුමාට විශාල රහස් රාශියක් දැනගන්න පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. එතුමා අස්වගියේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, සතොසේ මහතැන්වල කෙරෙන දූෂණ ගැන පෙනෙන විට ඉවසා ගෙන සිටින්න බැරි නිසයි. එවැනි දේවල් මතු කර පෙන්වන නිලධාරීන්ට දඬුවම් කරනවා විනා, වැරදිකරුවන්ට දඬුවම් කිරීමක් නොකරන නිසයි එතුමා අයින් වුණේ. මෙන්න මේ වගේ තත්ත්වයකුයි තිබෙන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Sitting is suspended for 30 minutes.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.*

*அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, මා කතා කරමින් සිටියේ සතොස සේවකයින්ට මුහුණ පාන්නට වී තිබෙන අසහනය ගැනයි. ඊට පෙර මා කියන්න යෙදුනේ සතොසේ තිබෙන තැන්පත් මුදල් පෞද්ගලික ආයතනවල යෙදවීමෙන් පාරිභෝගිකයාට කිසිම සහනයක් නොවන බවත්, මහජන මුදල්වලට වාසියක් නොවන බව හා ආණ්ඩුවට හිතවත් උදවියට කුළුපග බවක් දැක්වීමට පමණක් එය පාවිච්චි කරන්නට පුළුවන් බවයි.

ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් එතුමා හෙළි කරන්නට යෙදුනා, සතොස ශාඛා සමුපකාර සංගම්වලට භාර දෙන්නය කියා ලොකු උද්ඝෝෂණයක් තිබෙනවාය කියා. අපි රජය කරන කාලයේදී බඩුවල මිල පහත හෙළීම පිළිබඳව කටයුතු කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
කමිටුවක් ඇති කර තිබුණා. එම කමිටුවේ වාර්තාවෙන් අපට නිර්දේශ කර තිබුණා, පාරිභෝගිකයාට නියම මිලට හොඳ බඩු සපයන්න නම් සතොස ශාඛා තව තවත් විවෘත කිරීම පමණක් නොව, සමුපකාර සංගම්වල වෙළඳ ව්‍යාපාර සතොසට භාර දීමත් කරන්නය කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තොග වෙළඳාම.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
සමුපකාර සංගම්වල ව්‍යාපාර. සමුපකාර සමිති මගින් කරන්නේ සිල්ලර වෙළඳාමයි. සිල්ලර වෙළඳාම කර ගෙන ගියේ සමුපකාර සමිති විසිනුයි. තොග වෙළඳාම කර ගෙන ගියේ සමුපකාර සංගම් මගිනුයි. එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණේ, සමුපකාර සංගම්වලට තිබෙන වෙළඳ ව්‍යාපාර සතොසට භාර ගන්නය කියායි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තොග වෙළඳ ව්‍යාපාර පමණයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
සමුපකාර සංගම් මගින් කරන්නේ තොග වෙළඳ ව්‍යාපාරයි. සිල්ලර වෙළඳාම කරන්නේ සමුපකාර සමිති මගිනුයි. සමුපකාර සංගම්වල තිබෙන ව්‍යාපාර සතොසට භාර ගන්නය කියායි වාර්තාවෙන් කියා තිබුණේ. ගරු රාජ්‍ය ඇමතිතුමා දැන් සතොස වෙළෙඳාම සමුපකාර සමිතිවලට භාර දෙන්නට ක්‍රියා කරනවා. සතොස සතු තොග වෙළෙඳ අයිතිවාසිකම් සමුපකාරවලට භාර දෙන්නට ඕනෑලු.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
සිල්ලර වෙළඳාම.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
සමුපකාර සමිති සිල්ලර වෙළෙඳාම කර ගෙන ගියා. පෞද්ගලික වෙළෙඳුන්ට සිල්ලර වෙළෙඳුන්ට, සමුපකාර සංගම්වලට හා සමුපකාර සමිතිවලට, රජයේ දෙපාර්තමේන්තුවලට බඩු සැපයුවේ සතොසයි. මේ හැර අප බලයේ සිටින කාලයේදී පාරිභෝගිකයන්ට තව තවත් පහසුකම් සැලැස්වීම සඳහා මහාදේව කමිටුව නිර්දේශ වගයක් කර තිබුණා. ඒ අනුව සතොස තවත් ව්‍යාප්ත කළ යුතුව තිබුණා. දැන් රාජ්‍ය ඇමතිතුමා වෙනත් දෙයක් නිර්දේශ කර තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කිසි දෙයක් නිර්දේශ කර නැහැ. ඒක මගේ අදහසයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
විශේෂඥයන් වශයෙන් සැලකුණු රජයේ සේවකයන් අප වෙත නිර්දේශ වගයක් ඉදිරිපත් කළා. එහෙත් අප ඒවා සම්පූර්ණයෙන්ම භාර ගත්තේ නැහැ. දක්ෂ විධියට සේවය කරගෙන ආ සමුපකාර සංගම්වලට ඒ අන්දමටම කටයුතු කරගෙන යන්නට අප ඉඩ හැරියා. අදක්ෂ විධියට වැඩ කර ගෙන ගිය සමුපකාර සංගම් සම්බන්ධයෙන් මැදිහත් වී ක්‍රියා කළා. රජයේ ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට කටයුතු කළා. අප ඒ නිර්දේශ ක්‍රියාත්මක කෙළේ අන්න ඒ විධියටයි. දැන් රාජ්‍ය ඇමතිතුමා තමාගේම ප්‍රතිපත්ති උඩ සමහර විට මහාදේව කමිටුවේ නිර්දේශ ප්‍රතික්ෂේප කර ඇති. එතුමා ක්‍රියා කරගෙන යන්නේ සතොස ශාඛා සමුපකාර සංගම්වලට භාර දෙන්නටයි. සතොස ශාඛා, සමුපකාර සංගම් හා සමිති, පෞද්ගලික ව්‍යාපාර, රජයේ වෙනත් වෙළෙඳ ව්‍යාපාර ආදී මේ සියල්ලක්ම යොදවා අප උත්සාහ කෙළේ මහජනයාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුවන් තරම් අඩු මිළට බඩු සපයන්න ටයි. පාරිභෝගිකයන්ට අඩු මිළට බඩු සපයනවා නම් මොන අංශයෙන් ඒ කටයුත්ත සිදු වුණත් කමක් නැහැ. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ මොකක් ද? මේ ආණ්ඩුව සලුසලට මුදල් ආයෝජනය කළා. වෙනත් සංස්ථාවලට මුදල් ආයෝජනය කළා. එහෙත් ඒ ආයතනවලින් පාරිභෝගිකයන්ට සෙතක් සැලසී තිබෙනවා යයි කියන්නට බැහැ. වාසි සැලසී තිබෙන්නේ පාරිභෝගිකයන්ට නොව ව්‍යාපාරිකයන්ටයි. සළුසල ඊට උදාහරණයයි. කලින් රුපියල් 1.55ට තිබුණු රෙදි යාරය දැන් රුපියල් 2.12 දක්වා නැග තිබෙනවා. විවිහිස ක්‍රමය නිසා මෙසේ මිළ වැඩි වී ඇති බව රාජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා. විවිහිස ක්‍රමය අනුව වුණත් මේ වැඩි වී තිබෙන මිළ අධිකයි.

සේවක අසහනය ගැන කථා කරන විට "සමුපකාර සංගම් ඒ ව්‍යාපාර පවරා ගන්නට කැමති වුණත් සේවකයන් භාර ගන්නට කැමති නැත" යනුවෙන් කියනවා. මේ තත්ත්වය නිසා දැන් විශාල අසහනයක් තිබෙනවා. මා මේ කරුණු මීට පෙරත් ඉදිරිපත් කර ඇති.

මේ රජය විසින් අනුමත කරන ලද කොන්දේසි උඩයි සතොස පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා කොමිෂන් සභාවක් පත් කරන්නට යෙදුණේ. දැන් සතොසේ වැඩ අනුව බලන විට නම් කලින්ට වඩා 10 ගුණයකටත් වැඩි දූෂණ ප්‍රමාණයක් හෙළි වන්නට ඉඩ තිබෙනවා. පිටවෙලා ගියේ මන්දැයි ජුසේ මහතා වැනි අයගෙන් ඇසුවොත් හොඳ හොඳ දේවල් දැන ගන්නට පුළුවන් වේවි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ගියේ වයස සම්පූර්ණ වෙලා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සේවයට ගත්තේ වයස සම්පූර්ණ වුණායින් පසුව නොවැ? වැඩ කරන්නට බැරියයි කියමින් යන්නට ගියේ දූෂණ පේන්නට බැරි නිසයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සේවය දික් කරන්නැයි මගෙන් ඉල්ලා සිටියා. අවුරුද්දක් සේවය දික් කරලත් තිබුණා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔබතුමා කියන දේ විශ්වාස කළ යුතු නොවැ. කෙසේ වුණත් පෞද්ගලික වශයෙන් මුණ ගැසී බැලුවොත්——

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එක එක්කෙනා කියන දේවල් අහන්නට එපා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

එය අප දෙගොල්ලම අනුගමනය කරනවා නම් හොඳයි. ඒ කෙසේ වෙතත් මා කියන්නට ගියේ මෙයයි: විශාල චෝදනාවක් තිබුණේ සේවකයින් බඳවා ගැනීම ගැනයි. එවැනි නොයෙකුත් චෝදනා උඩයි කොමිෂන් සභාවක් පත් කළේ. ඒ නිස අප එන්නට පළමු තමුන්නාන්සේලාගේ අත් හොඳට සුද්ධයි කියා ඔප්පු කරන්නට නම් අර කොන්දේසි උඩම කොමිෂන් සභාවක් පත් කර තමන්ගේ නිර්දෝෂී භාවය ඔප්පු කරන්නය කියා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ විධියට ස. තො. ස. තිබෙන තැන්පත් මුදල් ආයෝජනය කර 1962 කුමන්ත්‍රණයට අසු වූ තමන්ගේ කුළුපග මිත්‍රයන්ට සළුසලේ රක්ෂාවල් දී තිබෙනවා. මාසික පඩිය රුපියල් දෙදාස් පන්සියයයි; තුන්දාහයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පෙරළන්නට කුමන්ත්‍රණය කර ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වැරදිකාරයා වූ පුද්ගලයකුට මේ ආණ්ඩුවේ ආශීර්වාදයෙන් සළුසලේ අධිකාරීකමක් ලැබුණා. පඩිය රු. 2,500 යි;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

නැත්නම් රු. 3,000යි. කුමන්ත්‍රණකාර යෙක් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විත්තිකාරයා කළ පුද්ගලයෙක් රජයේ මුදල් අයෝජනය කර ඇති හෝටල් සංස්ථාවේ සේවය කරනවා. ඔහුගේ පඩිය රු. 4,000යි. තමුන්නාන්සේලා ප්‍රජා තන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ගොස් ප්‍රජාතන්ත්‍රවාදී අණ්ඩුවක් පෙරලීමට කුමන්ත්‍රණය කළ පුද්ගලයින්ට මේ විධි යේ විශේෂ වරප්‍රසාද දීමෙන් තමුන් නාන්සේලාගේ ඇති දූෂණ තවත් එළි වෙනවා. ඒ නිසා අර කොන්දේසි උඩම කොමිෂන් සභාවක්—තමුන්නාන්සේ ලාගේ එහෙයියන් නොවෙයි—මේ සභාව විසින් මේ සභාවෙන්ම පත් කර තමුන් නාන්සේලා යන්නට කලින් එහි වාර්තාව ඉදිරිපත් කරන්නය කියා මා ගරු රාජ්‍ය ඇමතිතුමාට අභියෝග කරනවා.

අ. භා. 4.40

**ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)**

*(கௌரவ ஹியூ பெர்னாண்டோ— வர்த்தக, வியாபார அமைச்சர்)*

(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී කථා කරනන්ට මගේ බලාපොරොත්තු වක් තිබුණේ නැහැ. එහෙත් හිටපු ඇමති වරයෙක් මීට කලින් කථා කළ නිසා එයින් පැනනැඟුණු ප්‍රශ්න කීපයකට පම ණක් පිළිතුරු දීමට මා බලාපොරොත්තු වෙනවා. ගරු කොළොන්නාවේ මන්ත්‍රී තුමාගේ (ඉලංගරත්න මයා.) කථාවේදී කියන්නට යෙදුණා වර්තමාන සමුපකාර තොග වෙළඳ ආයතනය හා එතුමා වෙළඳ ඇමති කාලයේ තිබුණු සමුපකාර තොග වෙළඳ ආයතනය සන්සන්දනය කර බලන විට විශාල පරතරයක් තිබෙනවාය කියා. එය අපිත් පිළිගන්නවා. දැන් අපි "කොමිෂන් ඒජන්ට්ලා" පත් කර සිටින වාය කියා එතුමා විසින් කියන්ට යෙදුණා. මා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ගෙන් අහනවා, එතුමා වෙළඳ ඇමති ධුරය දරන කාලයේදී සමාජවාදී රටවල් සමග බඩු වෙළහෙළඳාමට කොමිෂන් ඒජන්ත වරුන් පත් කර ගත්තාද නැද්ද කියා. ඒ කාලයේ ලංකාව ගිවිසුම් ඇති කර ගත්තේ සමාජවාදී රටවල් සම ගයි. එසේ සමාජවාදී රටවල් සමග සීනි වැනි දේවල් ගනුදෙනු කරන අවස්ථාවේදී "කොමිෂන් ඒජන්ට්ලා" සිටියාද නැද්ද කියා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ගෙන් මා කෙලින්ම අහනවා. සමාජවාදී රටවල පෞද්ගලික අංශයක් නැහැ. ගනු දෙනු කරන්නේ ආණ්ඩුවත් සමගයි. එහෙත් එවකට සිටි ගරු ඇමතිතුමාට ඉඩ දුන්නා ලංකාවේ හිතවතුන්ට "කොමිෂන් ඒජන්ට්ලා" හැටියට වැඩ කරන්නට. කවුද කියා මා නම් කියන්නේ නැහැ. මේ ප්‍රශ්නය පාලිර්මේන්තු කණ්ඩායමේදී ඉදිරිපත් වුණා. එවකට මාත් එම පාර්ලි මේන්තු කණ්ඩායමට අයත් වූ කෙනෙක්. ඒ අවස්ථාවේදී එතුමා මට පොරොන්දු වුණා එය නතර කරනවාය කියා. එහෙත් 1964 වන තුරුත් එය නතර නොවුණු බව මා මතක් කරන්නට කැම තියි.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, සීනි වෙළඳාම කළේ රජය විසින්. මා නියෝගයක්, චක්‍ර ලේඛනයක් හා ඉල්ලීමක් ඒ ඒ රටවල නියෝජිතයින්ට යැව්වා ආණ්ඩුව විසින් ආනයනය කරන මොනම දේකටවත් කිසිම කෙනෙකුට කොමිෂන් එකක් දෙන්නට එපාය කියා. කොමිෂන් එකක් දිය යුතු නම් එය රජයට දෙන්නය කියා මා නියම කළා. ඒ හැර කොමිෂන් සම් බන්ධයෙන්වත් කොමිෂන් ඒජන්ත වරුන් සම්බන්ධයෙන්වත් කිසිම සම් බන්ධකමක් හෝ කිසිම දැනගැනීමක් මට තිබුණේ නැහැ.

**ගරු හියු ප්‍රනාන්දු**

*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*

(The Hon. Hugh Fernando)

තමුන් ඒජන්ට්ලා හිටි බව පිළිගන්න වාද ?

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

නැහැ. මා එය පිළිගන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
හොඳයි ඒ කාලයේ තිබියේ නැතෙයි කියනවාද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
දන්නේ නැහැ. ගරු කථානායකතුමනි—

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
නොදන්නා එක වෙනම ප්‍රශ්නයක්. මට ඕනෑ කරන්නේ ඒ ඒ ආණ්ඩු තමුන්නාන්සේලාගේ නියෝගය පිළිගත්තාද නැද්ද කියන එක නොවෙයි. ඒ ආණ්ඩුව සමාජවාදී රටවල් සමග ගනුදෙනු කරන කාලයේදී කොමිෂන් ඒජන්ට්වරුන්ට අවස්ථාවක් තිබුණු එකයි මගේ තර්කය. ගරු කථානායකතුමනි, මා ඊට වඩා ඒ සම්බන්ධව කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒක ටිකක් පැහැදිලි කරන්නට ඕනෑ. සමහර භාණ්ඩ ආණ්ඩුව ආනයනය කළා. එසේ ආණ්ඩුව බඩු ආනයනය කළාට ඒ ඒ රටවල් ඒ බඩු අපනයනය කළේ ඒ අයගේ ඒජන්තවරුන් ලවායි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
මා කියන්නෙත් ඒක තමයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
එමනිසා මා ඒ රටවලින් ඉල්ලීමක් කළා. ආණ්ඩුව ආනයනය කරන භාණ්ඩවලට කරුණා කර කිසිම කෙනෙකුට කොමිෂන් එකක් දෙනන්ට එපාය කියා මා ඉල්ලීමක් කළා. ඊට වැඩිය මට කරන්නට දෙයක් තිබුණෙ නැහැ. ඇමතිතුමා වශයෙනුත් ඒ වාගේම ආණ්ඩුවක් වශයෙනුත් අපට කරන්නට තිබුණේ ආණ්ඩුව ආනයනය කරන භාණ්ඩ වෙනුවෙන් කිසිම කෙනෙකුට කොමිෂන් එකක් දෙන්නට එපාය කියා නියම කිරීම පමණයි. එපමණයි අපට කළ හැකිව තිබුණේ. නමුත් ඒ අය නොයෙක් දේවල් කරනවා. නොයෙක් කථා තිබෙනවා. ඒ කාලයේත් තිබුණා ; දැනුත් තිබෙනවා. ආණ්ඩුවේ පිටරට සිටි නියෝජිතවරුන් කාර් දෙක තුන මෙහාට ගෙනාවාය, ආදී වශයෙන් නොයෙක් කථා තිබෙනවා. ඒවා වළක්වන්නට අපට බැහැ.

ඒ කාලයේ අප කළ නියෝගය ඒකයි. එපමණක් නොවෙයි. නොයෙකුත් ආයතනවල සිටි අධ්‍යක්ෂවරුන්ට ඒ අධ්‍යක්ෂකම් කරන ආයතන සහ සංස්ථා සමග ව්‍යාපාරවල යෙදී සිටිනවා නම් ඒවායින් අස් වෙන්නටය කියා මා චක්‍ර ලේඛනයක් මගින් තවත් නියෝගයක් කළා. මා එවැනි නියෝග පවා නිකුත් කර තිබෙනවා. ගරු වෙළඳ ඇමතිතුමා මට විරුද්ධව චෝදනාවක් එල්ල කිරීම ගැන මා පුදුම වෙනවා. දැන් ප්‍රොයිඩන් බර්ග් සමාගම කොමිෂන් ගන්න බව අප දන්නවා. භාණ්ඩාගාර වශයෙන්—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The hon. Member wanted to make a personal explanation, and I allowed him to do so. I cannot allow him to make a speech. He only wanted to make a personal explanation.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
He has finished now, Sir, and I have understood him.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
සමාජවාදීන් හෝ වේවා ධනපති හෝ වේවා යම් යම් ආණ්ඩුවල වෙළඳ ක්‍රමයක් තිබෙනවා. ඒ ඒ රටවල වෙළඳ ක්‍රමය අනුව යම් යම් උදවියට කොමිෂන් දෙනවා ඇති. ඒවා ගැන මා දන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

ඒක තමයි මමත් කියන්නෙ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

නමුත් රජය ආනයනය කරන භාණ්ඩ වලට කොමිෂන් දෙන්නට එපාය කියා අපට කියන්නට පුළුවනි; නියම කරන්නට පුළුවනි. දැන් ප්‍රොසිඩන්බර්ග් සමාගම කොමිෂන් ලබා ගනිමින් භාණ්ඩා ධාරත් මෙහාට ගෙන්වනවා. අගමැතිතුමාට හෝ රාජ්‍ය ඇමතිතුමාට හෝ ඒක වළක්වන්නට බැහැ. මක්නිසාද? ඒ අය ඒජන්තවරුන් නිසයි. ඒවගේම ජපානයෙන් සහ නොයෙක් රටවලින් ලංකාවට බඩු ආනයනය කරනවා. භාණ්ඩාධාර වශයෙනුත් රජය බඩු ආනයනය කරනවා. ඒවාට කොමිෂන් දෙනවා නම් ඒක වළක්වන්නට බැහැ. රජය ආනයනය කරන භාණ්ඩ වෙනුවෙන් කරුණා කර කොමිෂන් දෙන්නට එපාය, එවැනි කොමිෂන් මුදලක් දෙනවා නම් ඒ මුදල එක්කෝ රජයට දෙන්න, නැත්නම් දෙන ආධාර මුදලින් ඒ මුදල අඩු කරන්න කියා අපට කියන්නට පුළුවනි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට මා චෝදනාවක් කළේ නැහැ. නමුත් එතුමා කියා සිටියේ කොමිෂන් ඒජන්තකම් තිබෙන්නේ මේ වර්තමාන යුගයේය යන්නයි. මා ඊට පිළිතුරු වශයෙන් කියන්නේ එතුමාගේ පාලන කාලයේදීත් මේ තත්ත්වයම තිබුණාය යන්නයි. මා චෝදනාවක් කළේ නැහැ. නමුත් එතුමාගේ පැහැදිළි කිරීමේදී ඉංග්‍රීසියෙන් "හින්ට්ස්" කියන ඒවාත් පාවිච්චි කළා. නානාපතිවරුත් මේ භාණ්ඩ ගෙනෙනවාය කියා එතුමා කිව්වා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා චෝදනාවක් කරනවා නම් මීට වඩා කොඳු ඇටය ටිකක් කෙලින් තබා ගෙන කථා කළයුතුය කියා මා සිතනවා. කොඳු ඇටය කෙලින් තබා ගෙන කථා කරනවා නම් එතුමාට කියන්නට තිබුණේ පකිස්ථානයේ හිටපු කොමසාරිස්තුමා ලංකාවට එද්දී කාර් දෙකක් ගෙනාවාය යන්නයි. හැංගි හොරා කථා කරන්නට එපා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! I quite agree with the Hon. Minister. I have already said that Members should not make any accusations against other Members.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

I have the right to bring any number of cars. I am not getting cars free; I am obtaining them with my own money. I was High Commissioner for Ceylon in Pakistan, and with my savings I was able to bring a car. I am able to bring any number of cars.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I have already told hon. Members not to make accusations against other Members. There was a distinct insinuation. I think it is unfair. I request hon. Members to be fair by other Members. They are not being fair by them when they make insinuations.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

I am sorry if I made such an insinuation.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

එතුමා තවත් දෙයක් කීවා. කුමන්ත්‍රණ නඩුවට අසු වුණු අය මේ රජයේ යම් යම් තනතුරුවලට පත් කර තිබෙනවාලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකාව විසින් පිළිගනු ලැබූ රාජාධිකරණයෙන් ඒ අය නිදහස් කළා. මා එහි හොඳ නරක ගැන කියන්න යන්නේ නැහැ. මා කියන්නේ අද රටේ බලපවත්වන නීතියේ තත්ත්වයයි. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) පවා ඇපැල් නඩුවලට පෙනී සිට විත්තිකරුවන් නිදහස් කරගෙන තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වැරදිකරුවන් වන අය ඇපැල් උසාවියෙන් නිදහස් වූ පසුත් ඔවුන් වැරදිකරුවන් විධියට සලකා කොන් කරන සිරිතක් නැහැ. විරුද්ධ පාර්ශ්වයේ නීතිඥ මහතුන්ට නම් රාජාධිකරණයට යන්න ලැබෙන්නේ නැතුවා වන්නට ඇති. සමහර විට තව අවුරුදු 100 කින් පසුව යන්නට ලැබේවි. එහෙත් කලින් සඳහන් කළ පුද්ගලයන් රාජාධිකරණයෙන් නිදහස් කර තිබෙනවා. මා ඔවුන් නිදොස් කරන්නට කථා කරනවා නොවෙයි.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් කියවුණේ, නිදොස් වුණත් කැළැල් ඇති අය මෙවැනි තනතුරුවලට පත් කිරීම හොඳ නැති බවයි. තත්ත්වය පැහැදිලි කිරීම සඳහා පෞද්ගලික දෙයක් කියන්නට සිදු වීම ගැන මට සමා වන්න. මේ පාර්ලිමේන්තුවේ අසුන් ගත යුත්තේ නොකැළැල් චරිතයෙන් හෙබි, අවංක පුද්ගලයන් බව මා මෙන්ම කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් පිළිගන්නවා ඇති. වැරදිකරුවන් හැටියට උසාවි වලින් හංවඩු ගැහුණු අය පාර්ලිමේන්තුවේ සිටීම හොඳ නැති බව, සමහර විට කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා මා තරම් පිළිගන්නේ නැතිව ඇති. වර්තමාන ගරු අගමැතිතුමා විරුද්ධ පාර්ශ්වයේ නායකයා වශයෙන් කටයුතු කළ කාලයේදී, ඒ වගේ අය පාර්ලිමේන්තුවෙන් නෙරපීමට යෝජනාවක් ගෙනා අවස්ථාවේදී මා ඊට පක්ෂව ඡන්දය දුන්නත්, කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ඊට විරුද්ධව ඡන්දය දුන්නා. ඒක එහෙම ගියාවේ.

1967 නාත්තණ්ඩියේ අතුරු මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් කළ අපේක්ෂකයා පිළිබඳව උසාවියෙන් දුන් නඩු තීන්දුව කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කියවන්නට ඇති. හබරාදුවේ ගරු මන්ත්‍රීතුමාත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) එය දැන ගැනීම හොඳයි. මා හිතන හැටියට එතුමාත් ඒ නඩුවට කථා කළා. ඒ අපේක්ෂකයා කම්කරු අර්ථසාධක මුදල් වංචා කළ කෙනකු බව එහි සඳහන් වෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
කවුද? මා දන්නේ නැහැ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னண்டோ)*
**(The Hon. Hugh Fernando)**
ප්‍රෝටස් තිසේරා. ඔහු ස්ත්‍රීන් දූෂණය කළ පුද්ගලයෙක්; කම්කරු අර්ථසාධක මුදල් සම්බන්ධයෙන් රජයට හොර වාර්තා ඉදිරිපත් කළ පුද්ගලයෙක්. භය නැතිව ඒ බව එළිපිට කියන්නත් කැමැතියි. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා, එවැනි පුද්ගලයකු පාර්ලිමේන්තුවට එවන්නට වැඩ කළ පක්ෂයේ කෙනෙක්. මා උදාහරණ වශයෙන් මේ කරුණු පෙන්නුම් කරන්නේ විශේෂයෙන් තමුන්නාන්සේලාට මේවා මතක් කර දිය යුතු නිසායි. "මම සුදනා, මම සුදනා" කියමින් කෑගහන අයගේ විස්තර කියන්නට මා කල්පනා කරන්නේ නැහැ. එම නිසා, අපට චෝදනා කරනවා නම්, හේතු සහිතව එසේ කරන්නට ඕනෑ. ඒ උදවිය කළ වැරදි අප අතිනුත් සිදු නොවේ යයි අප කියන්නේ නැහැ. එහෙත්, අප නිදොස් වීමට පුළුවන් තරම් උත්සාහ කරනවා.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා සමුපකාර තොග වෙළෙඳ ආයතනය පිළිබඳ ඉතිහාසයකුත් ඉදිරිපත් කළා. 1956 සිට 1959 දක්වා වූ කාලය තුළ මාත් ඒ සම්බන්ධව සෑහෙන වැඩ කොටසක් කළ නිසා ඒ පිළිබඳ කරුණු මා දන්නවා. 1946 සිට 1956 දක්වා කාලය තුළ එය පාඩුවට පවත්වා ගෙන ගියායයි කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. මගේ දැනීමේ හැටියට නම් ඒ කාලයේදී සමුපකාරයට ඒකාධිකාරයක් තිබුණේ නැහැ. පෞද්ගලික අංශය සමග සම්බන්ධවී ඒ අයටත් බඩු සැපයූ නමුත් ඒකාධිකාරයක් තිබුණේ නැහැ. ඉන් පසු එය බාර ගත්තේ කවුද? එය බාර ගත්තේ අද ඔය පක්ෂයේ සිටින කෙනකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු හියු ප්‍රනාන්දු.]

නොවෙයි. ලාභ උපදින අන්දමට එය සකස් කෙළේ අද මේ පැත්තේ සිටින, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමායි. අද එතුමා සිටින්නේ මේ පැත්තේ. ඒකයි වෙනස. 1959 දී මා සමග බත් කෑ උදවිය තවමත් ඔය පැත්තේ සිටිනවා. ඒ අය විශේෂයෙන් මේවා දැන ගත යුතුයි. 1959 දී දහනායක මහත්මයා අගමැති වුණාට පසු සියල්ලම විනාශ වුණායයි කොලොන්නාවේ මන්ත්‍රීතුමා කිව්වා. දහනායක මහත්මයා අගමැතිකම කෙළේ මාස තුනයි. හිටපු ඇමතිකෙනකුත් වන කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා මේ වගේ තර්ක ඉදිරිපත් කිරීම ගැන ඇත්ත වශයෙන්ම මට හිනා යනවා. ඇයි? දහනායක මහත්මයා එදා හිටියේ අගමැති වශයෙනුයි. වෙළෙඳාම එතුමාට බාරව තිබුණේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
චෝදනාවක් කළේ නැහැ. එතුමාගේ කාලයේදී සිදු වුණු දේ කිව්වා.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
ඒවා කියන්න වුවමනාවක් නැහැ. එදා වෙළෙඳාම බාරව සිටියේ ළඟදී තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් අස් වුණු දඹදෙණියේ මන්ත්‍රීතුමා යි.

දැන් මේ කාලයේදී බඩු මිළ පාලනයක් නැත, බඩු මිළ පාලන ක්‍රමය සම්පූර්ණයෙන්ම ක්‍රියා විරහිත වී අවසානය, වෙළෙඳ ඇමතිතුමාට ඒ ගැන කථා කරන්නට බලයක් නැත, රාජ්‍ය ඇමතිතුමා ඒ කටයුතු සියල්ලම එතුමාගේ අතට ගෙන අවසානය වෙළෙඳ ඇමතිතුමාත් ක්‍රියා විරහිත වෙලාය ආදී වශයෙන් කරුණු රාශියක් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කීවා. වෙළෙඳ ඇමති ක්‍රියා විරහිතද නැද්ද යන වග මා කියන්නට වුවමනාවක් නැහැ. එහෙත්, බඩු මිළ පාලනයක් නම් අද රටට අවශ්‍ය නැති බව මා කියන්න කැමැතියි. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා වෙළෙඳ ඇමතිව සිටි කාලයේදී මෙන් දැනුත් පෝලිම් හේම තිබෙනවාදැයි මා එතුමාගෙන් අහනවා. මේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ල පිහිටි භූමිය තුළ, පොන්නම්බලම් මැතිතුමාගේ ප්‍රතිමාව ළඟ තබාගෙන තමුන්නාන්සේගේ උප ඇමති ඩී. එස්. ගුණසේකර මහත්මයා කරවල වික්කේ නැද්ද? අද එවැනි තත්ත්වයක් තිබෙනවාද? එදා හැම තැනම තිබුණු පෝලිම් අද කෝ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
පෝලිම් නැත්තෙ බඩු නැති නිසා.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
මා කථානායක ආසනයේ සිටියදී, කරවල විකිණීම සම්බන්ධව මට ලැබුණු පැමිණිල්ලක් අනුව එය නතර කරන්නට මට සිදු වුණා. මේවා ඇත්ත.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අද ජීවන අංකය කීයද? 128 යි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
ඒක වෙනම දෙයක්. මා කියන්නේ සත්‍ය කරුණු.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
දැන් පෝලිම් නෑ, ජාතික පේළි විතරයි තියෙන්නෙ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணண்டோ)*
(The Hon. Hugh Fernando)
මිනිසුන්ට අවශ්‍ය බඩු ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා පෝලිම් නැහැ. ඒවාගේම "ප්‍රයිස් කොන්ට්‍රෝල්" එකක් අද අවශ්‍ය නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒ බව රටට කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்ணண்டோ)
(The Hon. Hugh Fernando)

ඇස් තිබියදීත් නොපෙනෙන මිනිහා පොට්ටයකුටත් වඩා අන්තයයි කියමනක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, කොළොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා කියන්න යෙදුණා, සතොස ප්‍රතිපත්තිය විය යුත්තේ තරඟය නවත්වා පාරිභෝගිකයා අතර හොඳ බඩු ලාබෙට බෙදා දීමයි කියා. තරඟය අවශ්‍යයි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

එහෙම කිව්වෙ නැහැ. මා කිව්වෙ, තරඟයක් ඕනෑ කරන්නේ පාරිභෝගිකයාට සේවය කිරීමට මිස ව්‍යාපාරිකයාට සේවය කිරීමට නොවන බවයි.

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்ணண்டோ)
(The Hon. Hugh Fernando)

හොඳයි ඒක මා පිළිගන්නවා. දැන් එතුමන්ලා මේ රජයට චෝදනා කරනවා, පෞද්ගලික වෙළෙන්දාත් සමුපකාර තොග වෙළඳ ආයතනයත් අතර තරඟ ඇති කරනවාය, එසේ කිරීමෙන් පාරිභෝගිකයාට අවාසියක් සිදු වෙනවාය කියා. එහෙත් ගරු කථානායකතුමනි, කොළොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා සතොස භාර ඇමති වශයෙන් සිටි කාලයේදී සතොස හා සමුපකාරය අතරත් තරඟ ඇති කළ බව මා මතක් කර දෙන්න කැමතියි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

මගේ කොට්ඨාශයේ එහෙම කළා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඔව් ඒකත් කළා.

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்ணண்டோ)
(The Hon. Hugh Fernando)

කොයි විධියෙන්ද ඒ තරඟය ඇති කෙළේ? සතොස සාප්පු පාලනය කෙළෙත් සමුපකාර කඩ සමිති පාලනය කෙළේත් සමුපකාර ඇමති විසිනුයි. ඒ අනුව සමුපකාර කඩ සමිති ඉදිරිපිටම සතොස සාප්පුත් විවෘත කිරීමෙනුයි සතොසත් සමුපකාරයත් අතර තරඟයක් ඇති කෙළේ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

එසේ කෙළේ පාරිභෝගිකයාට සේවය කරන්නයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඒක යකාගෙ සේවය කිරීමක්.

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்ணண்டோ)
(The Hon. Hugh Fernando)

එසේ තරඟයක් ඇති කිරීමෙන් සේවයක් වුණාද? මොක්ද ඇත්ත වශයෙන්ම සිද්ධ වුණ දේ? සමුපකාර සංගම්වල සිටින සේවයකන් අතරත් සතොස සේවකයන් අතරත් පරතරයක් ඇති වුණා. මොකක්ද පරතරය? සතොස ගබඩාවල සේවය කරන සේවකයන් ස්ථිර සේවයේ නියුක්ත ආණ්ඩුවේ වැටුප් ලබන සේවකයන් කොටසක් වුණා. සමුපකාර සංගම්වල සේවය කරන සේවකයන් රුපියල් 40 ක් හෝ 50 ක් පමණ වැටුප් ලබන සේවක කොටසක් වුණා. එකම සේවයක යෙදවූ පිරිසක් අතරේ එවැනි පරතරයක් ඇති කළ බව නමුන්නාන්සේ පිළිගන්නවාද? එකම අමාත්‍යාංශයක් යටතේ එකම දෙපාර්තමේන්තුවේ සංස්ථාවල් දෙකක වැඩ කරන සේවකයන් අතර එකිනෙකාට වෙනස් විධියේ බෙදීමක් ඇති කෙළේ නැද්ද කියා මා ප්‍රශ්න කරනවා.

මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කළ හිටපු ඇමතිවරයෙක් කථා කරන විට, ඒ තොරතුරු නොදන්න කෙනෙක් ඉදිරිපිට නොව, දන්න කෙනෙක් ඉදිරිපිට එසේ කියා පෑම වැරදි බව මා එතුමාට මතක් කරනවා. ඒ එක්කම එතුමා කියන්න යෙදුණා, එතුමා සේවය කරන කාලයේදී සතොස ආයතනයේ දූෂණ බොහෝම අඩුය, දූෂණ තිබුණේ නැත, නමුත් දැන් කොමිෂන් සභාවක් පත් කළොත් බොහෝම දූෂණ එළිවෙන්න පුළුවන්ය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
තිබුණෙ නැත කියා මා කිව්වෙ නැහැ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
මේ ලෝකෙ යම් කිසි ආයතනයක් තිබෙනවා නම්, යම් පුද්ගලයෙක් සිටිනවා නම්, ඒ පුද්ගලයා හෝ ආයතනය නැති වන තුරුම යම් යම් දුර්වලකම් තිබෙනවා. ඒක නැති කරන්න බැහැ. ඒක ස්පිරයි. ඒ කාලයේ සතොස තිබුණ දූෂණකම් මොනවාද යනුවෙන් විස්තර කියා පෑමට මේ අවස්ථාවේදී මා උත්සාහ ගන්නෙ නැහැ. ඒ මොකද ? උත්සාහ ගත්තොත් එයට බොහොම කාලයක් වැය වන අතර මේ සභා ගර්භයේ සිටින සමහර මන්ත්‍රීවරුන්ගේ නම් පවා කියන්නට මට සිදු වන නිසයි. එවැනි චෝදනා මේ අවස්ථාවේදී මතු කිරීමට මා කැමති නැහැ. විශෙෂයෙන්ම මට මුහුණ පාන්නට සිදු වුණ අමාරුකම් මා දන්නවා. යම් යම් දේවල් පාරිභෝගිකයන්ට ලබා දෙන්න අවශ්‍ය වූ අවස්ථාවලදී පාර්ලිමේන්තු කණ්ඩායමේ සිටි මන්ත්‍රීවරුන්ට බොහොම පහත් නින්දා සහගත අවස්ථාවන්ට මුහුණ පාන්නට එමට සිදු වුණා.

ඔබ තුමාගේ අවසරය ඇතුව අර "කූ" ප්‍රශ්නය ගැන තව වචනයක් සඳහන් කිරීමට කැමතියි. එද "කූ" නඩුව ඇති වුණු කාලයේ මොනවද කිව්වෙ ? ඊට සම්බන්ධ වූ අය සම්පූර්ණයෙන්ම රජය පෙරළන්නට වැඩ පිළිවෙළක් ගෙන ගිය බවත්, එක්සත් ජාතික පක්ෂය ඊට ආධාර කළාය, ධෛර්‍ය දුන්නාය, යන්න සත්‍යයක් බවත් මේ විරුඬ පාර්ශ්වයේ උදවිය ප්‍රකාශ කළා. ඔය ආදි වශයෙන් නොයෙක් චෝදනා ඉදිරිපත් කරන්නට යෙදුණා. කුමන්ත්‍රණ නඩුව පවරන්නට පෙර එය මේ සභා ගර්භයේදී සාකච්ඡා කරන අවස්ථාවේදී—උසාවියට යන්නට ඉස්සර වෙලා—කුමන්ත්‍රණයක් මේ රටේ ඇති වුණා නම්, මේ රටේ කුමන්ත්‍රණයක් රෝපණය කරන්නට යමෙක් උදව් වුණා නම් ඒ අන් කිසිවෙක් නොව පීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයාය යනුවෙන් කිව්වේ මම නොවෙයි, යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්‍ය එන්. එම්. පෙරේරා) බව හැන්සාඩ් වාර්තාවෙන් ඔප්පු වෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඒ කියමන ඉල්ලා අස් කර ගත්තා.

It is very unfair for the Hon. Minister to make insinuations like that. That remark was later withdrawn by Dr. N. M. Perera.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
Let him withdraw it.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்தை)*
(Dr. Colvin R. de Silva—Agalawatta)
Mr. Speaker, on behalf of Dr. N. M. Perera, the Member for Yatiyantota who is not here, while not getting involved in this row, I would like to remind you, Sir, that Dr. N. M. Perera formally, publicly and carefully withdrew the allegation he had made on the basis of the information he had originally had. And it is not for any Member here, even an Hon. Minister, who has for a moment lost control of himself, to say that it is for Dr. N. M. Perera to withdraw the statement he made. He has done it.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)
He may have done it later. But whatever it is, on the first occasion that the question was taken up in this House, he made specific reference to the then Minister of Finance and said that he was responsible for the coup. That is my point. He may have withdrawn it long afterwards.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
Mr. V. E. Perera was proved in the Supreme Court before three judges to have cooked up an entire Information Book to put the hon. Member

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

for Baddegama in trouble, and it is no use anybody forgetting it in this House.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Now you are getting outside the point.

ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

If the Hon. Minister goes into the coup case we have to retort on coups. —[*Interruption*].

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! The Hon. Minister made a reference by quoting HANSARD. He made a certain statement regarding the hon. Member for Yatiyantota. Now it has been brought to his notice that the hon. Member for Yatiyantota had withdrawn his earlier statement, and he accepts it.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

That is not all, Sir ; pardon me. The Hon. Minister said nevertheless that the allegation had been made, as if it were true. I say that the General Manager of Salu Sala was proved before three judges to have cooked up and Information Book——

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

No.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

—and anybody who says "No" does not know his facts.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Now are you going to make a speech about the Manager of Salu Sala ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Yes, Sir. Sometimes interruptions require speeches.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I do not think I can allow it.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

No, Sir. I am not asking you to allow it. I have already done it.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

You have done it and I regret that a person like you should have done it.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

On that I quite agree. But I defend my own.

ගරු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்னாண்டோ)
(The Hon. Hugh Fernando)

I thank the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) for bringing this to my notice.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I still say, Sir, that Dr. N. M. Perera has withdrawn the earlier statement he had made, and it is unfair, very unfair, for an Hon. Minister to persist in it.

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்னாண்டோ)
(The Hon. Hugh Fernando)

The fact that the statement was withdrawn is a different issue. The fact that the statement was made is correct.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Yes, but he withdrew that. You see, I may call an hon. Member a rogue here, but when the Speaker points it out to me and I say, "I am sorry", I withdraw the remark. No one has a right in this House after that to say that so-and-so called so-and-so a rogue. The statement is withdrawn.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) has already had his say. As a matter of fact, when the Hon. Minister referred to this matter he was not aware that the statement had been withdrawn later.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Those who read HANSARD should read it as a whole.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

And the statement has been withdrawn long afterwards. But when you brought it to his notice he accepted it.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

But the Hon. Minister persists in saying it.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

On the same token I may say that the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) should have checked up on his information before he made the statement in this House.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Shall we go on?

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Are we on the coup debate? If we are I am ready to meet the Hon. Minister. He said something about the hon. Member for Yatiyantota not getting his information checked. I am here ready to state what he got checked.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! You may talk it over at some other time. Shall we continue?

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Do you not think that you should stop the Hon. Minister before me?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think so.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Pardon me, Sir. I am not accustomed to this kind of treatment.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

Nor am I.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The point is that the Hon. Minister was not aware that the remarks made earlier by the hon. Member for Yatiyantota had been withdrawn, and when the hon. Member for Agalawatta brought that fact to his notice he accepted it. Please go on with the Debate.

අ. භා. 5.8

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ එක්තරා කොටසක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන කථා කරන්නට ගිහිල්ලා අපේ අළුත් වෙළෙඳ ඇමතිතුමාට යම්කිසි වේගයක් ඇති වෙලා තිබෙන බව අපට පෙනී යනවා. එතුමා සභා ගර්භයෙනුත් පිට වෙලා යන්නට සූදානම් වන බවයි අපට පෙනෙන්නේ. කරුණාකර ටිකක් වෙලා ඉන්නැයි මම එතුමාගෙන් ඉල්ලනවා. ප්‍රිවි කවුන්සලය ගැන කථා කරන්නටයි යන්නේ. කරුණා කර ඊට සවන් දී යන මෙන් මම එතුමාගෙන් ඉල්ලනවා. මෙතැනදී ඒ ගැන වැඩිපුර යමක් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ඇමතිකම් කරන කාලයේදී සිදු වූ දේවල් ගැන වර්තමාන වෙළෙඳ ඇමතිතුමා කිව්වා. එහෙත් වර්තමාන වෙළෙඳ ඇමතිතුමා පාකිස්තානයේ කොමසාරිස්වරයා වශයෙන් සිටි කාලයේදී එහි කළ දේවල් ගැනවත් කියන්නට යන්නේ නැහැ මම. අපි ඒක වෙනත් වේලාවකදී කරමු.

1962 කුමන්ත්‍රණය ගැන වගකිවයුතු, එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන් කී දෙනකු අද එම පක්ෂයේ ආණ්ඩුව මගින් කුමන පදවි ලබමින් කොතරම් මාසික පඩි ලබනවාද යන ප්‍රශ්නය මම මෙතැනදී මතු කරන්නේ නැහැ. ඒ ගැන පිළිතුරු බලාපොරොත්තුවෙන් ප්‍රශ්නයක් අසන්නට කල් දී තිබෙනවා. කුමන්ත්‍රණයට සම්බන්ධ වූ වැරදිකාරයෝ කවුරුද, ඒ දවස්වල ඒ අය මොන පදවි දැරුවෝද, ඒ පදවි දැරූ මිනිසුන් අද මොන පදවි දරනවාද, ඔවුන්ට අද කොපමණ පඩි ලැබෙනවාද, ඒ පත්වීම් ඔවුන්ට ලැබුණේ කාගෙන්ද යනාදි වශයෙන් ඒ ප්‍රශ්නයෙන් කරුණු බලාපොරොත්තු වෙනවා. එය න්‍යාය පත්‍රයට වැටී තිබෙනවා. ඒ ප්‍රශ්නයට පිළිතුරු ලැබුණාම අපට විස්තර දැන ගන්නටත් පුළුවන් වේවි, 1962 කුමන්ත්‍රණකාරයන් සහ එක්සත් ජාතික පක්ෂය අතර කුමන සම්බන්ධයක් තිබෙනවාද යන්න ගැන. ඒ ගැන අපි පසුව සාකච්ඡා කරමු. දැන් ටිකක් වේගවත් ලෙස කතා කළ ඇමතිතුමා මෙතැනින් ගොස් තිබෙන බව පෙනෙනවා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) එතුමාට නම නොකියා ඇනුම්පදයක් කිව්වායයි දොස් කිව්වා. එතුමාගේ කථාවේ දී අහිංසක නීතිඥයකු වන මටත් පොඩි ඇනුම්පදයක් කිව්වා. රාජාධිකරණයට යන එක ගැනයි එතුමා කිව්වේ. එතුමා නොදන්නා දේවල් ගැන කතා නොකරනවා නම් කොතරම් හොඳද? "රාජාධිකරණය" යනුවෙන් ටිකක් මහාප්‍රාණ විධියට නම කිව්වාට මොකද එංගලන්තයේ රාජාධිකරණයට යන්නට කාටද වුවමනා කරන්නේ? ඒක විනිශ්චය මණ්ඩලයක් නොවන බව එතුමා දන්නවාද? නීතිඥයකු හැටියට ගරු කථානායකතුමා දන්නවා, එංගලන්තයේ රාජාධිකරණය විනිශ්චය මණ්ඩලයක් නොවන වග. පරණ නාකි සුද්දෙ වගයකට නම්බු නාම දෙනවා. ඒක හරියට එක්සත් ජාතික පක්ෂයෙන් සාම මණ්ඩලවලට සභාපතිවරු පත් කරන්නා වගෙයි. අන්න ඒ වාගේ පරණ සුද්දන් වගයකට—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I think you should not refer in those terms to the Privy Council because at present the Privy Council is accepted in Ceylon.—[*Interruption*] We accept the Privy Council and, as such, you should not refer in such terms to the Privy Council.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ප්‍රිවි කවුන්සලය ගැන අපේ නීතියෙහි සඳහන් වන එක ඇත්ත. එහෙත් එම ආයතනය විනිශ්චය මණ්ඩලයක් නොවෙයි. මහ රැජිනට යම් යම් කරුණු ගැන උපදෙස් දෙන ආයතනයක් පමණයි එය. එහි නඩු තීන්දු මේ රටේ ක්‍රියාත්මක කරනවායයි අප පිළිගෙන තිබෙනවා. එපමණයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That is not my complaint. You spoke in a manner you should not have spoken in regard to that body. I am surprised that a person of your position should have spoken in that manner.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඇත්ත වශයෙන්ම එම මණ්ඩලය සෑදී තිබෙන්නේ කුමන ආකාරයකට දැයි තමුන්නාන්සේ දන්නවා. එය ලංකාව තුළ වෙන විධියකින් හඳුන්වන්නට බැරි නිසායි මම සාම මණ්ඩලය ගැන මතක් කළේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සිංහල මිනිස්සුත් සිටිනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මෙහෙන් යැවූ අය එක්කෙනෙක්ද දෙන්නෙක්ද සිටියා. [බාධාකිරීම්]

අපේ රාජ්‍ය ඇමතිතුමා මේ ආණ්ඩුව කාලය තුළදී සමුපකාර තොග වෙළඳ පනත වෙනස් කරන්නටය කියා මේ මන්ත්‍රී මණ්ඩලයට පැමිණි පළමුවන අවස්ථාව මෙය නොවෙයි. මට මතක හැටියට මේ ආණ්ඩුව කාලය තුළදීම දෙවතාවක් සමුපකාර තොග වෙළඳ ආයතන පනත වෙනස් කරන්නට ආවා. මේ එක් අවස්ථාවක් තමයි. රාජ්‍ය ඇමතිතුමා සමුපකාර තොග වෙළඳ ආයතනයට මේ කරන්නට යන දේවල් ගැන කල්පනා කරන විට මට මතක් වුණා, ස්කෝලෙ යන කාලෙ මා අසා තිබුණ කතාවක්. ඒ ගැන ටිකක් සිහිපත් කරන්නට මා කැමතියි.

මා ස්කෝලෙ ගියේ වැලිගමටයි. එහි කඩවීදියේ සයිබු නානා නමින් හම්බයෙක් හිටියා. ඒ මිනිහාට මාළු ලෑල්ලක්—මාළු විකුණන තැනක්—තිබුණා. එහි ගසා තිබුණා, "අළුත් මාළු මෙහි විකිණීමට තිබේ" යනුවෙන්. එහි ලෑල්ල දෙස බැලූ සමහර උදවිය ඇසුවා, මොකද මිනිහෝ "අළුත් මාළු" යනුවෙන් සඳහන් කරන්නේ; "අළුත් මාළු" නොවෙන්නම් විකුණන්නට තිබෙන්නේ? කියා. "අළුත්" යන්න කපා දමන්නැයි ඔවුන් කියා සිටියා. ඒපාර සයිබු නානා "අළුත්" කියන වචනය කපා දැම්මා. එතකොට කියවෙන්නේ "මාළු මෙහි විකිණීමට තිබේ" යනුවෙනුයි. ඒපාර තව කට්ටියක් කිව්වා, තමුසෙ මාළු නොවෙන්නම් විකුණන්නේ. ලෑල්ල ඉස්සරහ මාළු තිබෙනවා නේද? එම නිසා "මාළු" යන්නත් කපා දමාපන් යනුවෙන්. ඒ කතාව ඇසූ සයිබු නානා "මාළු" කියන වචනයත් කපා දැම්මා. දැන් ඉතිරිව තිබෙන්නේ "මෙහි විකිණීමට තිබේ" යන්න පමණයි. ඒපාර තව කට්ටියක් ඇසුවා, තමුසෙ මෙහි නැතුව ගෙදර ගිහිල්ලද මාළු විකුණන්නේ? එම නිසා "මෙහි" යන්නත් වැඩක් නැති වචනයක් බව ඔවුන් කිව්වා. ඒ පාර ඔහු "මෙහි" යන්නත් කපා දැම්මා. ඊළඟට ඉතිරි වුණේ "විකිණීමට තිබේ" යන්න පමණයි. නොවිකුණා නිකම් දෙනවාදැයි ඊළඟට බොහෝ දෙනා ප්‍රශ්න කරන්නට පටන් ගත්තා. "විකිණීමට" යන්නත් කපන්නයයි හුඟදෙනෙක් කිව්වා. ඔහු ඒ අනුව "විකිණීමට" යන්න කැපුවා. අන්තිමට ඉතිරි වුණේ "තිබේ" යන්න පමණයි. අන්තිමේදී සයිබු නානා වට කර ගත් මිනිස්සු කිව්වා, තිබෙන නිසා නොවෙන්නම් තමුසෙ විකුණන්නේ; එම නිසා "තිබේ" යන්නත් කපා දමනවා, යනුවෙන්. අන්තිමට ඔහුට ඉතිරි වුණේ ලෑල්ල විතරයි. ඒපාර සයිබු නානා ලෑල්ලත් විසි කර දැම්මා.

රාජ්‍ය ඇමතිතුමාට අසු වුණු සමුපකාර තොග වෙළඳ ආයතන පනතත් අර සයිබු නානාට අසු වුණු මාළු ලෑල්ල වාගේයැයි කියන්නට පුළුවනි. එම පනත කපලා කොටලා අවසානයේදී අර සයිබු නානාගේ ලෑල්ල වාගේ වීසි කර දමන්න වන තත්ත්වයකට පත් වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කව්ද කැපුවෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සේ ගිය පාරත් කැපුවා. කපලා "රෙදි සල" කියල එකක් හැදුවා. දැන් කපන්න යනවා නවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටසක්. රෙදි නැති සලක් හදන්න යනවා. "සළු" කියන්නෙ සිංහලෙන් "රෙදි" වලට. මේම සමුපකාර තොග වෙළඳ ආයතන පනතෙ කොටසක් කපා දමා තමයි අර "රෙදි සැල" කියන එක හදා ගත්තෙ. තවත් කැපිල්ලක් කපන්න යනවා, රෙදි නැති සැලක් හදන්න. නැව් සමාගමක් හදා ගෙන, රෙදි නැතිව වෙන වැඩ කරන්න යනවා. දැන් මොහොතකට පෙර මේ ආණ්ඩුව රෙදි නැතිව කළ වැඩ ගැන—කුමන්ත්‍රණයකට වැරදි කාරයන් වුණු ඇතැම් පුද්ගලයන්, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ වැරදිකරුවන් වශයෙන් ඔප්පුවුණු පුද්ගලයන් ඇතැම් සමාගම්වල මාසයකට රුපියල් තුන් දහසක් තරම් වන වැටුප් ලබන තත්ත්වලට පත් කර තිබීම ගැන—සඳහන් වුණා. සමුපකාර තොග වෙළඳ ආයතන නීති සංශෝධනය කර නොයෙක් අය තනතුරුවලට පත් කරනවා. මේ වර සංශෝධනය කරන්නෙ කාට රක්ෂා දෙන්නද? නැව් සමාගමේ තනතුරු මොන කුමන්ත්‍රණකාරයන්ටද දෙන්න කල්පනා කරන්නේ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කව්ද හොඳ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)
පසුගිය දවස්වල කුමන්ත්‍රණයට සම්බන්ධ වුණු මුනිදාස පෙරේරා පත් කරන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අඳුනනවද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)
මාත් හඳුනනවා, පසුගිය දවස්වල කුමන්ත්‍රණයකට සම්බන්ධ වුණාය කියන ඒ පුද්ගලයා.

ගරු රාජ්‍ය ඇමතිතුමා සමුපකාර තොග වෙළඳ ආයතන සංශෝධන පනත ඉදිරිපත් කළ දවස්වල අනුරාධපුරයෙ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) සළු සල පිළිබඳව ප්‍රශ්නයක් නැඟුවා. මෙම මන්ත්‍රී මණ්ඩලයේදී රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන විට සාමාන්‍යයෙන් අමාරුවේ වැටෙන අන්දමට පිළිතුරු දෙන කෙනෙක් නොවෙයි. නමුත් එතුමා එදා දුන් පිළිතුරෙන් පැහැදිලි වුණේ මොකක්ද? එතුමා කීවා, සළු සල කියන ආයතනය පාර්ලිමේන්තුවට කෙළින්ම වගකියන ආයතනයක් නොවන බව. එය වෙනත් පෞද්ගලික වෙළඳ සමාගම් වාගේ සීමාසහිත වෙළඳ සමාගමක් නිසා එහි කෙරෙන වැඩ කටයුතු ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න නගන්නට මන්ත්‍රීවරුන්ට බලයක් නැති බව. නමුත් ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ අවසරය ඇතිව, මත්තට බල නොපවත්වන අන්දමට ගරු ඇමතිතුමා පිළිතුරක් දුන්නා. එසේ නම් මා මතු කරන ප්‍රශ්නය මේකයි: මහජන මුදල්, පාර්ලිමේන්තුවේදී සම්මත කරන නීතිය අනුව පෞද්ගලික ආයතනවලට බෙදා දෙනවා නම්, ඒ මුදල් අනිසි විධියට, අයුතු විධියට, නොහොබිනා විධියට පරිහරණය කරනවා නම් ඒ ගැන ප්‍රශ්න කරන්න බැරියයි කියනවා. මන්ත්‍රී මණ්ඩලයේදී, මන්ත්‍රීවරුන් ලවා නීති සම්මත කර ගන්නවා, මහජන මුදල් ඒ අන්දමේ කටයුතුවලට යොදවන්න. ඒ ගැන ප්‍රශ්න කරන විට, මහජන මුදල් අයථා අන්දමට යොදවනවාය කියා පැමිණිලි කරන විට, රාජ්‍ය ඇමතිතුමා කියනවා ඒවා ගැන ප්‍රශ්න කරන්න එපාය කියා. එය හරියට ඌරාගේ මාළු ඌරාගේ ඇගේ තබා කපනවා වාගේ වැඩක්. මන්ත්‍රී මණ්ඩලය ලවා නීති සම්මත කර ගන්නවා, මහජන මුදල්, සමුපකාර තොග වෙළඳ ආයතනයේ මුදල් පෞද්ගලික ව්‍යාපාර සඳහා යොදවන්න පුළුවන්ය කියා. නමුත් රාජ්‍ය ඇමතිතුමා——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
There is nothing to prevent the hon. Member from criticizing, but the point is that there is no ministerial responsibility.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අන්න ඒ නිසා තමයි අප මේකට විරුඬ. ඇමතිවරුන්ට වගකීමක් නැති නම් ඇයි නීතියෙන් මේ අන්දමට බලය දෙන්නෙ මහජන මුදල් වෙනත් කෙනෙකුට පවරන්න? මහජන මුදල් නීත්‍යානුකූලව වෙනත් කෙනෙකුට පවරන්න ඡන්දය ලබා ගන්නවා. සමහර විට එය සියයට හතලිස් නවයක් හෝ පණස් එකක් වන්න පුළුවනි. නමුත් මහජන මුදල් වැරදි විධියට පාවිච්චි කිරීම ගැන ප්‍රශ්න කරන විට මගෙන් අහන්න එපා, මා ඒවාට වගකියන්නේ නැතැයි ඇමතිතුමා කියනවා. මේ අන්දමේ වග කීමෙන් තොර ප්‍රකාශයක් මෙම පාර්ලිමේන්තුවේදී මීට පෙර කෙරුණේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ නිසා මගේ කිසිම විශ්වාසයක් නැහැ මේ පාර්ලිමේන්තු ක්‍රමය ගැන. මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන මගේ කිසිම සැලකීමක් නැහැ. මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රශ්න ඇසීමෙන් කරන අවිචාර ශිලි වැඩ පිළිවෙලට අනුව යම් යම් දූෂණ නැති කිරීමටවත් ඒවා වළක්වන්නටවත් පුළුවන්කමක් ඇති වේවිය කියා මා සිතන්නේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තු ක්‍රමය මහා විකාරයක් හැටියටයි මා සලකන්නෙ. ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඇමතිවරු ඇත්තෙත් නැහැ. සමහර විට පිළිතුරු ඕනෑවට වඩා දිගය කියා ඒවා සභාගත කරනවා. අදත් ඒ විධියේ දෙයක් කළා. මා ප්‍රශ්නයක් ඇසුවා, පරාජිත යු. එන්. පි. අපේක්ෂකයන් කී දෙනෙකුට සංස්ථා කියක පදවි දී තිබෙන වාද කියා. නමුත් එයට පිළිතුරක් දෙන්න ලැජ්ජා වුණා. නමුත් ලැජ්ජා නැති වැඩ කරන්න හොඳයි. පරාජිත අපේක්ෂකයන්ට සංස්ථාවල පදවි ලබා දී සභාපතිකම් ලබා දී දේශපාලන වැඩ කිරීමට සම්පූර්ණ බලතල පහසුකම් සපයා දී තිබෙනවා. නමුත් ඒ වගේ දෙයක් ගැන ප්‍රශ්නයක් ඇසූ විට පිළිතුරු දෙන්න ලැජ්ජා වෙනවා. නමුත් ලැජ්ජා නැති වැඩ කරන්න පුළුවනි. මේ තමයි පාර්ලිමේන්තුවට සලකන හැටි. ප්‍රශ්න මාර්ගයෙන් පාර්ලිමේන්තුවේ කරන වැඩ ගැන ප්‍රශ්න කරන්න පුළුවන්ය, දෙපාර්තමේන්තුවල නැත්නම් මහජන ආයතනවල කෙරෙන දූෂණකම් ගැන අයථා ක්‍රියාවන් ගැන, කරන නොහොබිනාකම් ගැන ප්‍රශ්න මාර්ගයෙන් පාර්ලිමේන්තුවේදී කරුණු දැන ගන්න පුළුවන්ය, කියා සම්ප්‍රදායක් තිබෙනවා. නමුත් ගරු ඇමතිවරුන් එය තුච්ඡවකටවත් සල කන්නේ නැහැ. මන්ත්‍රී මණ්ඩලයේදී මුලින්ම ප්‍රශ්න අසන අවස්ථාවේදී හෝ අවසානයේදී ප්‍රශ්න ඇසීමට ලැබෙන කාලය ඇතුළතදී හෝ කවදාවත් මේ වගේ මහජන දූෂණකම් ගැන හරි පිළිතුරක් ලබාගැනීමට හෝ විවාදයකට අවස්ථාවක් ලබාගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ ගැන මගේ තුච්ඡවක වත් සැලකීමක් ඇත්තේ නැහැ. ඒ අංශයෙන් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන මගේ කිසිම සැලකීමක් නැහැ. නමුත් පාර්ලිමේන්තු ක්‍රමය හිසින් දරා ගෙන සිටින මේ ඇමතිවරු—මේ පාර්ලිමේන්තු ක්‍රමය හොඳයි කියන, එය ආරක්ෂා කරන ඇමතිවරු—ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ කොහොමද? ඒ අය විසින්ම ගරු කරන ඒ අය විසින්ම ආරක්ෂා කරනවාය කියන පාර්ලිමේන්තු ක්‍රමයට පයින් ගසන ආකාරයටයි ඒ අය ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නෙ. ඉතින් කොහොමද මහජනයාට මේ ගැන යම්කිසි විශ්වාසයක් ඇති කර ගන්නෙ? මේ සළු සළ සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නය කට ගරු රාජ්‍ය ඇමතිතුමා දී තිබෙන පිළිතුර කුමක්ද? 1969 මාර්තු මාසයේ 6 වෙනිදා හැන්සාඩ් වාර්තාවේ 2724 වැනි තීරුවේ එය මෙසේ සඳහන් වෙනවා.

"THE HON. J. R. JAYEWARDENE

This is a question asked from the Lanka Salu Sala which is a joint stock company registered under the Companies Ordinance."—

ගරු රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න කලින් මේ විධියට කියා තිබෙනවා. මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ අනුරාධපුරයේ මන්ත්‍රීතුමා විසිනුයි. එයට පිළිතුරු දෙන්න කලින් පොඩි පූර්විකාවක් කර තිබෙනවා. එතුමා කියා තිබෙනවා, "මම මේකට පිළිතුරු දෙන්න බැඳිල නැහැ, නමුත් පොඩි කාරණාවක් සඳහන් කරන්න ඕනෑ"ය කියා. මෙන්න මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විධියටයි තිබෙන්නෙ. මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ Joint Stock Companies පනත යටතේ ලියාපදිංචි කරන ලද සළුසල නමැති වෙළඳ ආයතනය ගැනයි.

—" The connection Government has with this joint stock company is the holding of majority shares through the Co-operative Wholesale Establishment. "—

සළුසල සමග මේ ආණ්ඩුවේ තිබෙන සම්බන්ධය නම් සතොස ආයතනය මගින් එහි එක්තරා කොටස් ප්‍රමාණයක් ගැනීම පමණයි.

—" The Government has no authority to direct the Lanka Salu Sala as it has the authority to direct corporations and boards created by statutes. "—

ඔන්න ඔතනයි ප්‍රශ්නය තිබෙන්නෙ. ලංකා සළුසලට උපදෙස් දෙන්න පුළුවන් කමක් නැහැ. රජය මගින් පිහිටුවන ලද අනික් සංස්ථාවලට උපදෙස් දෙන්නා වාගේ මේ සළුසලට උපදෙස් දෙන්න පුළුවන්කමක් නැහැ. නමුත් මේ සළුසල පිහිටුවන ලද්දේ සමුපකාර තොග වෙළඳ ආයතන පනත සංශෝධනය කිරීමෙනුයි. එහි මුදල්වලිනුයි මෙය පිහිටුවන ලද්දෙ. නමුත් ගරු ඇමතිතුමා කියන්නේ සළු සල ගැන වගකියන්න බැරිය කියා.

—" ....So, I have up to now not answered questions because I have no authority to ask a joint stock company to answer questions asked in the House. "—

මෙම ගරු සභාව ලවා නීතියක් සම්මත කරවාගෙන, " මට මේ ප්‍රශ්නයට උත්තර දෙන්නට අයිතියක් නැහැ. මේක ජොයින්ට් ස්ටොක් වෙළෙඳ සමාගමක් ගැන ඇසූ ප්‍රශ්නයක් " යනුවෙන් පසුව කියනවා.

මහජන මුදල් පෞද්ගලික වෙළෙඳ සමාගම්වලට දීමටත්, ඒ මුදල් ඒ සමාගම් කැමති අන්දමට පරිහරණය කරන්නට ඉඩ හැරීමටත් මේ තත්ත්වය යටතේ අපට පුළුවන්ද ? තත්ත්වය මෙසේ හෙයින් මේ සංශෝධන පනත අනුමත කරන්නට අපට කිසිසේත්ම බැහැ. සමුපකාර තොග වෙළෙඳ ආයතනය පිහිටුවීමේ පරමාර්ථ වෙනස් කිරීම නුසුදුසු බව අපට ඉහත කී කාරණයෙන්ම පැහැදිලි වෙනවා.

අපේ රාජ්‍ය අමතිතුමා නම් ජන සම්මත වාදියෙක්. " නීතියෙන් නම් සළුසල ගැන අසා තිබෙන මේ විධියේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන්නට මට අයිතියක් නැහැ. ඒ වුණත් මම උත්තර දෙන්නම්. " යනුවෙන් එතුමා කියා තිබෙනවා.

—" But I have obtained the answer in this case with the permission of the directors because a Minister is involved in the answer. "—

මේ පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ අවසරය ඇතිව ගරු රාජ්‍ය ඇමතිතුමා මේ තොරතුරු සොයාගෙන තිබෙනවා.

ඇත්තෙන්ම එතුමා කොතරම් නිහතමානීද ? පෞද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් ළඟට දණ ගාගෙන ගොස්, " මගෙන් මෙන්න මේ ප්‍රශ්නය අසා තිබෙනවා. කරුණාකර මට මේ තොරතුරු දෙනවාද " යනුවෙන් බැගෑපත් වී තිබෙන බව අපට පෙනී යනවා.

හැබැයි, මින් පසු මෙවැනි ප්‍රශ්නයක් අසන්නේ නැත්නම් පමණක් පිළිතුරු දිය හැකි බවයි, එතුමා මෙම ගරු සභාවේදී සඳහන් කර තිබෙන්නේ.

—" So, could I disclose the answer now ? I am ready for it, but I do not like a precedent created. "—

—" The whole idea of creating joint stock companies was to make them private organizations with government holdings and not responsible to Parliament ...... "

" මම එහෙම නම් උත්තර දෙන්නද ? එහෙත් මේ පිළිබඳව සම්ප්‍රදායයක් බිහි කරන්නට මා කැමති නැහැ. " ගරු රාජ්‍ය ඇමතිතුමා ඊළඟට සඳහන් කර ඇත්තේ ඔය විධියටයි. සළුසලට දී තිබෙන්නේ සමුපකාර තොග වෙළෙඳ ආයතනය සතු පොදු සල්ලි වුවත් නීතිය අනුව ඒ පෞද්ගලික ආයතනයේ කටයුතු ගැන ප්‍රශ්න කරන්නට බැහැ.

ගරු කථානායකතුමනි, පෘඩන්බර්ග් කොම්පැනිය නැත්නම් වෙනත් පෞද්ගලික කොම්පැනියක් කොමිස් මුදල් ලබා ගන්නා ආකාරය ගැන ලාභ උපදවන ආකාරය ගැන මෙම ගරු සභාවේ ප්‍රශ්න කරන්නට බැරි යයි කීවා නම් ඒක පිළිගන්නට පුළුවනි. ඒ සමාගම් මුදල් පරිහරණය කරන ආකාරය ගැන මෙම ගරු සභභාවේ ප්‍රශ්න කරන්නට බැහැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
එහෙත් සළුසලේ පාවිච්චි කරන්නේ මෙම ගරු සභාවෙන් අනුමත වූ නීතියක් අනුව ලැබුණු මහජන මුදල් බව අප අමතක නොකළ යුතුයි. පෞද්ගලික ආයතනයකට දෙන ලද මහජන මුදල් නොමනා විධියට පාවිච්චි වන විට අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) අර ප්‍රශ්නය අසා තිබෙනවා. එදා රාජ්‍ය ඇමතිතුමා ඒ විධියට කථා කරගෙන යැමෙන් පසුව ගරු කථානායකතුමා මේ විධියට කියා තිබෙනවා.

"If you are not responsible for the work of the Lanka Salu Sala there is no obligation on your part to answer the Question, but if you wish to do so you can."

ගරු කථානායකතුමාගේ ප්‍රකාශයෙහි වරදක් කියන්නට බැහැ. එහෙත් අප මේ වාගේ නීතිවලට ඉඩ දුන්නොත් අපට තව දුරටත් ඔය වාගේ තත්ත්වයන්ට මුහුණ පාන්නට සිදු වේවි. සමුපකාර තොග වෙළෙඳ ආයතනය පිළිබඳ පනත තව දුරටත් සංශෝධනය කරන්නට ඉඩ දුන්නොත් අප තව තවත් මෙවැනි අකටයුතුවලට ඉඩ දුන්නා වෙනවා. මීට පෙර ගෙන එන ලද සමුපකාර සංශෝධන පනත යටතේ සළුසල පිහිටුවා පුද්ගලයන් කීප දෙනකුට රක්ෂා දුන්නාක් මෙන් මේ අලුත් නීතිය යටතේ තවත් එවැනි කටයුතු කරන්නට ඉඩ ලැබෙනවා. මෙම පනතේ දෙවැනි ඡේදය මම කියවන් නම්:

"(ඇ) මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි, යම් කෘෂිකාර්මික හෝ කාර්මික —"

මෙහි නම් ඊළඟට තිබෙන්නේ "ව්‍යවසායක්" කියලයි. මට නම් එම වචනය තේරෙන්නේ නැහැ.

"ව්‍යවසායක් හෝ බැංකු හෝ නැව් ව්‍යාපාරයක් ඇතුළුව වෙන යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම."

මා හිතන්නේ මේ "ව්‍යවසායක්" කියන එක මුද්‍රණ දෝෂයක් විය යුතුයි. එය "ව්‍යාපාරයක්" කියන වචනය වෙන්න ඇති.

ගරු රාජ්‍ය ඇමතිතුමා මොකටද මේ පනත ගෙනෙන්නේ?

"යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක් හෝ"

මොකක්ද දන්නේ නැහැ. සළුසල හදන්නට කලිනුත් අපට කීවේ නැහැ කරන්නට යන්නේ කුමක්ද කියා.

"බැංකු හෝ නැව් ව්‍යාපාරයක්"

කොයි විධියේ බැංකුද, කොයි විධියේ නැව් ව්‍යාපාරයක්ද, මෙය කවුරු පටවා යවන්නට හදන නැව් ව්‍යාපාරයක්ද යනාදී කිසිවක් දන්නේ නැහැ. මේ පනත ඉදිරිපත් කරන අවස්ථාවේදී මේවා ගැන කිසිම විස්තරයක් කිව්වේ නැහැ. ඒ නිසා මේ ගැන අප තුළ පවත්නා භීතිය සම්පූර්ණයෙන්ම සාධාරණයි. මීට කලින් සමුපකාර තොග වෙළඳ ආයතන පනත සංශෝධනය කරගෙන දන් කර තිබෙන හරිය ඇති. තවත් වරක් මේ විධියට සංශෝධන ගෙනැවිත් ගරු රාජ්‍ය ඇමතිතුමාට බලය ඉල්ලනවා මේ පනතේ දෙවැනි වගන්තිය යටතේ කියැවෙන ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කරන්නට. හොඳයි නැව් ව්‍යාපාරයක් ආරම්භ කළාය කියා හිතමු. පරණ ගිලෙන්නට යන කබල් නැවක් ගත්තාම එහි හිල් කීයක් තිබෙනවාද කියා ප්‍රශ්න කළොත් කියාවි ඒවා ගැන අහන්නට එපා, ඒ නැව ගත්තේ පෞද්ගලික සමාගමක්, ඒ නැවේ හිල් කීයක් තිබෙනවාද කියා මා නමස්කාර කර ඇහුවා, ඒත් කියන්නේ නැහැ කියා. ගරු රාජ්‍ය ඇමතිතුමා එහෙම කීවාම අපි කටවහගෙන ඉන්නට ඕනෑ.

ගරු රාජ්‍ය ඇමතිතුමා සමුපකාර තොග වෙළඳ ආයතනයට කරන්නට යන හරියත් මෙම සංශෝධනයෙන් පසු එම ආතනයට සිදු විය හැකි හරියත් ගරු රාජ්‍ය ඇමතිතුමාගේ සළුසල පිළිබඳව ඇති වී තිබෙන තත්ත්වයෙන් අපට ඉඟියක් කර තිබෙනවා; අපට හැඟීමක් ලබා දී තිබෙනවා. එම නිසා විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අපි තරයේම මෙවැනි සංශෝධනවලට අපේ බලවත් විරෝධය දැක්විය යුතුයි. මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවති පසුගිය දිනයේ ගරු රාජ්‍ය ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා හිටියා ඉන්දියාවට ගොස් ආවාට පසුව මේ ගැන විවාද කරමු, එවිට විරුද්ධ පාර්ශ්වයේ අදහස් ඉදිරිපත් කරන්න, ඒවා ගැන එතුමා සලකා බලන වාය කියා. මට අද විවාදයේදී දැනගන්නට ලැබුණා පනතේ එක ඡේදයක් ඉල්ලා අස් කර ගත්තාය කියා. දඹදිව ගමනින් එතුමාට සත්‍යය අවබෝධ වුණාට පසුව එක වගන්තියක් ඉල්ලා අස් කර ගත්තා. ඒ වගේ දෙවැනි වගන්තියත් ඉල්ලා අස් කර ගන්නට ගරු ඇමතිතුමා කැමතිද කියා මා අහනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
අර සයිබූට වුණු එක වෙව්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මා බලන්නෙත් ගරු ඇමතිතුමා ලවා එක එක අස්කරවා ගන්නයි.

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා බොහොම උපාසක තාලයකින් වැඩ කරන්නේ. විරුද්ධ පාර්ශ්වය කියනවා නම් අස් කර ගන්නම්, කරුණාකර අදහස් ඉදිරිපත් කරන්න, ඉදිරිපත් කරන අදහස් ඇතුළත් කළ හැකි තැනකට ඇතුළත් කරන්නම් යනාදි වශයෙන් පෙනුමට පමණක් විරුද්ධ පාර්ශ්වය සමග සහයෝගයක් දක්වා තමන්ගේ වැඩේ කර ගන්නවා. කලිනුත් සමුපකාර තොග වෙළඳ සංසථා පනත සංශෝධනය කළ අවස්ථාවේ එවැනි අදහස් ඉදිරිපත් කර තමන්ගේ වැඩේ කර ගත්තා. නීති කඩන්නේ නැතිව දේශපාලන වශයෙන් තමන්ගේ දර්ශනය අනුව පෞද්ගලිකව ගන්නට පුළුවන් හැම ප්‍රයෝජනයක්ම ගන්නට මාගී එතුමා පාදා ගන්නවා.

එවැනි සූක්ෂ්ම ගරු ඇමතිවරයෙක්. අර ගිනි පෙනෙල්ලෙන් බැට කෑ මිනිසා කලා මැදිරි එළියටත් බයලු. එක වරක් සළු සැලේ ගිනි පෙනෙල්ලෙන් බැට කෑ අප තවත් මෙවැනි සංශෝධනයකට ඉඩ දී ඇමතිතුමාගෙන් අර මා විස්තර කළ අන්දමේ පිළිතුරු ලබා ගන්නට කැමති නැහැ. එම නිසා සමුපකාර ව්‍යාපාරයේ නාමයෙන්, මහජනයාගේ මුදල් පරිහරනය කිරීමට පාර්ලිමේන්තුවට තිබෙන බල යේ නාමයෙන් හා විරුද්ධ පක්ෂය වෙනුවෙන්, මා රාජ්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පතට මගේ විරුද්ධත්වය පළ කරනවා.

අ. භා. 5.36

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු කථානායකතුමනි, සමුපකාර තොග වෙළඳ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් ඇති වී තිබෙනවා. ඒ සාකච්ඡාවේදී හිටපු වෙළඳ ඇමතිතුමාත් වර්තමාන වෙළඳ ඇමතිතුමාත් අතර ඝට්ටන ඇති වුණා. අපේ වර්තමාන වෙළඳ ඇමතිතුමා ඒ කාලයේ, අවුරුදු කීපයක් තිස්සේ ආරක්ෂා කළ ප්‍රතිපත්ති, එතුමා කථානායකතුමා වීමෙන් පසු තව දුරටත් ආරක්ෂා කළ ප්‍රතිපත්ති, වැරදි ප්‍රතිපත්තිය කියා අද මහජනතාව හමුවේ තැබීම ගැන මා පුදුම වෙනවා. ඒවා වැරදි ප්‍රතිපත්ති නම් එක් කෙනෙකු නොවෙයි, එදා පාලනය ගෙන ගිය සැම දෙනෙකුම ඊට වගකිව යුතුයි. වර්තමාන වෙළඳ ඇමතිතුමා අද විරුද්ධ පක්ෂයේ වාඩි වී සිටින හිටපු වෙළඳ ඇමතිතුමාත් සමග එදා ආණ්ඩු පක්ෂයේ ප්‍රබල කණ්ඩුවක් හැටියට කටයුතු කළා; ඒ ප්‍රතිපත්තිවලට ආධාර කළා. නමුත් එතුමා අද කථා කරන්නේ කොහොමද? මා එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ට කියන්නට සතුටුයි තමුන්නාන්සේලා සමග සිටින ඔය වෙළඳ ඇමතිතුමා තව ටික දවසකින් තව කරනමක් ගසා තමුන්නාන්සේලාටත් ඒ තත්ත්වය ඇති කරාවිය කියා.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

1960 මාර්තු මාසයේදී තමුන්නාන්සේ කොයි පැත්තේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
මහජන එක්සත් පෙරමුණේ. නමුත් මා තමුන්නාන්සේ වාගේ ඉස්සරහ පැත්තෙන් පැනල ගිහින් පස්ස පැත්තෙන් ආවෙ නැහැ. [බාධාකිරීමක්] ගරු කථානායකතුමනි, සමුපකාර තොග වෙළඳ ආයතනය ඇතුලේ අදත් තිබෙන දූෂණ ගැන සමහර විට ගරු රාජ්‍ය ඇමතිතුමා නොදන්නවා වෙන්නට පුළුවනි. ගරු රාජ්‍ය ඇමතිතුමා ඒවා ගැන දන්නවා නම්, අර කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ, සමුපකාර තොග වෙළඳ ආයතනයේ කටයුතු ගැන නැවතත් පරීක්ෂණයක් කරන්නට කටයුතු සලස්වාවිය කියා මා විශ්වාස කරනවා.

පසුගිය කාලයේ සමුපකාර තොග වෙළඳ ආයතනයට උපාධිධාරී පුහුණුවන්නන් කියා කොටසක් බඳවා ගත්තා. 1968 දී තමයි ඒ ගැසට් නිවේදනය පළ කළේ. ඒ ගැසට් නිවේදනයේ "පිළිගත් විශ්ව විද්‍යාලයක" යන වචන නොයොදා නිකම්ම "විශ්ව විද්‍යාලයක උපාධියක් ලත්" යන වචන යොදා තිබුණා. එය සිතා මතා කළ දෙයක් බවයි පෙනෙන්නෙ. පූනා විශ්ව විද්‍යාලයේ උපාධියක් දරන, සිංහල ප්‍රවීණතාව නැතිකම උඩ වැටුප් වැඩිවීම නවත්වා තිබෙන, ඒ වාගේම අකාර්යක්ෂමතාව සහ නොපැමිණීම උඩ දෙවතාවක් අවවාද ලබා තිබෙන සිවයෝගනාදන් නම් මහත්මයකුටත් මේ උපාධිධාරී පුහුණුවන්නන්ගේ පත්වීමක් දී තිබෙනවා. ඉතාම සුදුස්සන් සිටියදී මේ මහත්මයාත් ඒ තනතුරකට පත් කර තිබෙනවා. සිංහල ප්‍රවීණතාව ලබා නොගැනීම නිසා ඔහුගේ වැටුප් වැඩිවීම නවත්වා තිබුණා. රජයේ සෑම ආයතනයක්ම රජය පිළිගත් භාෂා ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට ඕනෑ. ස. තො. ස. ඒ ප්‍රතිපත්තිය අනුගමනය නොකරන්නේ ඇයි? මා එසේ කියන්නේ, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නොගැනීම නිසා විශ්‍රාම ගත් හය දෙනකු නැවත එම ආයතනයේ සේවයට බඳවා ගෙන තිබෙන නිසායි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
සිවයෝගනාදන් හැර?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
ඔව්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
නම්?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
දැන් ඒ නම් කියන්නට බැහැ. වුවමනා නම් හෙට දෙන්නම්.

1968 ජනවාරි මාසයේදී චක්‍ර ලේඛයක් නිකුත් කළා, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නොගත් අය ඉන්නවා නම් ඔවුන් අස් කරන්නය කියා. ඒ අනුව සමහර අය අස් කළා. එහෙත් ඉන් පසුව, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නැති හය දෙනකු නැවත සේවයට ගෙන තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
හෙට නම් දෙනවාද?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
පස්සෙ කියන්නම්. මා මේවා කියන්නේ, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැතිව මෙම ආයතනයේ වැඩ කර ගෙන යන නිසායි. ඇමතිතුමා නොදැනුවත්ව දූෂණ ඇති වී තිබෙනවා වන්නට ඇති.

සමුපකාර තොග වෙළඳ ආයතනයේ ඇති දූෂණ සොයා බලා අවශ්‍ය කටයුතු කිරීම සඳහා මේ රජය පසුගිය කාලයේදී කොමිෂන් සභාවක් පත් කළා. එහෙත් තවමත් එහි දූෂණ කෙරෙනවා. යම්කිසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැරැද්දක් සිදු වී තිබෙනවා නම්, එය මගේ තාත්තා අතින් කෙරුණු එකක් වුණත් මා කියනවා. එහෙම නැතිව ඊෂ්‍යා වෙන්, ක්‍රෝධයෙන් නොවෙයි, අප මේ වැරදි පෙන්වා දෙන්නේ. අප මේවා පෙන්වා දෙන්නේ සේවයක් කිරීමේ අදහසින් බව මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.42

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

කථානායකතුමනි, මාත් සමුපකාර තොග වෙළඳ ආයතන සංශෝධන පනත සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කියන්නට අදහස් කරනවා. මේ සමුපකාර තොග වෙළඳ ආයතනය, ලෝකයේ තිබෙන එක්තරා පුදුමයක් බව පළමු කොටම කියන්නට සිදු වී තිබෙනවා. මේ ආයතනය සමුපකාර ව්‍යාපාරයක් නොවෙයි. එය සමුපකාර ව්‍යාපාරයක් නොවෙයි නම් එයට සමුපකාර තොග වෙළඳ ආයතනය යයි කියන්නේ ඇයි? ඒ නමින් මහජනයා රවටන්නට හදනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**

කවුද ඇති කළේ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

ඔය විධියේ ප්‍රශ්න තමයි හැම අවස්ථාවකම අහන්නේ. සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ රජයේ ඇමතිවරුන් දෙදෙනෙකු සිටිනවා. ඇත්ත වශයෙන්ම මේ ආයතනය භාර විය යුත්තේ කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාටයි. එහෙත් භාර වී තිබෙන්නේ රාජ්‍ය ඇමතිතුමාටයි. එයින් තේරෙන්නේ මෙය සමුපකාර තොග වෙළඳ ආයතනයක් බවයි. ඇයි මේ බොරුව හැම දාමත් කරන්නේ? මේ සංශෝධනයෙන් කරන්නට හදන්නේ මොකක්ද? සමුපකාර ප්‍රතිපත්තිවලට පටහැනි, සමුපකාර ව්‍යාපාරයට විරුද්ධ අණපනත් වගයක් සම්මත කරන්නට නොවේද? මෙයින් කෙරෙන්නේ ලෝකයේ වෙනත් රටවල සමුපකාර ව්‍යාපාරිකයන් රැවටීමක්. මා එසේ කියන්නේ කරුණු ඇතිවයි. පිටරටවල සමුපකාර ව්‍යාපාරිකයන් හමු වුණු අවස්ථාවකදී මා ඔවුන්ට අපේ සමුපකාර තොග වෙළෙඳ ආයතනය පිළිබඳ කරුණු කී විට ඔවුන් පුදුම වුණා. ලංකාවෙහි මේ විධියේ දේවලුත් තිබෙනවාදැයි ඔවුන් ප්‍රශ්න කළා. සමුපකාර තොග වෙළඳ ආයතනයෙහි එකම සමුපකාර ව්‍යාපාරිකයකුවත් ඇත්තේ නැහැ, මහජන මුදල් ඊට සම්බන්ධ නැහැ. ආණ්ඩුව ව්‍යාපාරයක් ආරම්භ කොට "සමුපකාර තොග වෙළෙඳ ආයතනය" යන නාම පුවරුව පමණක් ඊට යොදා තිබෙනවා. මෙයින් ගන්නට පුළුවන් එකම ප්‍රයෝජනයයි. සමුපකාර ව්‍යාපාරය දියුණු වෙනත් රටවල සමුපකාර ව්‍යාපාරිකයන් අනෙක් රටවල සමුපකාර ව්‍යාපාර සමග සම්බන්ධ වී නොයෙක් ව්‍යාපාර පවත්වාගෙන ඉදිරියට යන්නට හැම අවස්ථාවේම කැමැත්තෙන් සිටිනවා. ඒ විධියේ සම්බන්ධකම් ඇති කරගෙන, ඒ මගින් ලාබෙට බඩු ලබාගෙන, මේ රටේ පාරිභෝගිකයා සූරා කන්නට මෙයින් ඉඩ ලැබෙනවා. කුඩ වෙළෙඳා මෙන් සමුපකාර තොග වෙළෙඳ ආයතනයට රුපියල් ලක්ෂයත් එක් ලක්ෂ පනස් දාහත් අතර ගණනක ලාභයක් ලැබුණු බව අද "ඔබ්සර්වර්" පත්තරයේ ප්‍රවෘත්තියකින් කියැවෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**

මොන පත්තරේද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

"ඔබ්සර්වර්" පත්තරේ. තමුන්නාන්සේලාගේ පත්තරේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**

තමුන්නාන්සේ ඒක පිළිගන්නවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඇයි, තමුන්නාන්සේ පිළිගන්නේ නැද්ද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මුද්‍රණය කර තිබෙන නිසා පිළිගන්නවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒ ප්‍රවෘත්තිය අනුව එක කුඩයකින් රු. 10 බැගින් ලාභ ලබාගෙන තිබෙනවා, සමුපකාර තොග වෙළෙඳ ආයතනය. මේකත් එක්තරා විධියක කළුකඩයක්. සමුපකාර තොග වෙළෙඳ ආයතනය ආරම්භ කෙළේ කළුකඩ ව්‍යාපාරය සඳහා නොව මහජනතාවට, පාරිභෝගිකයාට වඩා ලාබෙට බඩු සැපයීම සඳහායි; කළු කඩ ව්‍යාපාරය නැති කොට සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහායි. සමුපකාර ව්‍යාපාරයේ පරමාර්ථය වුණේ එයයි. මෙය 1943 දී පටන් ගැනුණු බව කොලොන්නාව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. 1956 න් පසු, දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා ප්‍රකාශ කෙළේ, සමුපකාරය ඉහළ සිට පහළට නොව පහළ සිට ඉහළට වැඩෙන ව්‍යාපාර යක් බවට පත් කිරීම එතුමාගේ අදහස බවයි. එතුමා බලාපොරොත්තු වුණේ සමුපකාර ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම සමුපකාර ව්‍යාපාරිකයන් අතට පත් කිරීමයි. එහෙත්, දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ ? එය ධනපතියන් පිරිසක් අතට පත් කරගෙන සමුපකාර ව්‍යාපාරය නැති භංග කරන්නට කටයුතු කරනවා. අද එය සමුපකාර ව්‍යාපාරයක් නොවේ යයි මා කියන්නේ ඒ නිසයි. සමුපකාර ව්‍යාපාරිකයන් හා සමුපකාර සමිති සමාගම් එකතු කරගෙන, එම සමිති සමාගම් තුළින් මහජන සහයෝගයත් ලබාගෙන ජනතා ව්‍යාපාරයක් හැටියට ගෙන යනවා වෙනුවට අද කෙරෙන්නේ ධනපතියන් රැසක් එකතු කරගෙන ධනපති ක්‍රමය උඩ ගෙන යන ව්‍යාපාරයක් බවට පත් කිරීමයි. ඒ සඳහා මේ විධියේ නීති රීති සකස් කරන විට අපට ඒවාට පක්ෂ වන්නට පුළුවන් කමක් නැහැ. මේවා ගැන අපගේ බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කරන්නට ඕනෑ. සමුපකාර තොග වෙළෙඳ ආයතනයත් පෞද්ගලික ව්‍යාපාරිකයනුත් එකතු කොට හදන ලද සළු සලෙහි සමුපකාර ව්‍යාපාරිකයන් කී දෙනකු සිටිනවාදැයි මා රජ්‍ය ඇමතිතුමා ගෙන් අහනවා. කරුණාකර මේ ප්‍රශ්න යට දැන් උත්තරයක් දෙන්න එතුමාට පුළුවන්ද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කොටස්කරුවන්ද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඔව්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මා දන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු ඇමතිතුමා දන්නෙ නැහැ ලංකා සළුසල සෑදී තිබෙන්නෙ කොහොමද කියා. ලංකා සළුසලේ කොටස් කාරයන් කවුද කියා එතුමා දන්නෙ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මම කොහොමද දන්නෙ ? 8,000ක් ඉන්නවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
දැනගන්න ඕනෑ නේ. මුළු ලංකාවෙ සමුපකාර ව්‍යාපාරිකයන් 1,20,000ක් ඉන්නවා. එහෙත්, ගරු කථානායකතුමනි, මට දැනගන්න ලැබී තිබෙන විධියට මෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකම සමුපකාර සංවිධානයක්වත් නැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනය සමුපකාර සංවිධානයක් නොවෙයි. ඒ වාගේම සළුසල කොටස්කරුවන් අතර සිටින්නේ ධනපති ව්‍යාපාරිකයන්. සමුපකාර ව්‍යාපාරිකයන් නැහැ. සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙනයන්න කැමති නම් ඇයි සමුපකාර සමිති සංගම් මෙයට සහභාගිකර ගන්නට බැරි ? ලංකා සළුසල ආරම්භ කරන විට ඇයි සමුපකාර ව්‍යාපාරිකයන් කොටස් කරුවන් හැටියට සම්බන්ධ කරගන්නට ක්‍රියා කළේ නැත්තෙ ? මේ රටේ සමුපකාර ව්‍යාපාරයක් තිබෙනවා. මේ ආණ්ඩුව ගෙන යන සමුපකාර විරෝධි වැඩ පිළිවෙළ නිසා, බොහෝම අසහනයට පත් වී තිබෙන, සමුපකාර ව්‍යාපාරිකයන් මේ රටේ සිටිනවා. වැඩ කරන්න කැමති සමුපකාර ව්‍යාපාරිකයන් කොටසක් මේ රටේ ඉන්නවා. එහෙත් ඒ අයට ආධාර කරන්න ආණ්ඩුව ලැහැස්ති නැහැ. ආණ්ඩුවේ ධනපති ප්‍රතිපත්තිය නිසා, සමුපකාර විරෝධි ප්‍රතිපත්තිය නිසා ඒ ව්‍යාපාර ගෙනයන්න බැරි වී තිබෙනවා. එහෙත් ඇත්ත වශයෙන්ම ඒ සමුපකාර ව්‍යාපාරිකයන් සමුපකාර තොග වෙළඳ ආයතනය අරගෙන වැඩ කරගෙන යන්න ලැහැස්තියි. තමුන්නාන්සේලා දෙන්න ලැහැස්තිද ? නැහැ. එපමණක් නොවෙයි, සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ පාරිභෝගිකයන්ගේ සංගම් ඇති කර බඩු පිටරටින් ගෙන්වන්නට ලැහැස්ති වුණ අවස්ථාවේදී තමුන්නාන්සේලා ඊට සහයෝගය දුන්නද ? නැහැ. සමුපකාර ව්‍යාපාරය මරන්න තමයි රාජ්‍ය ඇමතිතුමා හදන්නෙ. මේ අනුව සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙනයන්න පුළුවන්ද ? බෙල්ල හිර කරන විට ඉදිරියට ගෙනයන්නෙ කොහොමද? මේ ව්‍යාපාර ආරම්භ කිරීමේදී මුල් තැන දිය යුත්තේ සමුපකාර ව්‍යාපාරයටයි ; සමුපකාර සංවිධානවලටයි ; සමුපකාර සමිති සමාගම්වලටයි.

තමුන්නාන්සේ දන්නවා ඇති ගරු කථානායකතුමනි, මේ රජය බලයට පත් වුණාට පස්සෙ තමන්ට ආධාර කරන නියෝජිතයන් නැති සමුපකාර සමිති සමාගම් සියල්ලම ආණ්ඩුවේ පාලන මණ්ඩල යටතට පත් කර තිබෙන බව. ධනපති පෞද්ගලික කොම්පැනි ආරක්ෂා කරන මෙවැනි ආණ්ඩුවකින් මේ රටේ සමුපකාර ව්‍යාපාරයට සෙතක් වේය කියා අපට විශ්වාස කරන්න බැහැ. මහජනතාවත් එය තේරුම් ගෙන තිබෙනවා. අපේ මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සංගම් 6ක් තිබෙනවා. ඒ සංගම් 6න් එකයි දැනට සමුපකාර ව්‍යාපාරිකයන්ගේ පාලනය යටතේ තිබෙන්නෙ. අනික් සියල්ලෙහිම පාලන බලය එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන්ට භාර දී තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙනයන්නට මේ විධියට පුළුවන්ද ? අන්න ඒ නිසා තමයි අප කියන්නේ මේ සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කරන්නට නම් සමුපකාර තොග වෙළඳ ආයතනය කියන බොරු ආයතනය සම්පූර්ණයෙන්ම නැති කර දමන්නය කියා. සමුපකාර ව්‍යාපාරයට රජයෙන් දෙන්න පුළුවන් සෑම සහයෝගයක්ම දී සමුපකාර ව්‍යාපාරිකයන් සමග එකතු වී මේ කටයුත්ත ඉදිරියට ගෙනයන්න කියන එකයි අප කියා සිටින්නෙ.

සමුපකාර තොග වෙළඳ ආයතනය ගැන කථා කරන විට, කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණ විගසම කෙළින්ම කෙළේ සමුපකාර තොග වෙළඳ ආයතනයට සම්බන්ධ සේවකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති කර දැමීම බව කියන්න සිදු වී තිබෙනවා. රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දෙනවාය කියා මහජනයා ඉදිරියේ ප්‍රකාශ කළ පිරිස ආණ්ඩු බලය ලබාගත් හැටියෙම රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දීම වෙනුවට සංස්ථාවල සේවක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

යන්ගේ දේශපාලන අයිතිවාසිකමුත් සම්පූර්ණයෙන්ම නැති කර දැම්මා. බලයට පත් වූ හැටියේ කෙළේ රජයේ සේවකයන්ට දේශපාලන අයිතිය දීම නොවෙයි. සංයුක්ත මණ්ඩලවල හිටපු උදවියට ඒ කාලය වන තෙක් තිබුණු දේශපාලන අයිතියත් සම්පූර්ණයෙන්ම නැති කර දැම්මා. පළාත් පාලන ආයතනවල කටයුතු කර ගෙන හිටපු අය කීප දෙනකුටම ඒවායින් ඉවත් වන්නට සිද්ධ වුණා. රජයේ සේවකයන්ට දේශපාලන අයිතිය ලැබිය යුතුය යන්න පිළිගෙන තිබුණු නමුත් තව මත් එය දීලා නැහැ. එක් පැත්තකින් වුණේ දේශපාලන අයිතිය තිබුණු උදවියට එය නැති වී යෑමයි. අනෙක් පැත්තෙන්, දෙනවාය කියන ලද රජයේ සේවකයන්ට දේශපාලන අයිතිය දුන්නේ නැහැ. ඇයි මෙහෙම අසාධාරණ දේවල් කරන්නේ ? ඔවුන්ගේ දේශපාලන අයිතිය නැති කර දැම්මා නම් ඔවුන්ට රජයේ සේවකයන්ට ලැබෙන අනෙකුත් වරප්‍රසාද ආදිය ලබා දීම ගරු රාජ්‍ය ඇමතිතුමාගේ යුතුකම නොවෙයි ද ? රාජ්‍ය ඇමතිතුමා ඒ යුතුකම ඉටු කර නැහැ. දැන් සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ සේවකයන්ගේ දේශපාලන අයිතිය සම්පූර්ණයෙන්ම නැති කර ඔවුන් රජයේ සේවකයන්ගේ ගණයටම දමා තිබෙනවා. කර තිබෙන බොරුව බලන්න. නමට රාජ්‍ය සේවකයන්ය කියන නමුත් ඔවුන්ට රාජ්‍ය සේවකයන්ට ලැබෙන අනෙකුත් වරප්‍රසාද ලැබී නැහැ. ඒ නිසා මේ බොරුව දිගින් දිගටම ගෙන යන්නේ නැතිව නතර කර රජයේ සේවකයන්ට ලැබෙන අයිතිවාසිකම් ඔවුන්ට දෙන්නැයි මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

4 වැනි වගන්තිය අස් කිරීමට එකඟවීම ගැන මම ගරු රාජ්‍ය ඇමතිතුමාට ස්තුති වන්ත වෙනවා. මණ්ඩලයේ සේවකයන් විසින් සත්භාවයෙන් කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ඔවුන්ට විරුද්ධව නඩු පැවරීමට බැරිය කියන වගන්තිය ඉවත් කිරීම ගැනයි අපේ ස්තුතිය එතුමාට හිමි වන්නේ. ඒ වාගේම තවත් සංශෝධන කිහිපයක් කළ යුතුය යන්න සඳහන් කරන්නට කැමතියි.

සේවකයන්ට පාරිතෝෂික මුදල් ගෙවීම සම්බන්ධ ප්‍රශ්නය එයින් එකක්. ලාභ බෙදීම සම්බන්ධයෙන් මෙහි කියා තිබෙනවා. පළමුවෙන්ම බදු ගෙවීමෙන් පසු හෝ ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීමෙන් පසු සියේට දහයකට වැඩි නොවන මුදලක් ගරු මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව වර්ෂයක් පාසා අර මුදලකට ගෙවිය යුතුයයි කියන නමුත් සේවකයන්ට ගෙවන මුදල මෙපමණ කැයි කියා නැහැ. සමුපකාර ව්‍යාපාරයෙහි හෝ වේවා වෙන යම්කිසි ඉදිරියට ගෙන යන ව්‍යාපාරයක හෝ වේවා පිට කොන්ද තමයි ඒ ව්‍යාපාරයේ වැඩ කරන උදවිය. ධනපතියන් මුදල් යොදවනවා වන්නට පුළුවනි. එහෙත් තමන්ගේ ශ්‍රමය යොදන්නේ සේවකයන්. ඒ නිසා ශ්‍රමය අගයනවා නම් ඊට සැලකිය යුතුව තිබෙනවා. සේවකයන්ගේ සේවය ගැන සලකා සෑහෙන මුදලක් ලබා දීමට ව්‍යවස්ථා මගින් සලසන මෙන් මා ඉල්ලනවා.

අ. භා. 6

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Order, please! The hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. ඊ. රත්වත්තෙ මිය.** (බලන්ගොඩ)

*(திருமதி எம். ஈ. றத்வத்தெ—பலாங்கொடை)*

(Mrs. M. E. Ratwatte—Balangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමූපකාරය පිළිබඳ පනතක් විවාද කරන මෙම අවස්ථාවේදී මට ප්‍රථමයෙන් මේ පිළිබඳව කථා කළ විරුද්ධ පාර්ශ්වයට අයත් ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් සියල්ලක්ම අනුමත කරන ගමන්ම බලංගොඩ ප්‍රදේශයට අදාල කරුණු ටිකක්ද ඉදිරිපත් කිරීම මගේ යුතුකමකැයි මා කල්පනා කරනවා. ඉහත කාලයේ බලංගොඩ සතොස ආයතනයෙන් විශාල සේවයක් සිදු වුණා. එහෙත් ක්‍රම ක්‍රමයෙන් ගෙනෙන බඩු ප්‍රමාණය අඩුකිරීම නිසා බෙලිහුල්ඔයට තලාපිට ගම්පත්තුවට එහෙම විශාල සේවයක් කර ගෙන ආ එම සතොස බඩු ගබඩාවට සිදු වූයේ කුමක්ද? බඩු ගෙන්වීම අඩු කිරීම නිසා මෙම රජය බලයට පත් වී කෙටි කාලයක් ගත වනවාත් සමගම එය වසා දමන්නට සිදු වුණා. අද බංකොලොත් බාවයට පත් වී තිබෙන විවිධ සේවා සමුපකාරයට එය පවරා දී තිබෙනවා. ඒවාගේම බලංගොඩ නගරය මැද තිබෙන සතොස වෙළඳ සැළත් මේ බඩු අඩුවීමේ ප්‍රශ්නය හේතුකොටගෙන වැඩි කලක් ගත වන්නට මත්තෙන් වසා දමන බවට කිසිම අනුමානයක් නැහැ. ඒ ආකාරයට බඩු අඩු කරන්නේ නැතුව එම පළාත්වල ජනතාවට අවශ්‍ය කරන බඩු සතොසේ ආයතන වලින් සපයා දෙන හැටියට රාජ්‍ය ඇමතිතුමාගෙන් මෙම අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා.

අද ඉදිරිපත් කර තිබෙන පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩියෙන් බලතල දෙන්නට කරුණු යෝජනා කර තිබෙනවා. බලංගොඩින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර සිටින මහතකු ගැන මේ අවස්ථාවේදී කරුණු ස්වල්පයක් සඳහන් කරන්නට කැමතියි. සමහරවිට රාජ්‍ය ඇමතිතුමා මේ කරුණු නොදන්නවා වන්නට පුළුවනි. බලංගොඩ කඩවත්මැද දෙකෝරළේ විවිධ සේවා සමුපකාරයේ සභාපති ඒ මහතායි. ඒ සංගමය අද හොර ගුහාවක් බවට පත් වී තිබෙනවා. මීට අවුරුදු එක හමාරකට පමණ උඩදී ආහාර ඇමතිතුමාගෙන් මා ඒ පිළිබඳව ප්‍රශ්න කළ විට එතුමා කිව්වේ එම හොරකම් ගැන පරීක්ෂා කර බලා සුදුසු අන්දමට ක්‍රියා කරන බවයි. එහෙත් අද වන තුරුම ඒ ගැන කිසිවක් කෙරී නැහැ. හතරවන වරටත් පරාජිතයකු වූ අබුසාලි මහතා එහි සභාපති වශයෙන් අවුරුදු 10 ක පමණ කාලයක සිට කටයුතු කරනවා. බලංගොඩ කඩවත්මැද දෙකෝරළෙ විවිධ සේවා සමුපකාර සංගමය විතර හොර ගුහාවක් ඒ පළාතේ කොහේවත් ඇත්තේ නැහැ. එහි සෑම අංශයකම හොරකම් තිබෙනවා. සමුපකාර බැංකුවෙන් ලක්ෂ 8ක අයිරාවක මුදල් අද නැති කර දමා තිබෙනවා. ඊයේ පෙරේදා පවත්වන ලද සංගමයේ රැස්වීමේදී තවත් ලක්ෂ එක හමාරක් ඉල්ලන්නට කතා කර තිබෙනවා. මේවා මහජන මුදල්. අර ලක්ෂ ගණනට වුණු දේ කුමක්දැයි දැනගන්නට බලංගොඩ ජනතාව පුලපුලා බලා සිටිනවා. ඒ පිළිබඳව රජයෙන් කුමන අන්දමේ තීරණයක් ගනිවිදැයි ඔවුන් බලාගෙන සිටිනවා. එහි තනතුරුවලට දමාගෙන සිටින්නේ සභාපති මහතාගේ නෑදයන් සහ දේශපාලන ඇම්බැට්ටයන් විතරයි. එම උදවියට විරුද්ධව ක්‍රියා කරන්නට ඒ මහතාට පුළුවන් කමක් නැහැ.

ඊයේ පෙරේදා සීනි හොරකමක් පිළිබඳව පොලීසියෙන් පැවරූ නඩුවකදී අබුසාලි මහතාගෙන් උසාවියේදී ප්‍රශ්න කළ විට ඒ මහතා කියා තිබෙනවා එතැන සිටින සේවකයන්ගෙන් දේශපාලන වැඩ ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්වත්තේ මිය.]

බව. ඒ මහතාගේ කටින්ම එය එළිදරව් වුණා. මෙයට මාස දෙකකට පමණ පෙර බලංගොඩ උසාවියේ පවරා දැනට විභාග වන නඩුවකදී ඒ කාරණා එළිදරව් වුණා. නමුත් සංගමයේ සාමාජිකයන් එක් අයකුටවත් විරුද්ධව අද වන තුරු නඩු පවරා නැහැ. එහි රුපියල් ලක්ෂ ගණනක හිඟයක් ඇති වී තිබෙනවා; නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අද වන තුරුවත් අරගෙන නැහැ. ඒ මහතා, තමාගේ ගමේ තිබෙන සමූපකාර සමිතියේ සභාපතිවරයායි; ඒ වාගේම පළාතේ බැංකුවේ සභාපතිවරයායි; ඒ වාගේම කුකුල් සමිතියක් පිහිටුවා රුපියල් ලක්ෂ ගණනක මුදලක් ලබාගෙන තිබෙනවා. නමුත් ඒ සමිතිය දැන් නැහැ, මුදලුත් නැහැ; නමුත් ඒ මහතාගේ පෞද්ගලික සමිතිය නම් දැන් බොහොම දියුණුයි. මේ අන්දමට සිදු වන හොරකම් කෙළවරක් නැහැ. ටයර් සොරකම්, යකඩ බඩු සොරකම්, කුළුබඩු සොරකම් අප්‍රමාණයි. මුට්ට පිටින් සොරකම් කරන විට අසු වී පොලිසියට ගෙන ගියත් අද වන තුරු ඒවා ගැන විභාගයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංගමයක් හරි හැටි පාලනය කරන්න බැරි, කිසිම දක්ෂකමක් නැති, එවැනි පුද්ගලයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ගෙන මහජන මුදල් කාබාසිනියා කරන්න තව දුරටත් ඉඩ සලසා දී තිබීම ගැන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්න කැමතියි. ඒ සමගම මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන මෙන් ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අතරම මෙබඳු පුද්ගලයන්ට විරුද්ධව නීත්‍යනුකූලව ක්‍රියා නොකරන්නේ මන්දැයි ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලංගොඩ සිට පැමිණි ප්‍රදේශයේ සිදු වන දේවල් සම්බන්ධයෙන්, ප්‍රදේශයේ සිදු වන අයථා දේවල් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවකාශ සැලසීම ගැන මා සතුටු වන අතර, ඒ සම්බන්ධයෙන් හැකි සෑම කරුණක්ම ඉදිරිපත් කිරීමට ඕනෑම අවස්ථාවක සූදානම් බව සඳහන් කරන්න කැමතියි. ඇත්ත වශයෙන් මේ කාරණා හෙළිදරව් නොකළොත් ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් මගේ යුතුකම් කොටස ඉටු නොකළා යයි හැඟෙනවා. බොහෝ විට අප ප්‍රකාශ කළාය කියා ප්‍රවෘත්ති පත්‍රවල නොයෙකුත් දේවල් පළ කරනවා. එම නිසා අප ඉල්ලා සිටින්නේ, අප ප්‍රකාශ කරන දේවල් ඒ ආකාරයෙන් නිවැරදි ලෙස පළ කරන ලෙසයි.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. මේ රටේ මහජනතාවට රටට සෙතක් වන සෑම දෙයකටම, සෑම ව්‍යාපාරයකටම අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. නමුත් ඊට ප්‍රථම සිදු වන දූෂණකම් මැඩීමට පියවර ගත යුතු බවද සඳහන් කළ යුතුව තිබෙනවා. මේ කරුණු ස්වල්පය සභාව ඉදිරියේ තබමින්, මෙම පනතට මගේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අ. භා. 6.9

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.** (හපුතලේ)
*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)*
(Mr. W. P. G. Ariyadasa—Haputale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමූපකාර තොග වෙළඳ ආයතනය සම්බන්ධයෙන් සාකච්ඡා වන මේ අවස්ථාවේදී වචන සවල්පයක් කථා කිරීමට මට ඉඩ දී පසුවට කථා කිරීමට කැමැත්ත පළ කළ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ටී. බී. තෙන්නකෝන් මයා.) මගේ කෘතඥතාව පළමුවෙන් පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1965 දී මේ රජය පිහිටුවන විට සමූපකාර තොග වෙළඳ ආයතනය පිළිබඳව විශාල ලෙස වැරදි හැඟීමක් ඇති වී තිබුණාය කියන කාරණය මෙහිදී හෙළිදරව් වුණා. කෙසේ හෝ වේවා, සමූපකාර තොග වෙළඳ ආයතනය වාගේ ආයතන මේ රටේ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බව මේ රජය පිළිගෙන තිබීම සන්තෝෂයට කාරණයක්. මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වන්නේ දීර්ඝ කථාවක් කිරීමට නොව, චෝදනා එකක් දෙකක් ඉදිරිපත් කිරීමට පමණයි. චෝදනා ඉදිරිපත් කරනවාය කිව්වත්, අස්ථාන චෝදනා ඉදිරිපත් කිරීමට නොවෙයි මා බලාපොරොත්තු වන්නෙ. මා හිතනවා මේ කරුණු ගැන සාකච්ඡා කර ගෙන යන විට රාජ්‍ය ඇමතිතුමාට පවා යම්කිසි හැඟීමක් ඇති වේවිය කියා.

දැනට හපුතලේ ඡන්දදායක කොට්ඨාශයේ තොග වෙළඳ ආයතන 3 ක් පිහිටුවා තිබෙනවා. ඒ වගේම තවත් අවශ්‍ය ස්ථානවලද තොග වෙළඳ ආයතන පිහිටුවීමට අදහස් කළා. ඒ වගේම ඊට වුවමනා කරන දේවල් සපයා ගොඩනැගිලිත් සූදනම් කරගෙන අවශ්‍ය දේවල් පිළියෙල කර තිබුණා. නමුත් ඒ වෙළඳ ශාලාවල් විවෘත නොකර ඒ පිළියෙල කරන ලද බඩු බාහිරාදිය ඒ ස්ථානවලින් අස් කර ගෙන යාම නිසා අද ඒ ස්ථානවලට ඒ වෙළඳ සැල් නැතිව ගොස් තිබෙනවා. නිදර්ශනයක් වශයෙන් හපුතලේ ඡන්ද කොට්ඨාශයේ කොස්ලන්ද නගරයේ තොග වෙළඳ ආයතනයක් පිහිටුවීම සඳහා ගොඩනැගිලි සකස් කර ඊට අවශ්‍ය දේවල් සපයා වෙළඳ සැල විවෘත කිරීමට මූලික වශයෙන් අවශ්‍ය හැම දෙයක්ම සූදනම් කර තිබුණා. වෙළඳ සැල විවෘත කිරීම පමණයි කළ යුතුව තිබුණේ. ඒ අවස්ථාවේදීයි මේ අලුත් රජය පිහිටුවීමට පුළුවන් වුණේ. අලුත් රජයෙන් මොකක්ද කළේ? අර පිළියෙල කර තිබුණ සියලු දෙයක්ම කොළඹට රැගෙන ආවා. ඒ නිසා එම වෙළඳ සැල විවෘත කිරීමට පුළුවන්කමක් තිබුණේ නැහැ.

ඒ වගේම බණ්ඩාරවෙල නගරයෙහිද වෙළඳ සැලක් විවෘත කිරීමට කටයුතු පිළියෙල කර තිබුණා. බණ්ඩාරවෙල නගරය විශාල නගරයක් නිසා ඒ නගරයට තොග වෙළඳ ආයතනයක් අවශ්‍ය බව මේ රජය වුණත් පිළිගන්නවා ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
සිල්ලර වෙළඳ ආයතනයක්.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)
සතොස ආයතනයක්. ඒ ප්‍රදේශයට සතොස ආයතනයක් අත්‍යවශ්‍යයි. ඒ නගරයේ වෙළඳ සැල විවෘත කිරීමට අවශ්‍ය හැම දෙයක්ම සූදනම් කර තිබෙන අවස්ථාවකයි, අර කොස්ලන්ද නගරයේ විවෘත කිරීමට බලාපොරොත්තු වුණ වෙළඳ සැල වෙනස් කළා වාගේම මේ නගරයේ පිහිටුවීමට සූදනම් කර තිබුණ වෙළඳ සැලක් වෙනස් කරන්න යෙදුනේ. බණ්ඩාරවෙල නගරය විශාල, ඒ වගේම ජනාකීර්ණ, නගරයක්. ඒ තරම් ජනකීර්ණ ප්‍රදේශයකට අද එකම තොග වෙළඳ සැලක්වත් නොතිබීම ඇත්ත වශයෙන්ම කනගාටුවට කාරණයක්ය කියන්න පුළුවනි. ඒ වගේම මේ රජයත් ඒ කරුණ පිළිගන්නවා ඇති.

දැනට හපුතලේ ඡන්දදායක කොට්ඨාශයේ පිහිටුවා තිබෙන වෙළඳසැල් තුනෙන්ම ඒ ප්‍රදේශයට විශාල සේවාවක් සිදු වන බව කවුරුත් පිළිගන්නවා ඇති. මා හිතනවා මේ රාජ්‍ය ඇමතිතුමා දියතලාවේ යුද්ධ හමුදා මූලස්ථානයට ගිය අවස්ථාවේදී එතුමාට ඒ බව හොඳට පැහැදිලි වෙන්න ඇත කියා.

ඒ වගේම දියතලාව ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක්. යුද්ධ හමුදාවේ විශාල පිරිසක් නැවතී සිටින ප්‍රදේශයක්. ඒ හමුදාවේ සේවය කරන සේවකයන්ටත්, ඒ වගේම ප්‍රදේශයේ පුරවැසියන්ටත් විශාල සේවයක් එයින් සිදුවුණාය කියන එක කවුරුත් පිළිගන්නවා.

හල්දුම්මුල්ල නගරයේත්, කොස්ලන්ද නගරයේත් පිහිටුවීමට සූදනම් කර තිබුණ තොග වෙළඳ ආයතන ඒ ස්ථානවලින් වෙනස් කර ඇමූ මේ රජය විසින් එම ආයතනයක් ඇඹිලිපිටියේ පිහිටුවීමට යනවාය කියා අපට දැනගන්න ලැබුණා. එය දැනගන්න ලැබුණ විගසම ඒ සම්බන්ධයෙන් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කළා. හල්දුම්මුල්ලට වෙළඳ සැලක තිබෙන අවශ්‍යතාව සම්බන්ධයෙන් මා ගරු රාජ්‍ය ඇමතිතුමාට ලියා යැව්වා. ඇමතිතුමා මට එයට පිළිතුරක් එවා තිබුණා. දේශපාලන වශයෙන් නම් මට එය හරිම ප්‍රයෝජනවත්. හල්දුම්මුල්ල, කොස්ලන්ද ආදී නගර ඒ තරම් ජනාකීර්ණ ප්‍රදේශ නොවෙයි, ඒ නිසා ඒ ප්‍රදේශයෙන් මෙම වෙළඳ සැල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

වෙනස් කර ඇඹිලිපිටියට එය ගෙන යන්න අදහස් කරනවාය කියා එතුමා මට ලියා එවා තිබුණා. මා ගොස් මගේ ඡන්දදායක කොට්ඨාශයේ සිටින අයට කිව්වා, මගේ අවබෝධය අනුව කොස්ලන්ද, හල්දුම්මුල්ල වැනි නගර ජනාකිර්ණ ප්‍රදේශ නිසා එම නගරවලට වෙළඳ සැලක් පිහිටුවන්නවය කියා රාජ්‍ය ඇමතිතුමාට මා කියා සිටියත්, මේ ප්‍රදේශ ජනාකීර්ණ ප්‍රදේශ නොවෙයි, ඒ නිසා එම වෙළඳ සැල ඇඹිලිපිටියට ගෙන යනවාය කියා මට රාජ්‍ය ඇමතිතුමා ලියුමක් එවා තිබෙනවාය කියා.

ඊට පසු මෙය හල්දුම්මුල්ල නගරයේ බරපතල ප්‍රශ්නයක් බවට පරිවර්තනය වුණා. ඒ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ සාමාජික මහතුන් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල කරදරයකට මුහුණ පෑවා. සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ ශාඛාවක අවශ්‍යතාව අවබෝධ වුණු නිසා පසුගිය ආණ්ඩුව පවතිද්දී එම ශාඛාවක් හල්දුම්මුල්ලෙ පිහිටුවීම අනුමත කළ නමුත් මේ ආණ්ඩුව එය වසා දමන්නට යන බව මහජනයාට කියා සිටින්නට අපට සිදු වුණා.

ඒ ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක් නොවන නිසා ඒ ශාඛාව ඉවත් කොට එය ඇඹිලිපිටියේ පිහිටු වීම සුදුසු බව රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. එහෙත් සිදු වුණේ මොකක්ද? ඒ ශාඛාව වසා දමුවහොත් තැපැල් ඇමතිතුමාට හපුතලේ කොට්ඨාශය තරඟ කිරීමට නොව ඒ කොට්ඨාශයට එන්නටවත් ඉඩක් නොලැබෙන බවට එතුමාට පැමිණිලි ලැබීම නිසා හය මාසයක් පමණ ඒ ශාඛාව වසා දමා තිබී නැවත තැපැල් ඇමතිතුමා පැමිණ එය විවෘත කරන්නට සූදානම් වුණු වේලේ කොල්ලන්ගේ කැළෑ පත්තර නිසා එය ඒ විධියට විවෘත කරන්නට බැරි වුණා. කෙසේ වුණත් ඒ වෙළෙඳ ආයතනය දැන් ඒ විධියටම තිබෙනවා. ඒ ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක් බව දන්නම් ආණ්ඩුවට පෙනී තිබෙන බවයි, එයින් පෙනී යන්නේ. කොහොම වුණත් ඒ වෙළෙඳ ආයතනයට අවශ්‍ය බඩු නියම අන්දමට ලැබෙන්නේ නැහැ. එදා බඩු ලැබුණු විධියට අද බඩු ලැබෙන්නේ නැහැ. දියතලාවට විශාල වශයෙන් බඩු අවශ්‍යයි. දියතලාව ජනාකීර්ණ ප්‍රදේශයක්. එය ජනාකීර්ණ ප්‍රදේශයක් නොවන බව පෙන්වීමට නිලධාරීන් වාර්තා සපයා ඇත්දැයි මා දන්නේ නැහැ. ඇත්තෙන්ම දියතලාව නගරය පමණක් නොව ඒ ප්‍රදේශයේ ගම්මානත් ජනාකීර්ණ බව පසුගියදා ගරු අගමැතිතුමාට පැහැදිලි වන්නට ඇති. ගරු අගමැතිතුමා පසුගියදා දියතලාවට කිට්ටු හපුතලේගම පැවති උත්සවයකට සහභාගි වුණා. එදා පැමිණ සිටි ජනගහණය ගැන කල්පනා කරන විට ඒ ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක් බව ගරු අගමැතිතුමාට පෙනී යන්නට ඇති. ඒ ජනාකීර්ණ ප්‍රදේශයේ මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියා කරනවා නම් කෘතඥ වෙනවා. හපුතලේ, හල්දුම්මුල්ල, දියතලාව යන ස්ථානවල ඇති ශාඛා තුනට අවශ්‍ය බඩු නියම අන්දමට ලබා දෙන්නට ක්‍රියා කරන අතරම විවෘත කිරීමට වුවමනා යයි නිගමනයට බැස තිබුණු කොස්ලන්දේ ශාඛාව හැකි ඉක්මනින් විවෘත කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමා (ආර්. එම්. අප්පුහාමි මයා.) මේ අවස්ථාවේදී මෙහි හිටියා නම් බණ්ඩාරවෙල නගරයට සතොස ශාඛාවක ඇති අවශ්‍යතාව ගැන කථා කරනවාට සැකයක් නැහැ. බණ්ඩාරවෙල ප්‍රදේශයත් ජනාකීර්ණයි. ඒ වාගේම බණ්ඩාරවෙල විශාල නගරයක්. ඒ නගරයට සතොස ශාඛාවක් අවශ්‍යයි. සතොස ශාඛා තිබෙන තැන්වලින් මහජනයාට නියම මිළට පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගන්නට පුළුවන්කම තිබෙන නිසා දැනට විවෘත කර තිබෙන ශාඛාවලට අවශ්‍ය බඩු කලට වේලාවට ලබා දෙන මෙන් නැවතත් ඉල්ලා සිටින අතර මට මෙම අවස්ථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 6.19

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර තොග වෙළෙඳ ආයතනය පිළිබඳව ඉදිරිපත් කර ඇති මෙම සංශෝධන පනත පිළිබඳව මාත් වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුයි. සමුපකාර තොග වෙළෙඳ ආයතනය ඇති කෙළේ 1950 අවුරුද්දේ-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් 1956 වන තුරු ඒ ආයතනය පළල් වශයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ. සාමාන්‍ය ජනතාවට අවශ්‍ය බඩුමුට්ටු පහසු අන්දමට හා අගහිඟයක් නැතිව ලබා දීම සඳහායි, එදා සතොස ආයතනය ඇති කරන ලද්දේ. එහෙත් 1964 න් පසු එය සිදු වී තිබෙනවාද කියා අපි කල්පනා කර බැලුවොත්, එසේ නැත්නම් අපි කාගෙන් හෝ ඇසුවොත්, අපට "නෑ" කියන ලොකු අකුරක් පමණයි යොදන්නට සිදු වී තිබෙන්නේ. එදා සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් ජනතාවට සැලසී තිබුණු පහසුකම් සම්පූර්ණයෙන්ම නැති වී තිබෙනවාය කියන එක අපට ස්ථිරවම ප්‍රකාශ කරන්නට පුළුවන්. ඒවා ගැන කල්පනා කරගෙන ගියොත් සේවකයින්ට වැටුප් ගෙවීම ආදිය කරනවා මිස ඒ මගින් බඩු බෙදීමක් හෝ වෙන යම් සේවයක් ඇති වන්නේ නැති බව පෙනෙනවා. 1964 ට කලින් නම් සිංහල අවුරුද්ද කාලයේදී කඩවල පෝලිම් තිබුණා. එහෙත් මෙවර පෝලිම් නැහැ. පෝලිම් නැතිවීමට හේතුව බඩු නැතිකමයි. නුවර දළදා වීදියේ බැංකුවට අල්ලපු ස්ථානයේ තිබෙන කඩයට මා ගියා. එහි සේවය කරන අය මා සමග කීවා සේවකයින් 20 ක් 30 ක් පමණ එහි සේවය කරනවාය, එහෙත් විකුණන්නට රෙදි කෑල්ලක්වත් නැත කියා. අල්මාරි දිහා බලන්න කියා මට කීවා. එහි රෙදි තිබුණේ නැහැ. අනිකුත් වෙළඳ සැල්වලත් ඒ තත්ත්වයයි තිබුණේ. කිසි තැනක බඩු තිබුණේ නැහැ. හැබැයි 8 වැනිදා පමණ වෑන් රථවල ශබ්දවාහිනී යන්ත්‍ර සවි කරගෙන නුවර නගරයේ ප්‍රසිද්ධ කරගෙන ගියා ඕනෑ තරම් රෙදි තිබෙනවාය, ඕනෑම කඩයකට ගොස් රෙදි නැතෙයි කියනවා නම් පැමිණිලි කරන්නය කියා. වෑන් රියෙන් එසේ ප්‍රචාරය කළත් කඩවල රෙදි නැහැ. ඒ අයගේ බේරීමට එවැනි ප්‍රචාරයක් කරගෙන ගියා. මිනිස්සු ගිහින් බැලින් නම් රෙදි නැහැ. අන්තිමේ ඔවුන් බැන බැන ගියා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
වගා වැන් එකක්ද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennakoon)

එය වගා වැන් එකක් නොවෙයි. සමුපකාර තොග වෙළඳ ආයතනයට අයිති එකක්. 1964 දී ගරු රාජ්‍ය ඇමතිතුමා ඇතුළු මේ කණ්ඩායම කියා හිටියේ බොහොම ලාභයට රෙදි දෙනවාය, පෝලිම් නැති කරනවාය කියලයි. එවැනි ලොකු පොරොන්දුවක් දුන්නා. එහෙත් පසුගිය සිංහල අවුරුද්ද දිනවලත් අනිකුත් දිනවලත් සතොස කඩයකින් හෝ අනිකුත් ස්ථානයකින් හෝ රෙද්දක් ගන්නට ගිය විට වැඩි ගණනකටයි එය ගන්නට සිදු වුණේ. එසේ මිල වැඩි වී තිබෙන්නේ රෙදිවලට පමණක් නොවෙයි. හැම දේකම මිල වැඩි වී තිබෙනවා.

අපේ ආණ්ඩුව තිබුණු කාලයේ සත 50 කට හාල් සේරු දෙකක් ලැබුණා. දැන් එක හාල් සේරුවක් නිකම් ලැබෙනවා; අනික ගන්න 1.60 ක් ඕනෑ. ඉස්සර 2 ක් සත 50; දැන් එකක් නොමිලේ අනික 1.60 යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුදුමය මේකයි. කොළඹ හාල් සේරුවක් 1.50 යි. නුවර 1.60 යි. හාල් උපදින දඹුල්ලේ 1.70 යි. හාල් උපදින දඹුල්ලට වඩා නුවර ලාභයි. නුවරට වඩා කොළඹ ලාභයි. ඔන්න ඔය පිළිවෙළයි අද තිබෙන්නේ. ඒ කාලයේ පාන් රාත්තලක් සත 27 යි. දැන් සත 35 යි. අනික මේ වගාව කර තිබෙන අතර තුර පාන් ගැනත් කියන්නට කැමතියි. අපේ සීගිරිය වටේ ඇති කෝරළේ 1964 දී දවසකට විකුණුනේ පාන් රාත්තල් 20 යි නැත්නම් 22 යි. එහෙත් අද පාන් රාත්තල් 1,200 ක් නැතිව ඒ කෝරළේ අයට ජීවත් වන්නට බැහැ. ඒ ප්‍රදේශය වගා ව්‍යාපාරය පවතින ප්‍රදේශයක්. එවැනි ප්‍රදේශයක් වන ඉනාමළුව කෝරළයට පාන් රාත්තල් 1,200 ක් ඕනෑ. ඉස්සර පාන් රාත්තල් 20 ක් හෝ 22 ක් විකුණුනු ගම්වලට ගොස් බේකරිකාරයින්ගෙන් අසා බලන්න අහවල් ගමට රාත්තල් කීයක් ඕනෑද අහවල් ගමට රාත්තල් කීයක් ඕනෑද කියා. හැබැයි, මේ ගොවි ප්‍රදේශවල වගාවත් තිබෙනවා: හේනුත් කුඹුරුත් තිබෙනවා. නමුත් අද තත්ත්වය ඕකයි. පාන් රාත්තලක් ශත 35 යි, 38 යි. සමහර විට පාන් රාත්තලකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

ශත 40 බැගිනුත් අපට ගෙවන්නට සිද්ධ වෙනවා. මේක පාන් පරාක්‍රම කාලයද කියා මා දන්නේ නැහැ.

එතකොට පරිප්පු ඒ කාලයේ ශත 45 ට ගන්නට පුළුවන්කම තිබුණා. දැන් පරිප්පු රාත්තලක් ශත 55 ක් වී තිබෙනවා. ඒකත් මාසයකට වතාවක් අවුන්ස ගණනින් ලැබෙන්නෙ. මාසයකට වරක් අවුන්ස හයක් පමණ ලැබෙනවා. සමහර විට ඒකත් ලැබෙන්නෙ නැහැ. සමහර කඩකරුවන් මගදීම පරිප්පු ටික විකුණා ගන්නවා. පරිප්පු එන දවස, දෙන දවස මිනිසුන් දන්නේ නැහැ. පරිප්පු පිළිබඳව තිබෙන තත්ත්වය ඒකයි. ඒ කාලයේ අල රාත්තලක් ශත 30 කට පමණ ගන්නට පුළුවන්කම තිබුණා. ඊටපසු අල රාත්තලක් රුපියල් 1.30 දක්වා ඉහළ ගොස් දැන් නම් මිළ ටිකක් පහළ බැස තිබෙනවා. ඒ කාලයේ හාල් මැස්සන් රාත්තලක් ශත 70 යි. නමුත් අද හාල් මැස්සන් රාත්තලකට රුපියල් 2.30ක් ගෙවන්නට මහජනයාට සිද්ධ වී තිබෙනවා. කරවල ගැන තිබෙන තත්ත්වය පුදුමයි.

දඹුල්ලේ සතොසේ කඩයක් තිබුණා. ඒ කඩේ රෙදිපිළි, කරවල ඔය ආදී වුවමනා කරන ද්‍රව්‍ය සියල්ලක්ම තිබුණා. නමුත් ඒ කඩේ වසා දැමුවා. වසා දමා සංගමයට භාර දුන්නා. සංගමයට භාර දුන්නාට පසු දැන් එතැනට යකඩ බඩු ගෙනැවිත් දමා තිබෙනවා. කලින් එතැන පෝලිමක් තිබුණා. නමුත් දැන් එතැන පෝලිම නැති කර තිබෙනවා. යකඩ බඩු, ඇන යනාදිය ගන්නට පෝලිම්වල යන්නට වුවමනාවක් නැහැ. පසුගිය අවුරුදු දවස්වල මේ ස්ථානයට කරවල ගෙනැවිත් තිබුණා. කරවල හතර වර්ගයක් ගෙනැවිත් තිබුණා. කරවල වුවමනා නම් ඒ හතර වර්ගයෙන්ම රාත්තල බැගින් ගන්නට ඕනෑ. හතර වර්ගයෙන්ම රාත්තල බැගින් ගත්තේ නැත් නම් කරවල ලැබෙන්නේ නැහැ. ඉතින් අපේ ප්‍රදේශවල දුප්පත් මිනිසුන්ට වරකට කාලකට වඩා ගන්නට ශක්තියක් නැහැ. එක වර්ගයෙන්ම විකුණුනොත් අනික් ඒවා විකිණෙන්නේ නැති නිසා හතර වර්ගයෙන්ම රාත්තල බැගින් ගන්නට ඕනෑය කියා කිව්වා. ඊටපසු අවට සිල්ලර කඩවලට කරවල ටික විකුණා තිකම් සිටියාය කියා මට ආරංචියි. සාමාන්‍ය මිනිසුන්ට ඒ කරවල ලැබුණේ නැහැ. ඊළඟට, නෙස්ටෝමෝල්ට් රාත්තලේ ටින් එකක් ඒ කාලයේ රුපියල් 2.55 කට ගන්නට පුළුවන්කම තිබුණා. දැන් නෙස්ටෝමෝල්ට් රාත්තලක් රුපියල් 4.90 යි. ඒ කාලයේ පොප්ලින් යාරයක් රුපියල් 1.70 කට ගත්තා. අපේ ආණ්ඩුව තිබෙන කාලයේ කූපනයකට යාර හයක් ගන්නට පුළුවන්කම තිබුණා. කූපනයකට යාර හය බැගින් ගෙන අප රෙදි මසා ගත්තා; බැනියන් කමිස ආදියත් මසා ගත්තා. නමුත් අද කූපනයකට ලැබෙන්නේ යාර දෙකයි. ඒ යාරයක මිළත් රුපියල් 2.12 යි.

කූපන්වලට නියමිත ස්ථානවලින් රෙදි ගන්නට පුළුවන්කම තිබෙනවාය කිව්වත් කඩවල් පන්සියයකට ගියත් ඔය යාර දෙකවත් ගන්නට පුළුවන්කමක් නැති බව මා රාජ්‍ය ඇමතිතුමාට කියන්නට සතුටුයි. ඒවා ගත හැක්කේ කළු කඩයෙන් පමණයි. කූපන්වලට යාරයකට රුපියල් 2.12 බැගින් ගෙවා නියමිත ස්ථානවලින් රෙදි ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. කූපනයකට දෙන යාර දෙකවත් ලබා ගන්නට තැනක් නැහැ. ඊයේ රාත්‍රි මා මහනුවර කඩයකට ගියා. නියමිත මිළ රුපියල් 2.12 යි. අපට කූපන් තිබෙනවාය කියා මා කිව්වා. එතකොට වෙළෙන්දා කිවේ කුමක්ද? නියමිත මිළ රුපියල් 2.12 යි තමයි, නමුත් ඔය කූපන්වලට රෙදි ගැනීම කරදර සහිතය, රුපියල් තුනකුත් ගානක් දී කරදරයක් නැතිව එක පාරටම රෙදි ගැනීම ඊට වඩා හොඳය කියා ඔහු කිව්වා. සමහර විට මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට නම් ඒ ඒ ස්ථානවලින් රෙදිපිළි ලැබෙනවා ඇති. නමුත් අපට නම් වුවමනා කරන රෙදි ටික ගන්නට පුළුවන්කමක් නැහැ; සාමාන්‍ය මහජනයාට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. අපේ කාලයේ වේට්ටියක් රුපියල් 7 යි. වේට්ටියක් රුපියල් දෙකට තුනට දෙනවාය කියා ඡන්ද රැස්වීම්වලදී නම් කිව්වා. නමුත් දැන් වේට්ටියක් රුපියල් 12 කින් අඩුව ගන්නට පුළුවන්කමක් නැහැ. රුපියල් 12කින් අඩුව ලංකාවේ වියන එකක්වත් ගන්නට පුළුවන්කම්ක් නැහැ. අපේ කාලයේ හොඳ සරමක් රුපියල් 6 කට බොහොම ලෙහෙසියෙන් ගන්නට අවස්ථාව තිබුණා. නමුත් දැන් රුපියල් 10 කින් මෙහා සරමක් ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැණැ· අර පිජාමා සරම් නම් ඊටත් වඩා මිළයි. පිටකොටුවට ගොස් බලන්න. එවැනි සරමක් නම් රුපියල් 12කින් 13 කින් 15 කින් මෙහා ගන්නට බැහැ. ඒ, බඩු ලාභ කර තිබෙන හැටි තමා.

දඹුල්ල ප්‍රදේශයේ ගලේවෙල කන්දපල්ල කෝරළයේ වාසය කරන 20,000ක් පමණ දෙනාගේ ප්‍රයෝජනය සඳහා සමුපකාර තොග වෙළඳ ආයතනයේ වෙළඳශාලාවක් ගලේවෙල විවෘත කළා. කන්දපල්ලෙ කෝරළයේ අය පමණක් නොව උඩුගොඩ පල්ලෙසිය පත්තුවේ හා උඩුගොඩ උඩසිය පත්තුවේ අයත් ගලේවෙලට පැමිණ මේ වෙළඳ ශාලාවෙන් බඩු ලබා ගත්තා· අද එහි ඉන්නේ සේවකයන් පමණයි. ඔවුන්ට පඩි ගෙවන්නේ කොහොම්දැයි මා දන්නේ නැහැ. ඒ වෙළඳ ශාලාවෙන් මහජනතාවට ඉමහත් ප්‍රයෝජන සැලසුනාත්, මේ රජය බලයට පත් කිරීම සඳහා උදව්කළ වෙළෙන්දන්ට උපකාර කිරීම සඳහා, කලින් මහජනතාවට ඉමහත් සේවයක් සැලසූ ඒ වෙළඳ ශාලාව අභාවයට යන්න ඉඩ හැර තිබෙන බව දැන් ඒ පළාතේ අය අවබෝධ කරගෙන තිබෙනවා. ඒ වෙළඳ ශාලාව සමුපකාර තොග වෙළඳ ආයතනයට භාර දී එහි යකඩ බඩු දමා ඇතත්, එය භාරව සිටින නිලධාරීන් එය පාලනය කරන්නේ සමුපකාර ප්‍රතිපත්ති අනුව නොවෙයි. මහජනතාව සමග හෝ සමුපකාර සමිති සමග හෝ ඔවුන්ගේ කිසි සම්බන්ධයක් නැහැ. " සංගමය " යනුවෙන් බොරුවට නමක් ඇදාගෙන තිබුණත් එයින් මහජනයාට කිසිම සහනයක් සැලසෙන්නේ නැහැ.

හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා·) කීවා වාගේ ජනාකීර්ණ ප්‍රදේශවල වෙළඳ ශාලා විවෘත කිරීමේ ප්‍රතිපත්තිය උඩ, මාදිපොළ හන්දියේ විශාල ගොඩනැගිල්ලක් අරගෙන, එහි රාක්ක ගසා අනෙක් සියලු කටයුතුත් නිම කර, විවෘත කිරීමට ඉතාම ආසන්න තත්ත්වයකින් තිබුණා. එහෙත් මේ රජය බලයට පත් වූ පසු ඒ අදහස වෙනස් කර, ගොඩනැගිල්ල මාස තුනක් වසා තබා ගැනීම නිසා ගොඩනැගිලි හිමියාට පොරොන්දු වූ පරිදි තුන් මාසයක කුලිය ගෙවා තිබෙනවා.

කවුරුන් ඇමතිකම් දැරුවත්, කවුරුන් පාලන බලයේ හිටියත්, සමුපකාරයේ පරමාර්ථය විය යුත්තේ සාමාන්‍ය මහජනතාවට අඩු මිළට හා පහසුවෙන් බඩු ලබා දීම නමුත්, දැනට වැඩ කටයුතු කෙරීගෙන යන හැටියට නම් එවැන්නක් සිදු වන්නේ නැහැ. අද සමුපකාර තොග වෙළඳ ආයතනය ප්‍රපාතයෙනුත් ප්‍රපාතයට වැටී මිනිසුන්ට කරදරයක් වී තිබෙනවා. එම නිසා තම දස්කම් පා මහජනතාවට අඩු මිළට බඩු ලබා ගැනීමේ පහසුකම් සලසා දෙන ලෙස රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි· ඒ මිස, මිනිසුන්ගේ වුවමනා එපාකම් ඉටු වන්නේ නැති නම් මෙවැනි අණ පනත් සම්මත කිරීමෙන් ඇති වැඩක් නැහැ.

මේ රජය පටන් ගත් හැටියේම සමුපකාර තොග වෙළඳ ආයතනයේ දූෂණ සොයා බැලීමටය කියා කොමිෂන් සභාවක් පත් කළා. වැරදිකරුවන්ට දඬුවම් දී ඉදිරියේදී එවැනි වැරදි ඇති නොවන්නට කටයුතු කරන බවක් ඒ කාලයේදී කියවුණා. එහෙත් සමුපකාර තොග වෙළඳ ආයතනයේ ගත යුත්තකට තිබුණු දෙයත් දැන් නැති වේගන යනවා. සමුපකාර තොග වෙළඳ ආයතනය තුළ සමුපකාර ප්‍රතිපත්ති නැති වේගෙන යන අතරම, එම ආයතනය සතුව තිබුණු බලතල ටිකත් ටිකෙන් ටික අඩු වේගන යනවා. එම ආයතනයේ එක එක කොටස් දැන් වෙනත් ආයතනවලට පවරා දෙමින් එම ආයතනය සම්පූර්ණයෙන් විනාශය කරා ගමන් කරවනවා. එම නිසා, නියම විධියට මිනිසුන්ට ප්‍රයෝජන සැලසෙන ආකාරයේ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6.35

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Mr. Deputy Speaker, it was not my intention to take part in this Debate, but when I heard some of the remarks I was highly amused and I thought I should say a few words.

The hon. Member for Dambulla commented on the availability of goods. As an example, he said that where only twenty-two loaves of bread had been bought, now a thousand loaves are being bought. Did he not give the show away by that remark ? I would invite him to make that speech all over the country. As a matter of fact, I would like to ask him, where did the money come from to buy the thousand loaves instead of the twenty-two ? " He will realize, if he looks a little further, that there is a tremendous transfer of income to the rural areas. It is true that prices are higher, but the people are buying. That is the main point. The people have the money to buy.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

රුපියල් තුනේ කුලියකර ලබාගත් මුදල් මිස වෙනත් සල්ලියක් ඒ මිනිසුන් ලඟ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Whatever the reason, there has been a tremendous transfer of income to the rural areas. The people in the rural areas are buying articles which they had never bought before.—[*Interruption*]. I did not interrupt him at all. I was too amused to interrupt him.

Then, if hon. Members look back to the time of the Sinhalese New Year and look at the figures, they will realize that things were bought on an unprecedented scale this last Sinhalese New Year. That is a fact. You cannot hide that fact. The people will tell you that.

I am amazed at what short memories people have. We heard of the wonderful C. W. E. of their time, and they wanted to know what has happened to this C. W. E. in our time. Well, there is an interesting book about the wonderful C. W. E. of their time. It is the report of the commission on the C. W. E.

I shall not take the time of the House reading all the interesting passages in this commission's report, but it is very amusing and interesting reading. I shall read only a few passages. Some of the headings of the chapters are also very interesting. Chapter XXII of Part I has the heading, "The Mass Appointments of December 1964 and January 1965." That is after the Dissolution of Parliament and before the General Elections. Now, that was the heading. Paragraph 12 gives " some details of the 819 mass appointments ".

> " The majority of the 819 appointments were made between 1st and 8th January 1965. "

It was after Parliament was dissolved that these appointments had been made, when the hon. Leader of the Opposition, the then Prime Minister, introduced at Kegalla the then Chairman of the C. W. E. as the candidate—

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය. (අත්තනගල්ල)**
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டார நாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

ඕක තමයි කියන්නෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඕක තමයි හැම තැනම කියන්නෙ. මම තව කියල ඉවර නැ. ඉවර වෙන තුරු ටිකක් ඉන්න.

These were the mass appointments. The figure is 819. I quote :

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"The breakdown of this figure is as follows :

| | Total appointments between 1.12.64 to 10.1.65 | Appointments between 1.1.65 to 10.1.65 |
|---|---|---|
| Salesmen | 515 | 387 |
| Labourers | 233 | 149 |
| Watchers | 71 | 56 |
| | 819 | 592 |

In addition to these 819 appointments, there were 127 other applications approved by the Chairman for appointments where letters of appointment had not been issued to the applicants by the Administration Branch. Out of the 819 appointments, 118 were appointees from the Dedigama Electorate consisting of 69 salesmen, 21 labourers and 28 watchers."

I know what all those salesmen and watchers did ! I quote further :

"Out of the 127 approved by the Chairman for appointment (but who were not issued letters of appointment) 38 were from the Dedigama Electorate."

That is one. Then, the next one :

"MORE INTERFERENCE IN APPOINTMENTS After Mr. R. D. Senanayake"—

That is the person who contested me at Dedigama—

—" resigned from the post of Chairman and Director of the C. W. E. Board, there was found in a filing cabinet in his office an accumulation of over 1,000 letters and chits, the majority of which were from S. L. F. P. and L. S. S. P. Parliamentarians and other members of the two parties, requesting appointments in the C. W. E. for various persons. Most of the persons recommended had, however, not yet received any appointment. The reason for this would appear to be that notwithstanding the inordinate number of unnecessary appointments which were being made on similar requests during the last few months of Mr. Senanayake's tenure of office as Chairman neither he nor Mr. W. L. D. Jayawardene could keep pace with the hundreds of letters of recommendation brought by persons who called regularly at the C. W. E. Headquarters seeking appointments."

Then, another one is this :

"SALE OF EXPENSIVE INDIAN SAREES TO A PRIVILEGED FEW"

I am only taking the spicy bits from here and there ; there are many of them. These sarees were air-freighted at tremendous expense on the ground that it was necessary to sell them before the New Year. I quote :

"The C. I. F. value of these purchases was Rs. 208,160.18. A portion of these sarees was air-freighted, namely, the Benares-Manipuri pure silk sarees, pure silk printed sarees and the pure silk Batik print sarees."

ගරු වන්නිනායක

(கௌரவ வன்னிநாயக்க)

(The Hon Wanninayake)

කවුද ඕව ගත්තෙ ?

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்லி சேனநாயக்க)

(The Hon. Dudley Senanayake)

ගත්තු අයගේ නම් මේකේ තියෙනවා. මම කියන්නම්.

"After the air-freighted sarees arrived in Colombo,"—

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.

(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)

(Mrs. Sirimavo Bandaranaike)

දැන් හොරෙන් ගේනවා.

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்லி சேனநாயக்க)

(The Hon. Dudley Senanayake)

හොරෙන් ගේනවට වැඩිය නරකයි මේවා. අළුත් අවුරුද්දට දුප්පතුන්ට දෙන්න ගෙනත් කවුද ගත්තෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

Who ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

I shall mention them. This is what was done by an official.

I quote :

"'I think we telephoned the various people and asked them to come for the exhibition. Some of the V.I.PP. who came to the display booked sarees and the C. W. E. staff were directed to make a note of these bookings. After the display the sarees were removed to Jawatte Stores.'"

Then he says that a directive was issued that the sarees be issued in singles.

Now I come to "කව්ද ගත්තෙ."

One of the officials giving evidence has said :

"He took about 50 to 100 sarees by car."

"I have made an appointment with the Prime Minister, hurry up. Put this into a car and take them to 'Temple Trees.'"

All these particulars are in the commission's report.

"Soysa stated that he took with him cash memo book No. 17707. At Temple Trees a lady met him and took the sarees upstairs. Some sarees were selected and Mrs. Bandaranaike's name was first entered in cash memos Nos. 885301 and 885302 and later entered as a credit sale. Altogether 17 sarees were purchased at Rs. 989.50 on the 12th June, 1962. Payment for this purchase was made on the 10th July, 1962, and a receipt—C. W. E. 100 receipt No. 307471 issued for it."

These were air-freighted to be sold to the *duppathas* before the Sinhalese New Year, and these are the *duppathas* who bought them. Paragraph 7 at page 75 of Part II states :

"On the same day, (12th June, 1962) according to cash memo No. 885303, filled in by Soysa, six sarees were sold to Mr. Felix Dias Bandaranaike for Rs. 281. Subsequently, the date on the cash memo was altered to the 18th June, 1962."

This was the wonderful C. W. E. that they administered and the wonderful C. W. E. that we ruined! I was amused by some of the remarks made by hon. Members of the Opposition, and that was why I thought I should interpose a few observations.

අ. භා. 6.48

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)
*(திரு. எம். பீ. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව කථා කරන්නට මා අදහස් නොකළ නමුත් ගරු අගමැතිතුමාගේ කථාවෙන් පසු මාත් වචන සවල්පයක් කථා කළ යුතු යයි මට හිතුණා. දඹුල්ල පළාතේ ජනතාව දහස් ගණනක් අද පාන් කා ජීවත් වන බව දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. ඒ උදවිය පාන් කන්නේ හාල් සේරුවක් ගන්නට පුළුවන් තත්ත්වයක් ඔවුන්ට නැති නිසායි. හාල් තිබෙනවා නම් පාන් කන්න මිනිසුන් කැමැති නැහැ. මේ ආණ්ඩුව වගා ව්‍යාපාරය ගැන කොයි තරම් කෑගැසුවත් දඹුල්ල පළාතේ හාල් සේරුවක මිළ කොළඹටත් නුවරටත් වඩා වැඩි බව දඹුල්ලේ මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා පෙන්වා දුන්නා. [බාධා කිරීම්] තුන් වේල බත් කා පුරුදු ගම්බද ජනතාව පාන් කන්න කැමැති නැහැ. වගා ව්‍යාපාරය තමුන්නාන්සේලා කියන තරමට දියුණු නම් ඒ ජනතාවට පාන් කන්න සලස්වා තිබෙන්නේ ඇයි? [බාධා කිරීම්] හාල් සේරුවක් ගන්නට ඒ පළාතේ මිනිසුන්ට පුළුවන් කමක් නැති නිසා ඒ අය පාන් කන බවයි ඒ ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්නේ. මා ඒ සම්බන්ධව කථා කරන්නේ එපමණයි.

අප ආණ්ඩු කරන කාලයේදී අයුතු විධියට රැකීරක්‍ෂා ප්‍රශ්නය විසඳීමට අප කටයුතු කළ බව ගරු අගමැතිතුමා කිව්වා. අප සතොසේ ගබඩාවල රක්‍ෂා දුන් අන්දම පෙන්නුම් කිරීමට එතුමා සතොස කොමිෂන් සභාවේ වාර්තාවෙන් කරුණු ඉදිරිපත් කළා. තමුන්නාන්සේලා ලංගමය අද පාලනය කරන්නේ මොන අන්දමකට දැයි මා ගරු අගමැතිතුමාගෙන් අහනවා. අප ආණ්ඩු බලයෙන් ඉවත් වී ලංගමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට බාර දෙන අවස්ථාවේදී ලක්ෂ 190 ක ලාභයක් ලංගමයෙන් ලැබුණා. එහෙත්, අද කොහොමද ? අද එය ගෙන යන්නේ පාඩු පිට නොවෙයිද ? "ලන්ඩන් ට්‍රාන්ස් පෝට්" එකේ සාමාන්‍ය වශයෙන් එක් බස් රථයකට යොදන සේවකයන් ගණන 7 යි. මා ජනසතු සේවා ඇමතිව සිටියදී බස් රථයකට 8 දෙනකු යෙදුවා. ක්‍රමානුකූලව සේවකයන් යෙදවීමේ වැඩ පිළිවෙලක් මා සකස් කළා. එහෙත්, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු මොකද වුණේ ? ඔස්කා ද ලිවේරා නම් අධ්‍යක්ෂවරයකු ලංගමයේ හිටියා. ඔහුට එහි වැඩ කරන්නට නොදී නොයෙක් අවුල් එතැන ඇති කළා. වුවමනා නැති තරමට ලංගමයට සේවකයන් බඳවා ගැනීම නිසා අද එහි අනවශ්‍ය වැඩිපුර සේවකයන් 14,000 ක් සිටිනවා. මේ 14,000 ක් දෙනා කවුද ? එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අපේක්ෂකයකුට හෝ එක්සත් ජාතික පක්ෂයට ගැතිකම් කරන කෙනකුට හෝ හැර වෙනත් කිසිම කෙනකුට අද ලංගමයේ රක්ෂාවක් ලබා ගන්නට බැහැ. [බාධා කිරීම්] මා එය බය නැතිව ප්‍රසිද්ධියේ කියනවා. ඒ තරම් අයුතු විධියට වැඩ කරන ගමන්, ගරු අගමැතිතුමා මෙතැනට ඇවිත් මහා ශාන්තුවරයකු වාගේ, හරිහැටි රාජකාරි කරනවා වාගේ කථා කරනවා. එක්සත් ජාතික පක්ෂයට ගැතිකම් කිරීම හැර වෙනත් කිසිම සුදුසුකමක් නැති අයට ඉතාම අයුතු විධියට අසාධාරණ විධියට රක්ෂා දීම නිසා, මුරිච්චියක් අල්ලන්න පවා නොදන්නා අය අද ලංගමයේ රක්ෂාව කරනවා. එවැනි අය ලංගමයේ 14,000 ක් සිටින බව කවුරුනුත් දන්නවා. කොලොන්නාවේ අතුරු මැතිවරණය කාලයේදී ඒ ප්‍රදේශයේ ඩිපෝවලට යවන ලද එක්සත් ජාතික පක්ෂයේ ගැත්තන් අද වැඩ නැතිව නිකම්ම පඩි ලබනවා. මේ විධියේ වැඩ නිසා අද ලංගමය පාඩු පිට පවත්වාගෙන යනවා.

එපමණක් නොවෙයි, මෙතැන ශාන්තුවරයන් වාගේ කථා කරන තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාගේ පක්ෂයේ පරාජිත අපේක්ෂකයන්ට නානාපතිකම් පවා දී තිබෙනවා. එහෙත්, අප සතොසේ ගබඩාවල අයුතු විධියට රක්ෂා දුන්නා යයි තමුන්නාන්සේලා අපට චෝදනා කරනවා. සතොසේ හිටපු සභාපතිතුමාට ද්විගම ආසනය සඳහා තරග කරන්නට ඉඩ දීමත් වැරදි යයි අගමැතිතුමා සමහර විට කියනවා ඇති. එහෙත්, තමුන්නාන්සේලා පරාජිත අපේක්ෂකයන්ට ඕනෑ තරම් රක්ෂා දී තිබෙනවා. තමුන්නාන්සේලා රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්නේ, එක්සත් ජාතික පක්ෂයට කත් ඇද්ද අය වෙනුවෙන් පමණයි. ඒ විධියට කටයුතු කරන ගමන්, ගරු අගමැතිතුමා හරිහැටි රාජකාරිය කරන කෙනකු වාගේ මැතිණියටත් අපටත් චෝදනා කරනවා. තමුන්නාන්සේට ඇසෙනවා ඇති රටේ කියනවා, අපේ කාලයේ කොයි විධියකින්වත් එක්සත් ජාතික පක්ෂයේය කියා රක්ෂා නොදී නොසිටි බව. අද මෙවැනි කණගාටුදායක තත්ත්වයක් උඩ ලංගමය පාඩුවට දුවනවා. මා ජනසතු සේවා ඇමති වශයෙන් සිටි කාලයේදී ජනසතු සේව යෙන් ලක්ෂ 190 ක ආදායමක් ඉපයූ බව තමුන්නාන්සේ දන්නවා ඇති. අප ඒ කාලයේ ලංගමයට සේවකයන් බඳවා ගන්නා විට ඒ ඒ කොට්ඨාශවලින් සාමාන්‍ය ගණනක් අරගෙන තෝරා ලොතරැයි ඇදීමෙනුයි රක්ෂා දුන්නෙ. ඒ විධියට සීමා සහිතව ක්‍රියා කිරීමෙනුයි එදා ලංගමය නඩත්තු කරගෙන ගියේ. එදා ලංගමයේ රක්ෂාව දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයට පමණක් නොවෙයි. සුදුසුකම් තිබුණ අයට රක්ෂාව දුන්නා. අද 39,000 ක් ඉන්නවා. [බාධා කිරීම්] අධ්‍යාපන ඇමතිතුමා සාන්තුවරයෙක් වාගේ කථා කළාට, ඒ අයගේ ව්‍යාපාරයත් අපි දන්නවා. කොයි විධියට රක්ෂා දෙනවාද කියා මේ රටේ ප්‍රසිද්ධයි. ඒ විධියට ප්‍රසිද්ධව තිබියදී "අපි දන් බොහෝම හොඳට වැඩ කරනවාය" කියා කියනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මම කිව්වෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

තමුන්නාන්සේ අදහස් කළේ ඒකයි. අපි වැරදි අන්දමට කළාය, දැන් තමුන්නාන්සේලා හොඳට කරනවාය කියන එකයි එයින් අදහස් කළේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

තමුන්නාන්සේලාට වඩා හොඳට අපි වැඩ කරන බවයි මා කිව්වෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

උන්නැහේ පෙන්නුවේ තමුන්නාන්සේලා කොපමණ හොඳට වැඩ කළාද කියන එකයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මෙන්න එක් ප්‍රවෘත්තියක්.

"කොට්ටාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූද, එක්සත් ජාතික පක්ෂයේ සම ලේකම් වරයෙකු වූද ඇම්. ඩී. එච්. ජයවර්ධන මහතා තම ඡන්දදායක යන් සිව් දෙනෙකු රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාවේ සුදුසු රක්ෂාවලට යවන ලෙස ඉල්ලා කම්කරු උප කොමසාරිස් වරයා වෙත යවන ලද ලිපියකි මේ."

මේ විධියේ ලිපි ගණනාවක් තිබෙනවා.

"මාගේ ආදරණීය බාලසිංහම් මහතාණනි,......"

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

What is the paper you are reading from ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

"ජනදින" පත්‍රයෙන්. [බාධාකිරීම්.] පත්‍රය කොයි එකක් වුණත් කමක් නැහැ. මේ ලියුම ඇත්තද නැත්තද කියා බලන එකයි තිබෙන්නෙ. එම ලිපියේ ඡායාරූප යක් මෙහි තිබෙනවා.

—දෙවන වර කියවීම

"මාගේ ආදරණීය බාලසිංහම් මහතාණනි,
මෙය රැගෙන එන ඇස්. ඒ. සමරදාස, ඇස්. ඒ. ඉන්ද්‍රසෝම, ඇස්. පියදාස සහ කේ. ඒ. විමලදාස යන අය මාගේ ඡන්දදායකයෝ වෙති. වැදගත් පවුල්වලට අයත් මොවුන් මනා චරිතවලින් යුතු අය බැවු මම ඉතා හොඳින් දනිමි. මොවුන් සුදුසු රක්ෂාවල් සඳහා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා වට යවන්නේ නම් මම කෘතඥ වෙමි.

ඔබගේ අවංක,
ඇම්. ඩී. එච්. ජයවර්ධන,
කොට්ටාව මන්ත්‍රී."

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඒක සහතිකයක්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ගන්නය කියා නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මේ ඇමතිවරුන් තමන්ගේ ඇමති බලය පාවිච්චි කර තමන්ගේ පන්දම් කාර යන්ට රක්ෂාව ලබා දෙනවා. ඒ විධියට කරුණු සිදු වෙද්දී කෘත නැතුව තමුන්නාන්සේ කියනවා, අප සිටින කාලෙ මේ මේ විධියේ වැඩ කර තිබෙනවාය කියා. අග මැතිවරයාම එසේ කීම කැතයි. වෙනත් කෙනෙක් කිව්ව නම් කමක් නැහැ. අග මැති කෙනෙක් ඒ විධියට ප්‍රකාශ කිරීම ලැජ්ජා සහගතයි. පිටු පස ආසනයක කෙනෙක් නම් කමක් නැහැ. තමුන්නාන්සේගේ ඇමතිවරුන් වැඩ කරන හැටි තමුන්නාන්සේ දන්නවාද? කම්කරු ඇමතිතුමා කර ඇති වැඩ ගැන සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කරන්නය කියා අපි දැන් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ජනසතු සේවා සහ ක්‍රීඩා ඇමතිතුමා ඒ කාලයේදී මොන තරම් මුදලක් නිවාස ණය දෙන්න තිබුණාද කියා අප දන්නවා. ඒ ණය ගෙව්වෙ කොහොමද? රුපියල් 90,000කට ගත් ඉඩමක් ලක්ෂ $7\frac{1}{2}$කට විකුණලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You must not make an allegation without a substantive Motion.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்஬ா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඇමතිවරුන් මෙසේ කරද්දී අගමැතිතුමා ලැජ්ජා නැතුව මේ විධියට කියනවා. තමුන්නාන්සේලා කොපමණ කිව්වත් අද රටේ මහජනතාව දන්නවා තමුන්නාන්සේලාගේ ඇමතිවරුන් කොයි විධියටද වැඩ කරන්නෙ කියා. අපි ආණ්ඩු කරන කාලයේ අපේ ඇමතිවරුන්ට විරුද්ධව නොයෙක් විධියේ චෝදනා තිබුණා. එක් ඇමතිවරයකුට ස්විස් බැංකුවේ ගිණුමක් තිබුණාය කිව්වා. ඒ චෝදනාව ඇත්තක් හැටියට ඇත්තෙන්ම පිළිගෙන එද චෝදනා කළා නම් ඇයි දැන් ඒ සම්බන්ධයෙන් විභාගයක් කරන්නෙ නැත්තෙ? දැන් ආණ්ඩු කරන්නේ එද ඒ චෝදනාව ඉදිරිපත් කළ උදවිය නේද? දැන් මේ ගරු සභාවේදී මහා ලොකුවට මවා පෙන්නුම් කරන්නට හදනවා. පිටුපස අසුනක ඉන්න සාමාන්‍ය මන්ත්‍රීවරයකු මෙවැනි දෙයක් කිව්වා නම් ඒත් කමක් නැහැ. අගමැතිවරයා වශයෙන් තමුන්නාන්සේගේ කැබිනට් මණ්ඩලයේ කෙරෙන වැඩ ගැන තමුන්නාන්සේ දන්නේ නැති එක ගැන කණගාටුයි. තමුන්නාන්සේ ඒවා හොඳාකාර දැනගන්නට ඕනැ. අපි නොකිව්වට තමුන්නාන්සෙම ඒවා දැනගන්නට ඕනැ.

ජනසතු සේවා ඇමතිතුමා සම්බන්ධයෙන් සොයා බලන්නට කොමිෂන් සභාවක් ඉල්ලුවා. තමුන්නාන්සේ කොමිටියක් පත් කර තිබෙනවා. ඔය විධියට, කැත විධියට වැඩ කරන ගමන් ගරු අගමැතිතුමනි, ඇයි තමුන්නාන්සේ ඔය විධියට කථා කරන්නේ? මම ඒ ප්‍රශ්නය අහන්නට කැමතියි. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා—අපේ අනාගත ඇමතිතුමා—ඒ විධියට කථා කළේ ගරු අගමැතිතුමාට පහරක් ගහන්නට නොවෙයි. දුප්පත් ජනතාව මොන තරම් බඩගින්නේ ඉන්නවාද, හාල් සේරුවක් ගන්නට බැරිව පාන් කකා ඉන්නවාද යන්න දන්න නිසයි එහෙම කිව්වෙ. තවත් කියන්න දේ තිබෙනවා. වේලාව නැති නිසා අනෙක් දවසේ කථා කරන්නම්.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය අප්‍රේල් 27 වන ඉරිදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது. விவாதம் 1969 ஏப்றில் 27, ஞாயிற்றுக்கிழமை மீள ஆரம்பமாகும்.*

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Sunday, 27th April 1969.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENT

### රජයේ (සිවිල් වරදෙහි ලා වගකීම) පනත් කෙටුම්පත
முடி (தீங்கியற் பொறுப்பு) மசோதா
CROWN (LIABILITY IN DELICT) BILL

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Mr. Speaker has nominated Mr. N. Wimalasena to serve on Standing Committee "B" for the consideration of the Crown (Liability in Delict) Bill [Senate], in place of Mr. V. N. Navaratnam, who has been discharged from the Committee at his request.

### පරමාණු බල අධිකාරී මණ්ඩල පනත් කෙටුම් පත
அணுசக்தி அதிகார சபை மசோதா
ATOMIC ENERGY AUTHORITY BILL

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Mr. Speaker has nominated Mr. M. M. Mustapha to serve on Standing Committee "B" for the consideration of the Atomic Energy Authority Bill, in place of Mr. V. N. Navaratnam, who has been discharged from the Committee at his request.

Mr. Speaker has also nominated Mr. R. P. Wijesiri as an additional Member to serve on Standing Committee "B" for the consideration of the Bill.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් **තැබිය යුතුය**".—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக" [கௌரவ ஜே. ஆர். ஜயவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினு எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.* "That the House do now adjourn".—[*The Hon. J. R. Jayewardene.*]

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.** (මුතූර් දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாவது அங்கத்தவர்)*

(Mr. A. L. Abdul Majeed—Second Mutur)

I request the Hon. Minister of Land, Irrigation and Power to reconsider his order for diverting Kantalai waters for the use of sugar cane cultivators at Agbapura as it has caused perturbation among the paddy cultivators in Thampalakamam, Kantalai, Kinniya, and the Kantalai Colonization Scheme. Therefore, in the interests of the paddy cultivators I request that water from the Kantalai Tank be given for paddy cultivation.

I understand that the water available in the Kantalai Tank is adequate to provide irrigation facilities to roundabout 6,000 acres of paddy.

There are 2,500 families in the Kantalai Scheme who will undergo severe hardship and be reduced to poverty if they are not allowed to do paddy cultivation.

If the water further decreases the Hon. Minister had decided to give compensation to Purana land owners and not to the colonists.

I therefore request that compensation be paid to the colonists also.

අ. භා. 7.2

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)

*(திரு. கே. பி. ரத்னயக்க—அனுராதபுரம்)*

(Mr. K. B. Ratnayake—Anuradhapura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විද්‍යාත්මක පර්යේෂණ කටයුතු හා නිවාස පිළිබඳ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට මම බලාපොරොත්තු වෙනවා. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ පාලනය සම්බන්ධයෙන් සිදු වන කරුණු ගැන ගරු ඇමතිතුමා දන්නවාදැයි මම දන්නේ නැහැ. එහි සේප්පුව මාස හතරක් ඇතුළත දෙවරක් කඩා තිබෙනවා. එක් වරක් දෙසැම්බර් මාසයේ 10 වනදා කැඩුවා. ඒ වාරයේ මුදලින් රුපියල් දෙදහකුත්, වවුචර රාශියකුත්, චෙක්රෝල් රාශියකුත් නැති වූ බව දැනගන්නට ලැබී තිබෙනවා. පොලිස් පරීක්ෂණත් පවත්වා අවසානයේදී රජයේ බඩු ගබඩාවෙන් අලුතින් සේප්පුවක් ගෙනැවිත් සවි කළා. ඊළඟ අවුරුද්දේ පෙබරවාරි මාසයේදීයි එය සවි කෙළේ. මාර්තු මාසයේ 23 වැනිදා නැවතත් එය කැඩුවා. රුපියල් තුන් දහසක් පමණ අරන් ගියාය කියනවා. ඒ සමගම වවුචර් සහ චෙක්රෝල් පමණක් නොව චෙක්පත් වගීයකුත් එතැනම දමා ගොස් තිබෙනවාය කියනවා. මේ කාරණය සම්බන්ධයෙන් ඉතාමත් කාර්යක්ෂම ලෙස කටයුතු කරන්නට ඕනෑ. මාස හතරක් ඇතුළත යම් ආයතනයක සේප්පුව දෙවතාවක්ම කඩන්නට ඉඩ තබනවා නම් එතැන පාලනය සම්බන්ධයෙන් මොකක් නමුත් වැරද්දක් තිබෙනවා වෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමා මේ ගැන දන්නවා ඇති. මෙය ඉතාමත් ඉක්මණින් ක්‍රියා කළ යුතු දෙයක් බව එතුමා පිළිගන්නවා ඇති. මෙය මණ්ඩලය ඇතුළේම කෙරෙන කටයුත්තක් බවට රාවයක් තිබෙනවා. එය කොයි තරම් දුරට සත්‍යදැයි කියන්නට මම දන්නේ නැහැ. මේ ගැන මහජනයා තුළ කුතුහලයක් තිබෙන බව කියන්නට ඕනෑ. මණ්ඩලය තුළ අයථා විධියේ පාලනයක් පවතින නිසා මෙවැනි දෙයක් කරන්නට ඇති බවට පිළිගැනීමක් ජනයා අතර පවතිනවා. අයථා විධියට මුදල් පාවිච්චි කර ඇති බවටත්, කොන්ත්‍රාත් වැඩ හරියාකාර නොකර වවුචර ඉදිරිපත් කර මුදල් ගෙවා ඇති බවටත්, වැඩ නොකරන අයගේ නම් චෙක්රෝල්වල ලියා මුදල් ගෙවා ඇති බවටත් රාවයක් තිබෙනවා. මේ ක්‍රමයට මාස්පතා විශාල මුදල් ප්‍රමාණයක් ගන්න ක්‍රමයක් තිබෙනවාය කියනවා. ගණන් පරීක්ෂකවරුන් වවුචර සහ චෙක්රෝල් පරීක්ෂා කළාම නියමි තත්ත්වය දැන ගනු ඇතැයි බියෙන් මේ විධියේ වැඩක් කරනවායයි රාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක් තිබෙනවා. ඒ නිසා ගරු ඇමති තුමා මේ ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වනවා නම් හොඳයි.

මේ සම්බන්ධයෙන් තවත් විශේෂ සිද්ධියක් ගැන සඳහන් කරන්නට තිබෙනවා. දෙවැනි වතාවට සේප්පුව කැඩීමෙන් පසු දවස් දෙකක් ගත වන විට අනුරාධපුරයේ පොලීසියේ හිටපු පොලිස් බල්ලන් දෙදෙනා මළා. පොලීසියේ සිටිද්දීයි ඔවුන් මළේ. ඒ නිසා මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය වහාම යොමු වනු ඇතැයිද, පුළුවන් තරම් ඉක්මනින් මේ ගැන ක්‍රියා කරනු ඇතැයිද බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.5

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னூட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය ගැන ගරු අගමැතිතුමාට දැනුම් දී තිබෙනවා. අප්‍රේල් 4 වන දින කිරිලපොනේදී ඇතිවුණු සිද්ධිය ගැනයි මා ප්‍රශ්න කරන්නේ. හයිලෙවල් පාරේ කිරිලපොනේදී 3 වන දින යම් සට්ටන යක්—

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

I am sorry to interrupt the hon. Member. Mr. Deputy Speaker, that matter is *sub judice*.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னூட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

It is not.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

It is.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னூட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

How ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

There is a case pending. The inquiry is going on, I believe.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னூட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

There was an inquiry and the report has been submitted to the Attorney-General, but there is no case that has been filed. A case may be filed. I am only touching on the circumstances of the matter.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

There was a magisterial inquiry.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னூட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

There was a magisterial inquiry and the results of that magisterial inquiry have been submitted to the Attorney-General, but there is no case before any court of law.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The matter is under investigation still.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னூட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

There is no case before any court of law. No further steps have been taken after the magisterial inquiry.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

But it is all part of the same thing.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னூட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

No steps have been taken. No prosecution has been entered against anybody.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Still the matter is under investigation.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

It may be under investigation but it is not the same thing as saying the matter is *sub judice*. *Sub judice* means that it is under consideration in a court of law. There is a pause in the judicial process. The judicial process started with the magisterial inquiry and terminated there. When a case is filed you start another judicial process. But in between there is no judicial process. No case has been filed.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

Of course, it is a continuation.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

It is not under judicial consideration. It is not the subject of an investigation by a court of law at the moment.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I think it is part of the same process.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

There may be certain aspects of it, and I am not going to refer to them. I am entitled to mention certain problems in connection with what happened.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Would it relate to the shooting and so on ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I am not going to blame anybody, and say so and so is to blame and so and so is not to blame, nor am I going to state any of the facts in regard to the matter.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Would it refer to the shooting ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

You will pull me up if I overstep that limit.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member may carry on, and we shall see.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මෙම සිද්ධිය සම්බන්ධයෙන් කථාකොට අසුවල් තැනැත්තා වරදක් කළා යැයි මෙතැනදී තීන්දුවකට බසින්නට මා උත්සාහ දරන්නේ නැහැ. කරුණු දෙකකට පමණක් මගේ ඉල්ලීම මා සීමා කරනවා. මෙම සිද්ධිය පිළිබඳව කතා කරන විට එක පැත්තකින් තුවාල ලත් ප්‍රදේශවාසීන් කීප දෙනෙක් සිටිනවා. තුවාල ලත් පොලිස් භටයන් ස්වල්ප දෙනෙක්ද සිටිනවා. තවද මරණයට පත් වුණ දුප්පත් ස්ත්‍රියක් සිටිනවා. එම නිවාස ක්‍රමයේ පදිංචිව සිටි දරුවන් නව දෙනකුගේ මවක් එදා මරණයට පත් වුණා. මෙම සිද්ධින් ගැන කිසිම විභාගයක් හෝ ඒවා යම් නඩු තීන්දුවකට භාජන කිරීමේ ප්‍රශ්නයක් අද මතු වී නැහැ. මහෙස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසුව, වෙඩි තැබීමකින් මැරුණාය කියා ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා, අටෝර්නි ජනරාල් මහතාට. එපමණයි. එම කරුණට පමණක් මගේ කතාව සීමා කරමින් යම් අදහස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙකක් ඉදිරිපත් කරන්නයි මා කල්පනා කරන්නේ. කුමන ආකාරයකට මෙතැන මෙම සිද්ධිය වුණාද, මෙම සිද්ධිය පැන නැගුණේ කෙසේද, වගකිය යුතු පොලිස් නිලධාරීන් මෙහිදී ක්‍රියා කළේ කුමන ආකාරයකටද යන කරුණු සොයා බැලිය යුතුයි. පොලීසිය ගැන කතා කිරීමේදී පොලිස් භට යන් ගැන නොවෙයි මා කියන්නේ. එතැන ඉහළ නිලධාරීන්, ඒ කියන්නේ වග කිව යුතු නිලධාරීන්, කටයුතු කළේ කෙසේද කියන එකයි අහන්නේ. එම ක්‍රියා මාර්ග නිසා ඇතිවුණු ප්‍රතිඵල කුමන ආකාරයකට සිදු වුණාදැයි සොයා බැලිය යුතුයි. ඒවා ගැන සොයා බැලීමට අපක්ෂපාත රාජ්‍ය කොමිෂන් සභාවක් පත් කරන ලෙස ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලනවා.

මගේ දෙවන ඉල්ලීම මෙයයි: මෙහිදී නිසි විධියට මහජනයාට සාක්ෂි දෙන්නට පුළුවන් වන පිළිවෙළට මෙම රාජ්‍ය කොමිෂන් සභාව කටයුතු කරන්නට ඕනෑ. ඒ සඳහා ඊට අවශ්‍ය බලතල දිය යුතුය යන කාරණය මා ඉදිරිපත් කරනවා. එසේම මරණයට පත් වුණු ඒ දුප්පත් අම්මාගේ දරුවන් සිටිනවා. ඒවාගේම ඇයගෙන් යැපෙන්නන් කීප දෙනෙක් ද සිටිනවා. ඒ උදවියට රජයෙන් නිසි විධියේ වන්දියක් දිය යුතුය කියන කාරණයත් මා ඉදිරිපත් කරනවා. තුවාල ලත් සියළු දෙනාටම ද වන්දි ගෙවීමට යුතුකමක් තිබෙනවා. එපමණයි.

අ. භා. 7.10

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කිරීමට කැමති ප්‍රශ්නයක් තිබෙනවා. බදුල්ලේ සමගි පෙරමුණෙන් මැයි දින උත්සවය —පෙළපාළියකුත් සමග—මැයි මස 2 වනදා පැවැත්වීමට අවසර ඉල්ලා තිබෙනවා. නමුත් ඊට අවසර දී නැහැ; තහනම් කර තිබෙනවා. ඊට පසු මා පොලිස්පතිවරයා හමු වී මේ ගැන පෞද්ගලිකව සාකච්ඡා කළා. ඉල්ලා තිබෙන්නේ මැයි මාසයේ 2 වනදා නිසා ඊට අවසර නොදෙන්නේ මන්දැයි ප්‍රශ්න කළාම පෙරහැරක් පැවැත්වෙන නිසා වීදියේ පෙළපාලියක් ගමන් කිරීමට ඉඩ දෙන්න බැරිය කියා කීවා. එසේ වුණත් රැස්වීම පැවැත්වීමට අවසර දෙන බව සඳහන් කළා. ඊට පසුව රජයේ නිලධාරීන්—සමහර විට ගරු අගමැතිතුමාගෙ අනුදැනුම ඇතුව වත් නට පුළුවනි— සාකච්ඡා කර තීන්දුවක් කර තිබෙනවා, මැයි මස 2වනදා රැස්වීම් පැවැත්වීමට ඉඩ දුන්නත් ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීමට බලපත්‍ර දෙන්නේ නැතැයි කියා. රැස්වීම තහනම් කර නැහැ; එය තහනම් කරන්න බැහැ. රැස්වීම පැවැත් වෙනවා, නමුත් රැස්වන මහජනතාවට කියන දේ අසා ගැනීමට ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරන්න ඉඩ දෙන්නෙ නැහැ. කිසිම සාධාරණ හේතුවක් නැතුව මේ අන්දමට තහනම් කර තිබීම බලවත් වරදක්. මැයි මාසයේ 1 වනදා වෙසක් දිනය නිසා ඉඩ නොදුන්නාට කමක් නැහැ. නමුත් මැයි මාසයේ 2 වන දා වෙසක් දිනය නොවෙයි. එහෙම නම් ඇයි ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීමට ඉඩ නොදෙන්නෙ? එය මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි කිරීමක්, උල්ලංඝනය කිරීමක් බව සඳහන් කළ යුතුව තිබෙනවා. එම නිසා මැයි මාසයේ 2 වනදාට පවත්වනු ලබන රැස්වීම්වලට, ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් තුන් වන වරටත් ඇසිය යුතු ප්‍රශ්නයක් තිබෙනවා. එනම්, 1968 ජනවාරි මාසයේදී පානදුරේ බාලිකා විද්‍යාලයට ඇතුළත් කළ යුතුව තිබුණු ශිෂ්‍යාවන් දෙදෙනකු ඇතුළත් කර ගැනීම විද්‍යාලයේ ප්‍රධානාචාර්යවරිය විසින් ප්‍රතික්ෂේප කිරීම ගැනයි. පසුව ඒ කාරණය සම්බන්ධයෙන් විභාගයක් පවත්වන විට එතුමිය කළුතර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට කියා තිබෙනවා, අධ්‍යාපන ඇමතිතුමා ඒ ළමයින් දෙන්නා ඇතුළත් කර ගන්න එපාය කියා නියම කර තිබෙන නිසා ඒ අන්දමට ක්‍රියා කළාය කියා. එවිට ඒ කාරණය ලියවිල්ලකින් ඉදිරිපත් කරන්නට යයි කීවාම විදුහල්පතිනිය ලියවිල්ලක් භාර දී තිබෙනවා, අධ්‍යාපන ඇමතිතුමා ඒ ළමයින් දෙන්නා ඇතුලු කර ගන්න එපා යයි නියම කර තිබෙන නිසා එසේ කළාය කියා. ඒ සම්බන්ධයෙන් විභාගයක් 1968 දෙසැම්බර් මස 19 වනදා පවත්වන්න නියමවී තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]
නමුත් එදින පැවැත්වූයේ නැහැ. දින නියමයක් නැතුව කල් දමා තිබෙනවා. මේ තත්ත්වය යටතේ සැකයක් ඇති වී තිබෙනවා, ඇත්ත වශයෙන්ම ඇමතිතුමා එහෙම නියෝගයක් කර තිබෙනවාද, විදුහල්පතිනිය කියන කාරණයෙහි ඇත්තක් තිබෙනවාද, යන්න ගැන. එහෙම නොවේ නම් විදුහල්පතිනියට විරුද්ධව තිබෙන විභාගය පවත්වන්නේ නැත්තේ මන්ද කියා ලොකු සැකයක් ඇති වී තිබෙනවා. මෙයට පිළිතුරක් මා ගරු ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. මා දැන ගන්න කැමතියි මෙම විභාගය දින නියමයක් නැතුව කල් දමන්නට ඇති හේතුව. අධ්‍යාපන ඇමතිතුමා අසු වන නිසා මේ විභාගය පවත්වන්නේ නැත යන විශ්වාසයක් පානදුර ප්‍රදේශවාසීන් තුළ තිබෙන බව මතක් කරන්න කැමතියි.

ඊළඟට ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් තවත් ප්‍රශ්නයක් ඇසීමට කැමතියි. 1968 නොවැම්බර මස 3 වනදාද, 1969 ජනවාරි මාසයේ 10 වනදාද ඇමතිතුමාගේ ස්ථිර ලේකම්තුමාට ලිපි දෙකක් යවා තිබෙනවා. නමුත් ඒ ලිපිවලට මේ වනතෙක් පිළිතුරක් ලැබී නැහැ. අවුරුදු 11 කට පෙර විශ්‍රාම ලැබූ ගුරුවරයකු වන වයි. ජී. කොස්තා මහත්මියට ලැබිය යුතු විශ්‍රාම වැටුප් මේ වනතෙක් ලැබී නැහැ. අඩු වශයෙන් ඒ සම්බන්ධයෙන් යැවූ ලිපිවලටවත් පිළිතුරක් එවූයේ නැත්තේ මන්දැයි දැනගන්න කැමතියි.

අ. භා. 7.15

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාට කල් දී තිබෙන ප්‍රශ්නයක් අසන්න මා බලාපොරොත්තු වෙනවා. නදුන්ගොමුවේ පී. ඊ. පෙරේරා මහත්මයා ගම්පහ ප්‍රදේශයේ සිටින එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකයෙක්. ඔහු පසුගිය මාස් කන්නයේ ගම්පහ ප්‍රදේශයේ ගොවි රාජා වශයෙන් තෝරා ගත් බව සැබෑද? මෙම තරගය සඳහා වගා කළ කුඹුරු ප්‍රමාණය කොපමණද? ඔහු තෝරා ගත්තේ කෙසේද? අක්කරයකට ඔහු ලබා ගත් අස්වැන්න ප්‍රමාණය කොපමණද? පී. ඊ. පෙරේරා මහත්මයා කුඹුරු වගා කරන ඉඩම් හිමියෙක්ද, එහෙම නැත්නම් තමන්ගේ ඉඩම් වගා කිරීම පිණිස කම්කරුවන් පාවිච්චි කරන පොහොසත් ඉඩම් හිමියෙක්ද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

The hon. Member has not given notice of the question.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Did the hon. Member for Gampaha give notice of this question ?

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Yes.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

When ?

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Earlier.

**ඒ. අමිර්තලිංගම් මයා.** (වඩ්ඩුක්කොඩෙයි)
*(திரு. அ. அமிர்தலிங்கம்—வட்டுக்கோட்டை)*
(Mr. A. Amirthalingam—Vaddukkoddai)

I do not know, Sir, in what order you are calling upon hon. Members to ask questions. At 2 o'clock I gave notice of a question I propose to ask.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I am going by a list given to me.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

If it is correct that the hon. Member for Gampaha did not give notice of the question he is now raising, you could not have called upon him to ask that question before calling upon me to ask the question notice of which I have already given.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please ! I am going by a list that has been supplied to me from the Office of the Leader of the House of Representatives. As to how that list is drawn up, I do not know. That has been the practice in this House.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

Then that is absolutely irregular. We give notice to the Clerk.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

This has been the practice that has been followed in the House for many months.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The information is given by the Clerk.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I suppose information is given to the Hon. Leader of the House and he gives notice to the Ministers concerned.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

The Clerk should decide on the order. Some of us are shut out, having waited for hours.

කල් තැබීම

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

It is nobody's fault : a number of hon. Members give notice.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

Then it should be in the order in which the notice is given.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Notice given to whom ?

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingom)

To the Clerk.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

At this rate the hon. Member who asks a question will not be able to get a reply.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

In future if I preside I propose asking the Minister concerned to reply immediately after a Member has raised a question, so that no Minister will miss the opportunity to give a reply.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්නයක් අසන්න තිබෙනවා. විනාඩියකට වැඩි වේලාවක් ඒ සඳහා ගන්නේ නැහැ. මෙයයි ප්‍රශ්නය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

මඩ්ඩුවිල් කෝවිලේ මෑතකදී ඇතිවූ සිදුවීම් අනුව, සමාජ විෂමතා පනත ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව නිත්‍යානුකූලව කිසිවක් කර ගැනීමට බැරි තත්ත්වයකට පැමිණ තිබෙන බැව් නීතිපති සහ පොලිස්පති ප්‍රකාශ කර ඇති නිසාත්, ඇත්ත වශයෙන්ම යාපනයේ පොලිසිය කෝවිලේ භාරකරුවන් වශයෙන් ක්‍රියා කරමින් අද මෙම පනත යටතේ යාපනය ප්‍රදේශයේ කෝවිල්වල ප්‍රතිගාමී රදළ හින්දුවරුන්ගේ අයිතිවාසිකම් පවත්වාගෙන යාමට ඔවුන්ව ආරක්ෂා කරන නිසාත්, මෙම ප්‍රදේශයේ කුල හීන යැයි කියන ජනතාවට කෝවිල්වලට ඇතුල්වීමේ අයිතිවාසිකම් සහ වෙනත් අයිතිවාසිකම් ලබා දීමට ආණ්ඩුව ගන්නා පියවර කුමන්දැයි ගරු අගමැතිතුමා මේ සභාවට පැහැදිලි කරනවාද ?

අනික් ප්‍රශ්නය නම්, 4. 4. 69 වැනි දින කිරුළපොන පොලිසිය මගින් දරු හත් දෙනෙකුගේ අහිංසක මවක් වන ජී. ඈම් ලීලාවතී නැමැත්තියට වෙඩි තැබූ බව ගරු අගමැතිතුමා දන්නවාද ? ඒ ගැන ගන්නා පියවර මොනවාද ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ලීලාවතී මහත්මිය සම්බන්ධ ප්‍රශ්නය ගැන මට දැනුම් දීමක් කර නැහැ.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ලොකු ප්‍රශ්නයක්. 20 වෙනිදා කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. එය ලැබුණේ නැත කියනවා. මේ කරුණු ගැන සොයා බලන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

We will discuss this matter with the Hon. Speaker and decide as to how notice should be given.

අ. භා. 7. 19

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

I wish to address a question to the Prime Minister with regard to the ban imposed by the Inspector-General of Police on all meetings except religious meetings on the 1st of May. I think it is a very unfortunate situation in this country that every issue is made the occasion for rousing racial and religious passions by certain sections of the press and certain individuals.

Throughout the world May Day is observed on the 1st of May, and we as a party that has been observing May Day for several years now, made all arrangements to hold a meeting in Jaffna on May 1st. Suddenly, at a conference summoned by the Additional Government Agent, Jaffna, we were told that the Inspector-General of Police has banned all political meetings on that day. I told the Additional Government Agent as well as the Assistant Superintendent of Police who happened to represent the Superintendent of Police at the conference, that the police have only the right to ban the use of loudspeakers, and processions. But if anybody wants to hold a meeting without a loudspeaker the police have no right to interfere. When I said that I did not mean any disrespect to any particular religion, because it does not arise as far as Jaffna is concerned. Whatever certain venerable Buddhist priests may say, meetings of every type have been held even on Vesak day. Unfortunately, the police have thought it fit to impose a total ban on this occasion.

We have the highest respect for the Buddhist religion, and Vesak is held in great esteem by Hindus as well. But that does not mean we cannot hold political meetings or May Day meetings whenever the holding of such meetings clash with Buddhist celebrations or Buddhist functions. I can understand it if the Superintendent of Police of the area is exercising his discretion and refusing permits for loudspeakers or processions. But in remote areas where there will

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

be no celebrations of any type whatsoever, I cannot understand why this total ban should have been imposed. This action of the Inspector-General of Police has given rise to unnecessary bitterness and a feeling in the minds of people of other religions that this country is fast becoming a theocratic State, that in this country one religion and the observances of that religion are being imposed on the people of other religions.

I do not think that that was the intention of the Inspector-General of Police, but what he had in mind could have been done in a peaceful way. Why should it have been done in this high-handed manner? Unfortunately, what we stated at the conference on that occasion has been distorted and twisted in various ways, and that has been made an occasion to create trouble by certain individuals who claim to speak on behalf of the Hindus. I wish to remind them that the party to which I belong represents and has the support of more Hindus than any other party in this country. Therefore, let not those self-appointed spokesmen for the Hindus think that they can speak on behalf of the Hindus. Hindus hold all their political, cultural or religious meetings on the full-moon day because that is the day when everybody is free to attend those meetings and there is full-moon light for the meetings to go on after dark. Therefore, when we decided to hold a meeting on this day we meant no disrespect to Buddhism, but, when the Inspector-General of Police intervened and sought to impose a ban, we felt, as people interested in upholding the freedom of assembly in this country, that we should defy the ban. But when it was sought to be made a religious issue we did not want to exacerbate feelings, we did not want to create bitterness, and, therefore, we decided, out of deference to religious sentiments, to call off the meeting which we had decided to hold.

I only want the Hon. Prime Minister to see that at least the I. G. P. does not repeat this sort of thing in the future.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Unfortunately I have only five minutes.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Prime Minister can go on a little longer if the House agrees.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

I shall take the points raised in the order in which they were raised.

The hon. Member for Colombo South (Mr. Bernard Soysa) raised the question of the shooting at Kirillapone. As I said, in regard to that matter a magisterial inquiry is going on and the matter will be considered by the Attorney-General before action is taken. The hon. Member will realize that in those circumstances I cannot appoint a commission to sit concurrently with the case. How on earth can I appoint a commission unless there is some finality to the judicial processes that have been initiated. Once those judicial processes are over one can certainly consider the matter.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

What about compensation for those injured and the dependants of the persons who died?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Those things must also await the findings.

Then the hon. Member for Gampaha raised the question of temple entry. All I wish to say is this. I am not aware that the Inspector-General of Police or the Attorney-General has stated that the Government is helpless in the implementation of the Social Disabilities Act in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

regard to the recent incidents at Madduvil Kovil. I do not know from where he gets the information.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(Mr. S. D. Bandaranayake)

It was reported in the press.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Lots of things are reported in the press. That is all I have to say about that.

The House will remember that the hon. Member for Gampaha raised the question of the implementation of the Social Disabilities Act in this honourable House on 15th August 1967. On that occasion I stated that the police have taken, and will continue to take, all action necessary to implement the Social Disabilities Act. A number of prosecutions have been entered against persons regarding whom complaints of obstruction or other offences under the Social Disabilities Act have been made. The position as regards Madduvil Kovil, I am informed, is that the temple authorities closed the inner courtyard of the temple to all persons without discrimination as between castes. This apparently was done because there was no agreement among the trustees as to whether all persons irrespective of caste should be allowed to enter the inner court yard of the temple. The temple is managed by a board of trustees under a scheme of management drafted by court in 1952. One clause in the scheme stipulates that there should be unanimity in all decisions of the temple trustees. Action has been filed by the managing trustee in D. C., Chavakachcheri, Case No. T. 431 seeking directions from court as to whether he could permit Harijans to enter the temple, as there was no unanimity among the 3 trustees over this issue. Inquiry is fixed for 6.5.69.

It will be seen, then, that the present situation is that the management of the temple has not discriminated against persons entering the temple on the ground of caste or for other reasons. All are prevented from entering it. The police are present at the temple premises to ensure that law and order is maintained and not for the purpose of protecting the management of the temple or any other person, as suggested.

Then, although the hon. Member for Panadura raised his question next, as it relates to the question raised by the hon. Member for Vaddukkoddai. I shall answer both together.

I am glad that the members of his party have decided not to proceed with the holding of a May Day meeting. The hon. Member in the course of his remarks stated that this sort of thing will lead to unnecessary communal bitterness. Might I say that a decision to hold a May Day meeting on Wesak day may also lead to unnecessary communal and religious bitterness. In fact, Wesak today is celebrated in most parts of Ceylon. It is a national day as far as this country is concerned, and quite rightly it was decided—I must say it was not a decision of mine but I support the Inspector-General of Police in the decision he has made—that there should be no May Day meeting. Unfortunately, May Day coincides with Wesak. This would not happen always. It is a rare occurrence. Because of that it was decided that there should be no May Day rallies on that day. Moreover, think of what the repercussions would have been.

That is why I say that I am glad hon. Members have decided not to proceed with the meeting. If we had held a meeting on your Vel Festival day what would have been your feelings ? What would be the position if this sort of thing is started in this country ? Quite apart from the freedom of assembly, there is also the regard for one another's religion.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I am sure hon. Members are one with me in that. Just as we should be prepared to respect a hallowed day for those professing the Hindu faith and not do anything that will cause bitterness between the Hindus and us, you must respect Wesak day which to the vast majority of the people of this country is a day of special significance. Of all the days in the whole year it is the most important day.

Moreover, we know that crowds come to various places, particularly the towns. At that time the police have to be deployed mainly in places like Colombo. If there are going to be clashes—I do not say there will be—arising as a result of a step like this, could the police ever cope with it ? Can they, on the one hand, cope with the vast crowds that come to Colombo and the other towns, and, on the other, keep order at a May Day meeting ?

Then, again, on the question that only a few in that region will be celebrating Wesak, the hon. Member must admit that there are a few Buddhists in the North and on that day they will be celebrating Wesak. If on that score you are allowed to hold a meeting, then all along the coastal Catholic belt the Catholics will want to have May Day meetings because very few will be celebrating Wesak on the coastal Catholic belt. If the I. G. P. says "yes" to you, then he must permit those on the coastal Catholic belt, almost up to Chilaw, to celebrate May Day. How are you going to disperse the Police Force with thousands collecting in Colombo ?

Surely, those are very cogent reasons why the Inspector-General of Police was prompted to take this action. I am very glad that hon. Members have decided not to pursue their original idea.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(Mr. S. D. Bandaranayake)

In 1955 you allowed it; did you not ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

What about my question ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

As we know, the day after Wesak day is the day on which the largest crowds collect—in fact, this year we have two holidays—and we cannot deploy the Police Force suitably.

Normally, as everybody knows, people take *sil* on the first day, and it is on the second day that the crowds are on the streets. So how can we deploy the Police Force to cover May Day meetings as well ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

You are not banning the meeting. You are only not allowing the use of loudspeakers.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

By not allowing the use of loudspeakers I am hoping you will do the next best thing, namely, not have the meeting.

අ. භා. 7.35

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) විසින් අසන ලද ප්‍රශ්නය මීට පෙරත් කීප වරක්ම අසන ලද්දක්. 1968 දෙසැම්බර් මාසයේදී විභාගයක් පවත්වන්නට නියම කර තිබුණු විත්තිය ඇත්තයි. යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු සම්බන්ධ වන විභාගයකදී ඊට වඩා උසස් නිලධාරියකු ඒ සඳහා යැවිය යුතුයි. කොටින්ම පළමුවැනි ශ්‍රේණියේ අධ්‍යක්ෂවරයකු යැවිය යුතුයි. මෙවැනි පරීක්ෂණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

හතක් අටක් තිබෙන කොට, එසේ යැවිය යුතු පුද්ගලයාත් එකම තැනැත්තකු වන විට සමහර විට නියම දවසට විභාග පවත්වන්නට බැරි වීමෙන් ඒවා කල් දමන්නට සිදු වෙනවා. ඔය කියන ලද විභාගය මැයි මාසයේ 20 වැනිදාට කල් දමා තිබෙනවා.

අනෙක් කාරණය 1957 දී සිදු වූවක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පවතිද්දී සිදු වූ ඒ වරද දැන් හරි ගස්සා තිබෙනවා. මහබෙල්ලන රජයේ බාලිකා විද්‍යාලයේ සේවයේ යෙදී සිටි වයි. ඊ. කොස්තා මෙනෙවිය 1957.4.1 දින සිට වෛද්‍ය හේතු උඩ විශ්‍රාම ගන්වා සිටියා. විශ්‍රාම ගැන්වීමෙන් පසුව යම්කිසි හේතුවක් නිසා ඇයට විශ්‍රාම වැටුප් දීමට කට යුතු කිරීම ඒ ආණ්ඩුවෙන් අතපසු වී තිබුණා. අනතුරුව දෙපාර්තමේන්තුව විමධ්‍යගත කරන අවස්ථාවේදී ලිපි ගොනු සියල්ල කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයට යොමු කර ඒ කාර්යාලයේදී කොස්තා මෙනෙවියට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ කටයුතු ආරම්භ කෙරුණා. එහෙත් සේවයට නුසුදුසු බව දන්වන වෛද්‍ය වාර්තා ආදි කිසිවක් ඒ අවස්ථාදී සොයා ගැනීමට ලැබුණේ නැහැ. කෙසේ වෙතත් ඇය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වන අවුරුදු 50 ඉක්මවා සිටි බව මට පෙනී ගිය හෙයින් ඒ අනුව ඇයට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු සලස්වන මෙන් දන්වා තිබෙනවා.

මේ සම්බන්ධයෙන් පානදුර ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාට යවන ලද ලිපියට පිළිතුරු අතපසු වීම ගැන කනගාටුයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ලියුම් දෙකක් යැව්වා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
පිළිතුරු ප්‍රමාද වීම ගැන කනගාටුයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ යකඩ සේප්පුව දෙවරක් කැඩීම ගැන අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) සඳහන් කරන්නට යෙදුණා. ඒ සම්බන්ධයෙන් තව දුරටත් විභාග කරන්නට පොලීසියට නියම කර තිබෙනවා. අනුරාධපුර පළාතේ ප්‍රසිද්ධ හොරුන් කට්ටියක් සිටින බව පෙනී යනවා.

**එකල්හි වේලාව අ. භා. 7.30 පසුකර තුබුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල්තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7. 38 ට අද දින සභාසම්මතිය අනුව, 1969 අප්‍රේල් 27 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அப்பொழுது நேரம் பி. ப. 7.30 மணிக்கு பிந்திவிட்டமையால் உப சபாநாயகர் அவர்கள் வினாவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி பி. ப. 7.38 மணிக்கு சபை அதனது இன்றைய தீர்மானத்திற் கிணங்க, 1969 ஏப்றில் 27, ஞாயிற்றுக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 7.30* P.M., MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly at 7.38* P.M. *until 2* P.M. *on Sunday, 27th April 1969, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org